සැ. යු. - 2022.11.11 දින පළ වූ අංක 2,306 ගැසට් පත්‍රයේ II සහ IV(අ) කොටස් පළ නොවීය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,307 - 2022 නොවැම්බර් මස 18 වැනි සිකුරාදා - 2022.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව
තනතුරු- ඇබෑර්තු	—
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—
බඩුබාහිරාදිය විකිණීම්	—
පළාත් පාලන නිවේදන	2654
අතුරු ව්‍යවස්ථා	—
පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ..	—
ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන	—
අයවැය ලේඛන	—
දේපළ විකිණීම්	—
විවිධ දැන්වීම්	2659

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 0 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 දෙසැම්බර් මස 09 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 නොවැම්බර් මස 25 වැනි දින දහවල් 12 0ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2653- B 82394 — 5,403 (2022/10)

පළාත් පාලන නිවේදන

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ගවමස්, එළුමස් වෙළඳසැල් පවත්වාගෙන යාම වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ ඒ ස්ථානයන් හි ගවමස්, එළුමස් වෙළඳාම් කරගෙන යාම සඳහා බලපත්‍ර ලබා ගැනීමට ඉදිරිපත් ව සිටින බව ගෝඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරිය 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමක් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් (දහතරක්) ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වමි.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් මෙහි උපලේඛනයේ සඳහන් ඉල්ලුම්කරුවන් වෙත අදාළ ව්‍යාපාර ස්ථානවල වෙළඳාම් කරගෙන යාම සඳහා 2023.01.01 සිට 2023.12.31 වැනි දින දක්වා බලපත්‍ර ලබා දීම කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 04 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම		*වෙළඳාම් කරන ස්ථානය*	*වෙළඳාමේ ස්වභාවය*
1.	කේ. එම්. තයියුබ් මයා	අංක 40/ඒ, උෑරාදෙණිය, ගුන්නෑපාන	ගවමස්
2.	එස්. එම්. රාසික් මයා	අංක 32, දොරගමුව පාර, උඩතලවින්න	ගවමස්
3.	එස්. එම්. ඉල්ලියාස් මයා	අංක 357, දොරගමුව පාර, උඩතලවින්න	ගවමස්
4.	ඒ. ඒ. එම්. මසාහිම් මයා	අංක 7 බී/1, පොල්ගොල්ල	ගවමස්
5.	එම්. එම්. රිෆාන් මයා	අංක 437, දොරගමුව පාර, ගලදෙනිය හන්දිය	ගවමස්
6.	අයි. එම්. යෙහිසාන් මයා	අංක 13/සී, නුවර පාර, මඩවල	එළුමස්
7.	අයි. එම්. යෙහිසාන් මයා	අංක 13/ඉ, නුවර පාර, මඩවල	ගවමස් ශීතාගාරය
8.	අයි. එම්. ජාබිර් මයා	අංක 22, සිරිමල්වත්ත පාර, මඩවල	ගවමස් ශීතාගාරය
9.	පාතදුම්බර ප්‍රාදේශීය සභාව, පොදු ගවමස් කඩේ	තෙල්දෙණිය පාර, මඩවල	ගවමස්

11-302/1

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරිය)

මෙහි පහත සඳහන් අය විසින් උපලේඛනයේ සඳහන් කර ඇති ස්ථානයේ 2023 වර්ෂයට ගෝ ඝාතකාගාරයක් හෝ එළු ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලමින් අයදුම්පත්‍ර මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හෝ ජීවත්වන අයෙක් හෝ අයවළුන් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් පදනම් කරගෙන ද යන්න පිළිබඳව විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (ඇ) කොටසේ පලවූ ද සිට දින 14ක් (දහතරක්) ඇතුළත මා වෙත දන්වා එවිය

යුතුය. මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනතේ 272 වැනි අධිකාරිය 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 04 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම		*ස්වභාවය*	*ගෝඝාතකාගාරය හා එළු ඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය*
1.	අයි. එම්. යෙහිසාන් මයා අංක 6/11, නුවර පාර. මඩවල කඩවීදිය	ගෝ ඝාතකාගාරය	අංක 6/11, නුවර පාර, මඩවල
2.	අයි. එම්. සෙහිසාන් මයා අංක 6/11, නුවර පාර. මඩවල කඩවීදිය	එළු ඝාතකාගාරය	අංක 6/11, නුවර පාර, මඩවල

11-302/12

මාතර මහා නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දක්වෙන සමාජශාලාව එහි සඳහන් ස්ථානයෙ හි පැවැත්වීම සඳහා 2023 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීම සඳහා මා වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනතේ (6) වැනි වගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලාව අසල හෝ එකී සමාජ ශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසල හෝ පදිංචි යම් තැනැත්තකු එම ක්‍රීඩා සමාජශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට සති 04 ක් ඇතුළත තමාගේ විරුද්ධත්වයට හේතු ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ජී. යසරත්න,
පුරපති.

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
මහා නගර සභාව,
මාතර.

උපලේඛනය

අයදුම්කරුගේ නම	*සමාජශාලාවේ ලේකම් සභාපති/කළමනාකරු*	*සමාජ ශාලාවේ නම*	*සමාජශාලාවේ කටයුතු කරගෙන යන ස්ථාන*
1. ලලිදු කාවින්ද ද සිල්වා	ලේකම්	නිල්මිණි ක්‍රීඩා සමාජය	අංක 66, අලුත් තංගල්ල පාර, කොටුවේගොඩ, මාතර

11-318

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ සැප්තැම්බර් මස 15 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 05.15 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2023 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් බද්ද සෑම කාර්තුවක් තුළදීම සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් පේමසිරි,
සභාපති,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 21 වැනි දින,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දිගදුර.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ බළන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල ගෙපත්වල වාර්ෂික වටිනාකමින් සියයට තුනක (3%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2023 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද බළන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත් එලෙස වාර්ෂික වරිපනම් බද්ද එම වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%)ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ III වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදළ වරිපනම් බදු මුදල බළන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) ක වට්ටමක් ද ලබා දීමට බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යොජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව *කාර්තුව*	*II වැනි තීරුව* *ගෙවිය යුතු දිනය*	*III වැනි තීරුව* *5% වට්ටම සඳහා හිමිකම්* *ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2023 මාර්තු 31 ට පෙර	2023 ජනවාරි 31 ට පෙර
දෙවන කාර්තුව	2023 ජූනි 30ට පෙර	2023 අප්‍රේල් 30 ට පෙර
තුන්වන කාර්තුව	2023 සැප්තැම්බර් 30ට පෙර	2023 ජූලි 31ට පෙර
හතරවන කාර්තුව	2023 දෙසැම්බර් 31 ට පෙර	2023 ඔක්තෝබර් 31 ට පෙර

11 - 317

ගාල්ල මහා නගර සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

ගාල්ල මහා නගර සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 17 දින පැවති මහා සභාවේ තීරණ අංක 06 (10) සහා සම්මුතිය අනුව පහත දැක්වෙන යෝජනා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. 2023 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් බදු මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ගාල්ල මහා නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

02. 2023 වර්ෂය සඳහාවන සම්පූර්ණ වරිපනම් බදු 2023 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර ගාල්ල මහා නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද එක් එක් කාර්තුවට අදාළ වරිපනම් බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට පෙර ගාල්ල මහා නගර සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

03. ඉහත සඳහන් කාල සීමාව තුළදී වරිපනම් බදු නොගෙවන අදාළ මුඩු ඉඩම් හා වාසස්ථාන වෙනුවෙන් සියයට පහළොවක (15%) වරෙන්තු ගාස්තුවක් ද, මුඩු ඉඩම් හා වාසස්ථාන නොවන අනෙකුත් දේපළ වෙනුවෙන් සියයට විස්ස (20%) ක වරෙන්තු ගාස්තුවක් ද අය කරනු ලැබේ.

ප්‍රියන්ත ජී. සහබන්දු,
නගරාධිපති.

2022 ඔක්තෝබර් මස 17 වැනි දින,
ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"252 වැනි අධිකාරිය වූ මහා නගර සභා ආඥාපනතේ 238 වැනි වගන්තිය(1) වැනි උපවගන්තියෙන් මහා නගර සභාව වෙත කරන ලද නියමය ප්‍රකාර, ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ හෝ ගෙවල්වල වාර්ෂික තක්සේරු වටිනාකම වශයෙන් 2022 වර්ෂය සඳහා පිළිගෙන තිබූ වාර්ෂික තක්සේරු වටිනාකම 2023 වර්ෂය සඳහා තක්සේරු වටිනාකම වශයෙන් පිළිගැනීමටත්,

එකී මහා නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ගාල්ල මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වාර්ෂික වටිනාකමින්,

(අ) නේවාසික ස්ථාන මත සියයට හත (7%) ක වරිපනම් බද්දක් ද සහ
(ආ) වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට දොළහ (12%) ක වරිපනමක් ද,
(ඇ) අනෙකුත් සියලුම රජයේ දේපළ හිස් ඉඩම් සඳහා සියයට විසිදෙක (22%) ක වරිපනම් බද්දක් ද 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ

ඒ වරිපනම් බදු එකී මහා නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30, හා දෙසැම්බර් මස 31 වැනි දින වලින් අවසන් වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් ගාල්ල මහා නගර සභාවට ගෙවීමට විධාන කිරීමටත් ගාල්ල මහා නගර සභාව යෝජනා කරන්නීය.

11-300

කොළොන්නාව නගර සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160(1) වන වගන්තියෙන් කොළොන්නාව නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කොළොන්නාව නගර සභාවේ 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී 2023 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම සඳහා පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සභාපති,
කොළොන්නාව නගර සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළොන්නාව නගර සභාවේ දී ය.

යෝජනාව

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160(1) වන උපවගන්තිය යටතේ කොළොන්නාව නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2023 වර්ෂය සඳහා තක්සේරුව සත්‍යෝක්ෂණය වර්ෂය සඳහා සම්මත කළයුතු බවටත් එකී තක්සේරුව මත 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160(1) උපවගන්තියෙන් මා වෙත පැවරී

ඇති බලතල ප්‍රකාරව සහා බල ප්‍රදේශ තුළ පිහිටි සියලුම ව්‍යාපාරික හා වාණිජමය ස්ථානවල දැනට තක්සේරු කර ඇති වාර්ෂික වටිනාකමින් 22% ක ප්‍රතිශතයක් හා අනෙකුත් සියලුම නිවාස හා තනාගෙන යන ගොඩනැගිලි, ඉඩම් හා කුඩා නිවාස පන්තිවලට වාර්ෂික වටිනාකමින් 8% ක ප්‍රතිශතයක් ද වරිපනම් බදු ලෙස පනවා අය කිරීමටත්,

තව ද, 2023 වර්ෂයේ පළමුවැනි, දෙවැනි, තෙවැනි සහ සිවුවැනි කාර්තුවල වරිපනම් බදු පිළිවෙලින් 2023 මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30, හා දෙසැම්බර් මස 31 යන දිනයන් හි හෝ ඊට පෙර අදාළ වන පරිදි ගෙවා අවසන් කළ යුතු බවත්,

තව ද, 2023 ජනවාරි මස 31 වන දින හෝ ඊට පෙර මුලු වර්ෂයටම වරිපනම් ගෙවනු ලැබුවහොත් එසේ වර්ෂයට ගෙවීමට ඇති මුදලින් 10% (දහයක) වට්ටමක් ද, එය කාර්තු වශයෙන් කාර්තුවේ පළමු මස ගෙවනු ලැබුවහොත් කාර්තුවට ගෙවීමට ඇති සම්පූර්ණ මුදලින් 5% (පහක) වට්ටමක් ද ලබා දීමට තීරණය කරමි.

11-291

මහව ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයෙ හි සවිස්තරාත්මකව දක්වා ඇති ස්ථානයන් හි සූකර ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා 2023 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම සඳහා මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් මා වෙත දන්වා එවිය යුතු බව, ගෝඝාතක අඥාපනතේ 272 වැනි අධිකාරයේ 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. එම්. විජිත අමුණුගම,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 20 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*ඉල්ලුම්කරුගේ නම*	*ඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය*	*බලපත්‍රය වලංගු කාල සීමාව*
01	ඩබ්. ඒ. ලලන්ත පුෂ්ප කුමාර	අංක 35, තලගල්ල, නාගොල්ලාගම	2023.01.01 සිට 2023.12.31 දක්වා

11-299

ගම්පහ මහා නගර සභාව

2023 වර්ෂයේ අයවැය ලේඛනය

252 අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 212 (ආ) වගන්තිය ප්‍රකාර ගම්පහ මහා නගර සභාවේ 2023 වර්ෂය සඳහා වැඩසටහන් අයවැය ලේඛනය 2022.11.18 දින සිට දින 07 ක් මහජන පරීක්ෂාව සඳහා මෙම කාර්යාලයේ තබා ඇති බව දැනුම් දෙමි.

එරංග සේනානායක,
නගරාධිපති,
මහා නගර සභාව - ගම්පහ.

11-425

ගාල්ල මහා නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලා සඳහා බලපත්‍ර දීමේ පනත යටතේ විරෝධතා කැඳවීම

පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන ලිපිනයේ දක්වා ඇති ස්ථානයෙහි සමාජ ශාලාවක් පවත්වාගෙන යාම සඳහා 2023 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලා බලපත්‍ර දීමේ පනතේ 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාවේ අසල හෝ පදිංචි යම් තැනැත්තෙකු එම සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට සති 04 ක් ඇතුළත තම විරුද්ධත්වයට හේතු පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලකින් මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

ප්‍රියන්ත ජී. සහබන්දු,
නගරාධිපති,
ගාල්ල මහා නගර සභාව.

2022 නොවැම්බර් මස 10 වැනි දින,
ගාල්ල මහා නගර සභාව.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම	*සමාජ ශාලාවේ ලේකම් සභාපති/කළමනාකරු ද යන වග*	*සමාජ ශාලාවේ නම*	*සමාජ ශාලාවේ පවත්නා ලිපිනය*
රවීන්ද්‍ර යසලාල් කලංසූරිය	ලේකම්	ගාලු සේවා සමාජය	අංක 02, රැම්පාට් වීදිය, කොටුව, ගාල්ල.

11-336

විවිධ දැන්වීම්

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් 2022 අගෝස්තු මස 12 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා යෝජනා අංක 05-X යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාළව අක්කර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට වියයුතු බවට තීරණය කර ඇති බව මහජනතාව වෙත නිවේදනය කරමි.

එල්. ආර්. රංජිත් විජේනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව- පොල්පිතිගම.

2022 අගෝස්තු මස 12 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2023 වර්ෂය සඳහා වූ සත්‍යෝක්ෂණය 2023 වර්ෂය සඳහා සත්‍යෝක්ෂණය ලෙස සම්මත කළ යුතු

බවටත්, එකී තක්සේරුව මත පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වන වගන්තියෙන් අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ -

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි සෑම ඉඩමක් වෙනුවෙන් ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2023 වර්ෂය සඳහා රුපියල් දහයක් (10) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්, සහ

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධිවිධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1989 මාර්තු මස 10 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හෙයින් හෙක්ටයාර එකකට වැඩි එහෙත් හෙක්ටයාර පහකට අඩු සෑම ඉඩමක් මත 2023 වර්ෂය සඳහා රුපියල් පනහ (50) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත්,

(ඇ) එකී අක්කර බද්ද 2023 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවිය යුතු බවට

ගරු මහා සභාව යෝජනා කරන්නීය.

11 - 297/1

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2023 වර්ෂය

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් 2022 අගෝස්තු මස 12 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා යෝජනා අංක 05-X යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට වියයුතු බවට තීරණය කර ඇති බව මහජනතාව වෙත නිවේදනය කරමි.

එල්. ආර්. රංජිත් විජේනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව- පොල්පිතිගම.

2022 අගෝස්තු මස 12 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2023 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක හෝ පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා පොල්පිතිගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2023 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානයේ හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්ය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2022 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුවක් ලෙස 2023 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මහ සභාව යෝජනා කරන්නීය..

උපලේඛනය අංක 1

I වැනි තීරුව	*II වැනි තීරුව*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 01 සිට රු. 750 දක්වා	*රු. 751 සිට රු. 1,500 දක්වා*	*රු. 1,500 ට වැඩි*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02. බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03. තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04. ආපන ශාලාවක් පවත්වාගෙන යාම (සංචාරක මණ්ඩලයේ අනුමත නොවූ)	500 0	750 0	1,000 0
05. බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06. මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07. හෝටලයක් පවත්වාගෙන යාම (සංචාරක මණ්ඩලයේ අනුමත නොවූ)	500 0	750 0	1,000 0
08. මස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09. ඝාතකාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10. උකස් ලියාපදිංචි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11. අයිස් කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. සිසිල් බීම කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. ලැගුම් නිවාසයක් සහ නවාතැන්පලක් පවත්වාගෙන යාම (සංචාරක මණ්ඩලයේ අනුමත නොවූ)	500 0	750 0	1,000 0
14. කිරි පට්ටියක් හා කිරි වෙළෙඳාම	500 0	750 0	1,000 0
15. ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
01. අප්‍රසන්න ව්‍යාපාර :			
01. මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
02. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම, විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
03. සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
04. සම් විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
05. සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
06. උම්බලකඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
07. රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබා ගැනීම	500 0	750 0	1,000 0
08. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
09. තොග වශයෙන් විකිණීම සඳහා නරක්වනසුළු කෑම වර්ග හෝ ආහාර වර්ග තබා ගැනීම	500 0	750 0	1,000 0
10. කරවල, ලුණු මාළු, ජාඩි කිලෝග්‍රෑම් 150කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
11. මාළු හෝ මස් ජාඩි දැමීම, වේළීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
12. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිෂ්පාදන	500 0	750 0	1,000 0
13. දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
14. සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
15. පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
16. සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
17. සබන් නිපදවීම	500 0	750 0	1,000 0
18. සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
19. ට්‍රන්ක් පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
20. අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
21. ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 01 සිට රු. 750 දක්වා	*රු. 751 සිට රු. 1,500 දක්වා*	*රු. 1,500 ට වැඩි*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
22. ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
23. වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
24. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
25. සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
26. රස කැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
27. පොල්ලෙලි පෙඟවීම (පල් කිරීම)	500 0	750 0	1,000 0
28. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
29. දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
30. රා එකතු කිරීම	500 0	750 0	1,000 0
31. විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
32. දැව ඉරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34. සෝඩා නිපදවීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35. කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
36. සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
37. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
38. කෝපි හා ධාන්‍ය වර්ග පිටි කිරීම	500 0	750 0	1,000 0
39. බේකින් පවුඩර් නිපදවීම	500 0	750 0	1,000 0
40. ගෑස් මැන්ටල් නිපදවීම	500 0	750 0	1,000 0
41. පොටි නිපදවීම	500 0	750 0	1,000 0
42. ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
43. කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
44. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
45. රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
46. ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
47. සුවඳ විලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
48. පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
49. ටයර් හෝ ටියුබ් නිපදවීම	500 0	750 0	1,000 0
50. ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
51. ටයර්, ටියුබ් වොල්කනයිසින් කිරීම	500 0	750 0	1,000 0
52. සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
53. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
54. වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
55. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
56. ගඩොල් පිළිස්සීම	500 0	750 0	1,000 0
57. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
58. අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත ඇසිරීම	500 0	750 0	1,000 0
59. උළු නිපදවීම	500 0	750 0	1,000 0
60. පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
61. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 01 සිට රු. 750 දක්වා	*රු. 751 සිට රු. 1,500 දක්වා*	*රු. 1,500 ට වැඩි*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
02. අන්තරදායක ව්‍යාපාර :			
01. කළුගල් කැණීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
02. එළවළු තෙල් නිපදවීම	500 0	750 0	1,000 0
03. පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
04. ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
05. මෙතිලේටඩ් ස්පිරිතු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
06. තේ පෙට්ටි නිපදවීම	500 0	750 0	1,000 0
07. කොහු හෝ වෙනත් කෙඳිවර්ග නිපදවීම	500 0	750 0	1,000 0
08. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
09. පිදුරු තබා ගැනීම	500 0	750 0	1,000 0
10. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
11. ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
12. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
13. හිරිගල් හෝ හුණුගල් කැණීම සඳහා	500 0	750 0	1,000 0
14. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
15. හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
16. පාපැදි හෝ යතුරුපැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
17. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
18. විසිරි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
19. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
20. ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ, නිපදවීම)	500 0	750 0	1,000 0
03. අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර :			
01. තලාතු මිනිරන් සුද්ධ කිරීම	500 0	750 0	1,000 0
02. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
03. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
04. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම	500 0	750 0	1,000 0
05. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
06. තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0
07. හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම	500 0	750 0	1,000 0
08. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම	500 0	750 0	1,000 0
09. මෝර තෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0
10. බෝට්ටු තැනීම	500 0	750 0	1,000 0
11. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 01 සිට රු. 750 දක්වා	*රු. 751 සිට රු. 1,500 දක්වා*	*රු. 1,500 ට වැඩි*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
12. ලෝහ වර්ග පැස්සීම	500 0	750 0	1,000 0
13. මෝටර් වාහන අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
14. මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
15. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
16. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17. බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18. මෝටර් වාහන බොඩි තැනීම	500 0	750 0	1,000 0
19. කෘමිනාශක, දිලීරනාශක, පැළෑටි නාශක හෝ පළිබෝධනාශක නිපදවීම හෝ නැවත පිරවීම	500 0	750 0	1,000 0
20. විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
21. මදුරු දඟර නිපදවීම	500 0	750 0	1,000 0

11 - 297/2

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් 2022 අගෝස්තු මස 12 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී සභා යෝජනා අංක 05-X යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මහජනතාව වෙත නිවේදනය කරමි.

එල්. ආර්. රංජිත් විජේනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව- පොල්පිතිගම.

2022 අගෝස්තු මස 12 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2023 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියෙන් පොල්පිතිගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, පොල්පිතිගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි 1 වගන්තියෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කාර්යයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක්, 2023 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තකු 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර මෙම බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ගරු මහා සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය අංක 1

1 වැනි තීරුව	*11 වැනි තීරුව*		
කර්මාන්තය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 01 සිට රු. 750 දක්වා	*රු. 751 සිට රු. 1,500 දක්වා*	*රු. 1,500 ට වැඩි*
	රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
01. පොල්ලෙලි කැබලි (කටර්) සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02. සිසිල් බීම නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03. අභ්‍යාස පොත් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04. ප්ලාස්ටික් වතුර ටැංකි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05. වතුර බෝතල් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06. විදුලි උපාංග නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07. උළු නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08. ගඩොල් කර්මාන්තය	500 0	750 0	1,000 0
09. සබන් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10. කොහු මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11. පාවහන් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. ඉටිපන්දම් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. කුකුල් ගොවිපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. ඌරු කොටුවක් පවත්වාගෙන යාම (4ට වැඩි ප්‍රමාණයක්)	500 0	750 0	1,000 0
15. ඌරු කොටුවක් පවත්වාගෙන යාම (4ට අඩු ප්‍රමාණයක්)	500 0	750 0	1,000 0
16. ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17. කෘෂි උපකරණ නිමැවුම්	500 0	750 0	1,000 0
18. මැටි ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. දේශීය අත්කම් භාණ්ඩ නිෂ්පාදන	500 0	750 0	1,000 0
20. බෑග් නිෂ්පාදන	500 0	750 0	1,000 0
21. මදුරුදැල් නිෂ්පාදන	500 0	750 0	1,000 0
22. ගම් බෝතල්	500 0	750 0	1,000 0
23. ලුණු පැකට් කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24. සුදු කොප්පරා නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

11 - 297/3

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් 2022 අගෝස්තු මස 12 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී සභා යෝජනා අංක 05-X යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කර ඇති බව මහජනතාව වෙත නිවේදනය කරමි.

එල්. ආර්. රංජිත් විජේනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව- පොල්පිතිගම.

2022 අගෝස්තු මස 12 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2023 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (1) වැනි උපවගන්තියෙන් පොල්පිතිගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන් ම එම ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ආදායම් මෙහි පහත උපලේඛනයෙහි I වගන්තියෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක්, 2023 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී ව්‍යාපාර බද්දට යටත් තැනැත්තකු 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර මෙම බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ගරු මහ සභාව යෝජනා කරන්නී ය.

උපලේඛන අංක 01

	I වැනි තීරුව	*II වැනි තීරුව*
	2022 වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම	*ගෙවිය යුතු බද්ද රු. ශත*
01.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
02.	රු. 6,000 සිට රු. 12,000 දක්වා	90 0
03.	රු. 12,000 සිට රු. 18,700 දක්වා	180 0
04.	රු. 18,700 සිට රු. 75,000 දක්වා	360 0
05.	රු. 75,000 සිට රු. 1,50,000 දක්වා	1,200 0
06.	රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

11 - 297/4

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් 2022 අගෝස්තු මස 12 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී සභා යෝජනා අංක 05-X යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය සභාව පහත දැක්වෙන යෝජනාව 2023 වර්ෂයට අදාළව නියම කිරීම පහත සඳහන් ආකාරයට වියයුතු බවට තීරණය කර ඇති බව මහජනතාව වෙත නිවේදනය කරමි.

ඒ අනුව පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙම බද්දට යටත් වන සෑම තැනැත්තෙකු විසින් ම, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන, දින 30ක් සම්පූර්ණ වූ වහාම 2023 වර්ෂය සඳහා වන මෙම බද්ද, පොල්පිතිගම ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරමි.

එල්. ආර්. රංජිත් විජේනායක,
සභාපති,
පොල්පිතිගම ප්‍රාදේශීය සභාව.

2022 අගෝස්තු මස 12 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2023 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ 04 වන උපලේඛනයේ විධිවිධාන යටතේ, පොල්පිතිගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා

සෑම තැනැත්තෙකුගෙන් ම එහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයන් අනුව වූ වාර්ෂික බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට ගරු මහ සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

		I වැනි තීරුව	*II වැනි තීරුව* රු. ශත
01.	(i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, ට්‍රයිසිකලයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක්, ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
	(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
		* වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
		* වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
02.	(iii)	සෑම කරත්තයක් සඳහා ම	20 0
	(iv)	සෑම අත්කරත්තයක් සඳහා ම	10 0
	(v)	සෑම රික්ෂෝවක් සඳහා ම	7 50
	(vi)	සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවෙකු සඳහා	15 0
	(vii)	සෑම ඇතෙකු හෝ අලියකු සඳහා ම	50 0
	(viii)	සෑම සුනඛයකු සඳහා	5 0

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් 2022 අගෝස්තු මස 12 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී සභා යෝජනා අංක 05-X යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාළව සංචාරක වෙළඳාම සම්බන්ධ ගාස්තු පහත සඳහන් ලෙස ගෙවිය යුතු බව නියම කිරීමට තීරණය කර ඇති බවට මහජනතාව වෙත නිවේදනය කරමි.

එල්. ආර්. රංජිත් විජේනායක,
සභාපති,
පොල්පිතිගම ප්‍රාදේශීය සභාව.

2022 අගෝස්තු මස 12 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2023 වර්ෂය සඳහා සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව

"වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරන ලද 2011.01.18 දින වයඹ පළාත් සභා රැස්වීමේ දී ස්ථිර කරන ලද බවට 2011.04.28 දිනැති අංක 1703/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටස මගින් ප්‍රකාශයට පත් කර ඇති සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව පොල්පිතිගම ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියාත්මක කළ යුතු බවට 2010.09.28 වැනි දින පැවැති මහ සභාව විසින් පිළිගෙන අංක 1714 හා 2011.07.08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ නිවේදනය කර ඇති අතර, එම අතුරු ව්‍යවස්ථාව 2023 වර්ෂයට පනවා අය කළ යුතු බවටත් ගරු මහ සභාව යෝජනා කරන්නී ය.

උපලේඛන අංක *I*

අනු. අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
			රු. 01 සිට රු. 750 දක්වා	*රු. 751 සිට රු. 1,500 දක්වා*	*රු. 1,500ට වැඩි*
			රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	තැඹිලි, කුරුම්බා වෙළඳාම		500 0	750 0	1,000 0
02.	කඩල, වඩේ, මුරුක්කු, බයිට් පැකට් කිරීම		500 0	750 0	1,000 0
03.	විදුලි උපකරණ අලෙවිය		500 0	750 0	1,000 0
04.	බීම් මල් අලෙවිය		500 0	750 0	1,000 0
05.	රෙදි අලෙවිය		500 0	750 0	1,000 0
06.	පාවහන් වෙළඳාම		500 0	750 0	1,000 0
07.	සාප්පු බඩු අලෙවිය		500 0	750 0	1,000 0
08.	මල් පැළ, එළවළු පැළ හා පළතුරු පැළ අලෙවිය		500 0	750 0	1,000 0
09.	පොත්, පත්තර වෙළඳාම		500 0	750 0	1,000 0
10.	ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම		500 0	750 0	1,000 0
11.	ධාන්‍ය වර්ග පැකට් කර විකිණීම		500 0	750 0	1,000 0
12.	එළවළු හා පළතුරු වෙළඳාම		500 0	750 0	1,000 0
13.	කෘතීම මල් අලෙවිය		500 0	750 0	1,000 0
14.	ජංගම බැංකු සේවා		500 0	750 0	1,000 0
15.	පහන් තිර, හඳුන්කුරු ඇතුළු පූජා භාණ්ඩ අලෙවිය		500 0	750 0	1,000 0
16.	ලොතරැයි අලෙවිය		500 0	750 0	1,000 0
17.	ඔරලෝසු වෙළඳාම		500 0	750 0	1,000 0
18.	බේකරි නිෂ්පාදන අලෙවිය		500 0	750 0	1,000 0
19.	මිරිදිය මාළු වෙළඳාම		500 0	750 0	1,000 0
20.	කරදිය මාළු වෙළඳාම		500 0	750 0	1,000 0

11-297/6

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව - 2023

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් 2022 අගෝස්තු මස 12 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී සභා යෝජනා අංක 05-X යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම් ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට වියයුතු බවට තීරණය කර ඇති බව මහජනතාව වෙත නිවේදනය කරමි.

ඒ අනුව පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා පොල්පිතිගම ප්‍රාදේශීය සභාවෙන් අවසර පත්‍රයක් ලබාගත යුතු බවත්, ඒ සඳහා මෙම සභාව විසින් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් අයකරනු ලබන බවත් මහජනතාව වෙත වැඩිදුරටත් නිවේදනය කරමි.

එල්. ආර්. රංජිත් විජේනායක,
සභාපති,
පොල්පිතිගම ප්‍රාදේශීය සභාව.

2022 අගෝස්තු මස 12 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 22(4) හා 122 - 126 වැනි වගන්තිවලින් පොල්පිතිගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් 2023.01.01 වැනි දින සිට නැවත සංශෝධනය කරන තුරු පනවා අයකළ යුතු යැයි ගරු මහ සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

විස්තරය		*අයකරන ගාස්තුව රු. ශත*
01. බිත්තියක හෝ තාප්පයක, පුවරුවක, ලෑල්ලක හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා. (සෑම වසරකම ගෙවිය යුතුය)	වර්ග අඩියකට	60 0
02. එක් මසකට වැඩි මාස 03කට අඩු කාල සීමාවක් සඳහා ප්‍රදර්ශනය කෙරෙන බැනරයක් සඳහා	වර්ග අඩියකට	30 0
03. මාස 01ක් හෝ ඊට අඩු කාලයක් සඳහා ප්‍රදර්ශනය කෙරෙන බැනරයක් සඳහා	වර්ග අඩියකට	20 0
04. කටවුට් සඳහා මාස 03කට වැඩි කාල සීමාවකට	වර්ග අඩියකට	40 0
05. කටවුට් සඳහා මාස 03කට අඩු කාල සීමාවකට	වර්ග අඩියකට	30 0
06. සභාව තුළ පොල්පිතිගම නගරයේ ඇති භූමිය :		
තාවකාලික වෙළඳ කුටි, එළිමහන් ප්‍රදර්ශන පැවැත්වීම ජංගම අලෙවි ප්‍රවර්ධන රථ සඳහා කුළියට දීම. (එක් දිනක් සඳහා)	වර්ග අඩියකට	50 0

11 - 297/7

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

සේවා ගාස්තු අයකිරීම - 2023 වර්ෂය

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් 2022 අගෝස්තු මස 12 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී සභා යෝජනා අංක 05-X යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාළව සේවා ගාස්තු පහත සඳහන් ලෙස ගෙවිය යුතු බව නියම කිරීමට තීරණය කර ඇති බව මහජනතාව වෙත නිවේදනය කරමි.

එල්. ආර්. රංජිත් විජේනායක,
සභාපති,
පොල්පිතිගම ප්‍රාදේශීය සභාව.

2022 අගෝස්තු මස 12 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

සේවා ගාස්තු අයකිරීම – 2023 වර්ෂය

1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර බලපත්‍ර ගාස්තුව හා ප්‍රාදේශීය සභා පනතේ 49 වගන්තිය ප්‍රකාරව නොපවරා ගැනීමේ පරීක්ෂණ ගාස්තු ද, නිවාස හා නගර සංවර්ධන ආඥාපනත අනුව හා ගෘහ හා නගර නිර්මාණ ආඥාපනත යටතේ පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2023 වර්ෂයට පනවා අයකළ යුතු බව ගරු මහ සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

විස්තරය	*අයකරන ගාස්තුව* *රු. ශත*
01. පරිසර ඉල්ලුම්පත්‍ර ගාස්තුව	250 0
02. පරීක්ෂණ ගාස්තුව	වටිනාකම අනුව
03. බලපත්‍රය අලුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	200 0
04. පරිසර බලපත්‍ර ගාස්තුව	1,250 0
05. සියලුම නව ගොඩනැගිලි ඉදිකිරීමේ පෙරසැරි ගාස්තු (වර්ග අඩි ප්‍රමාණය අනුව)	

වර්ග ප්‍රමාණය	*නිවාස* *රු. ශත*	*ව්‍යාපාර* *රු. ශත*
වර්ග අඩි 2,000 දක්වා	500 0	750 0
වර්ග අඩි 2,000ට වැඩිවන සෑම වර්ග අඩි 100ක් සඳහාම	100 0	200 0

06. අළුතින් ඉදි කරන තාප්ප සඳහා වර්ග අඩියකට	2 0
07. වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික පත්‍ර ගාස්තුව	600 0
08. ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව	500 0
09. ගොඩනැගිලි අයදුම්පත් පරීක්ෂා කිරීමේ ගාස්තුව	500 0
10. ගොඩනැගිලි ඉල්ලුම්පත්‍රවල වලංගු කාලය දීර්ඝ කිරීම (උපරිම වසර 03 දක්වා)	

කාලය	*නේවාසික* *රු. ශත*	*ව්‍යාපාර* *රු. ශත*
1 වසර	100 0	100 0
2 වසර	100 0	200 0
3 වසර	100 0	300 0

11. සහා බල ප්‍රදේශයේ අනවසර ඉදි කිරීම සඳහා දඩ මුදල් අය කිරීම :

I. තාප්ප සඳහා - වර්ග අඩියකට පෙරසැරි ගාස්තුව මෙන් දෙගුණයක්,

II. නගර සීමාව තුළ අනවසරයෙන් ඉදි කරන ලද ගොඩනැගිලි සඳහා ආවරණ අනුමැතිය දීමට ගාස්තු අය කිරීම :

විස්තරය *(වර්ග මීටරයක් සඳහා)*	*නේවාසික* *රු. ශත*	*ව්‍යාපාර* *රු. ශත*
(i) අත්තිවාරම සම්පූර්ණ කර ඇති විට	25 0	25 0
(ii) වහල මට්ටම දක්වා	40 0	50 0
(iii වහලය ඇති නිවාස ඉදිකොට ඇති විට	60 0	100 0
(iv) සම්පූර්ණයෙන් වැඩ නිම කොට ඇති විට	100 0	150 0

12. අනුකූලතා සහතික නිකුත් කිරීම :
(සහා බල ප්‍රදේශය තුළ අළුතින් ඉදිකරන ලද ගොඩනැගිලි සඳහා)

	රු. ශත
නේවාසික	500 0
ව්‍යාපාර	750 0

13. ඉඩම් කට්ටි සැලැස්ම හෝ අනුබෙදුම අනුමත කිරීමේ ගාස්තු අයකිරීම :

ප්‍රමාණය	*සංවර්ධන සැලැස්ම* *රු. ශත*	*අනු බෙදුම්* *රු. ශත*	*සේවා ගාස්තු* *රු. ශත*
හෙක්ටයාර් 01ට අඩු	250 0	250 0	එක් කාර්යයක් සඳහා 750 0 බැගින්
හෙක්ටයාර් 01 - 02	350 0	350 0	එම
හෙක්ටයාර් 02 - 04	500 0	500 0	එම
හෙක්ටයාර් 04ට වැඩි	750 0	750 0	එම

14. සභා බල ප්‍රදේශයේ අනුමැතියට පෙර ඉදිකරන ලද සම්ප්‍රේෂණ කුළුණු සඳහා (කුළුනේ ධාරිතාව (කියුබික් මීටර් 8 x 200) යන පදනම්න් දඩ මුදල් අයකරනු ලැබේ.

		රු. ශත
I.	පුස්තකාල සාමාජික ගාස්තු - වැඩිහිටි	100 0
	- ළමා	50 0
II.	පුස්තකාල අයදුම්පත්‍ර ගාස්තු	25 0
III.	පිඹුරුපත් අනුමත කිරීමේ ගාස්තු	500 0
IV.	ටෙන්ඩර් පෝරම ගාස්තු	3,000 0
V.	ටෙන්ඩර් දඩ	10%
VI.	මාර්ග නඩත්තු ගාස්තු	1,000 0
VII.	නළ ළිං ගාස්තු	1,000 0
VIII.	පුටු 01ක් සඳහා (ප්ලාස්ටික්) දිනකට	50 0
IX.	පුස්තකාල ශ්‍රවනාගාරය දිනකට	5,000 0
X.	පොල්පිතිගම ප්‍රාදේශීය සභා ක්‍රීඩා පිටිය කුළියට දීම	
	i. සංගීත ප්‍රසංග හා සැණකෙළි සඳහා දිනකට	15,000 0
	වැඩිවන දිනකට	5,000 0
	ii. මහජන රැස්වීම් පැවැත්වීම සඳහා දිනකට	12,000 0
	වැඩිවන දිනකට	3,000 0
	iii. වෙළඳ ප්‍රදර්ශන සඳහා	
	වාහන, විවිධ උපකරණ හා උපාංග දිනකට	10,000 0
	වැඩිවන දිනකට	3,000 0
	පැළ වර්ග, අත්කම් භාණ්ඩ, පොත්පත් හා විවිධ නිෂ්පාදන දිනකට	6,000 0
	වැඩිවන දිනකට	2,000 0
	iv. ක්‍රීඩා උත්සව හා තරග සඳහා දිනකට	5,000 0
	වැඩිවන දිනකට	1,000 0
XI.	ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා පිටි කුළියට ලබා දීම	5,000 0
	වැඩිවන දිනකට	1,000 0
XII.	කොඩි කණු කුළියට දීම	50 0
XIII.	VIP හට් 01ක් දිනකට	350 0
XIV.	සතිපොළවල් කුළියට දීම දිනකට	20,000 0

16. වාහන හා යන්ත්‍ර සූත්‍ර කුළියට ලබාදීම :

විස්තරය	*රු. ශත*
බැකෝ ලෝඩරය	7,600 0
මෝටර් ග්‍රේඩරය	9,300 0
ට්‍රැක්ටරය සමග තණකොළ කපන යන්ත්‍රය	3,600 0
මාර්ග තලනය	5,300 0
3000L ට්‍රැක්ටර් ජල බවුසර 01ක් (ජලය සහිත)	2,800 0
3000L ට්‍රැක්ටර් ජල බවුසරය (ජලය රහිත)	16,600 0
ටිපර් රථය කියුබ් 2.5	19,500 0
6000L ලොරි බවුසර් 01 ක් (ජලය සහිත)	13,500 0
6000L ලොරි බවුසරය (ජලය රහිත)	22,700 0
ට්‍රැක්ටරය සමග ටේලරය	16,800 0
කොන්ක්‍රීට් මිශ්‍රණය	7,800 0
17. පිරිපහදු ජල ලීටර් 01ක්	04 0
18. කොම්පෝස්ට් පොහොර කි. ග්‍රෑ. 01ක්	15 0

11 - 297/8

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

විනෝද බදු ආඥාපනතේ දෙවැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිනමා ශාලාවලින් පරිබාහිරව පෙන්වනු ලබන සෑම චිත්‍රපට දර්ශනයක්, මැජික් සංදර්ශනයක්, සර්කස් සංදර්ශනයක්, ආධාර චිත්‍රපටි දර්ශනයක්, සෑම සංගීත සංදර්ශනයක් හා වෙනත් සංදර්ශනයක් සඳහා අලෙවි කරනු ලබන සෑම ප්‍රවේශ පත්‍රයකින්ම ප්‍රවේශ පත්‍රයේ වටිනාකමින් 10%ක විනෝද බද්දක් අයකිරීම.

එල්. ආර්. රංජිත් විජේනායක,
සභාපති,
පොල්පිතිගම ප්‍රාදේශීය සභාව.

2022 අගෝස්තු මස 12 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11 - 297/9

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කුළී රථ අවසර පත්‍ර ගාස්තු අය කිරීම

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති අංක 1711 දරන 2011.06.17 දිනැති කුළී රථ වාහන නවතා තැබීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව අනුව කුළී ගමන් සඳහා රථ වාහන නතර කර තැබීම, පාලනය කිරීම, පරිපාලනය කිරීම හා විධිමත් කිරීමේ අරමුණ ඇතිව පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ *ගැසට් පත්‍රයේ* සඳහන් ත්‍රිරෝද රථ නවතා තබන ලියාපදිංචි සියලුම ත්‍රිරෝද රථවලින් අය කරන වාර්ෂික අවසර පත්‍ර ගාස්තු පහත සඳහන් පරිදි පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් සංශෝධනය කර පනවා අයකළ යුතු බව ගරු මහ සභාව යෝජනා කරන්නී ය.

ත්‍රිරෝද රථ නවතා තබන ස්ථානය	ගාස්තුව රු. ශත
01. සියඹලංගමුව මහ වැව	1,200 0
02. සියඹලංගමුව දුම්රියපල අසල	1,200 0
03. තලාව හංදිය	1,200 0
04. තරණගොල්ලාගම හංදිය	1,200 0
05. කිරලබොක්කාගම හංදිය	1,200 0
06. මොරගොල්ලාගම නගරය	1,200 0
07. නිකවැව රෝහල අසල	1,200 0
08. හේරත්ගම හංදිය	1,200 0
09. සාලියගම හංදිය	1,200 0
10. මී ඔය හංදිය	1,200 0
11. මඩගල්ල හංදිය	1,200 0
12. අමුණකොලේ හාතිගම හංදිය	1,200 0
13. කුඹුකුලාව හංදිය	1,200 0
14. කුඩා වැව හංදිය	1,200 0
15. මහජන බැංකුව ඉදිරිපිට හංදිය	1,200 0
16. පලුගහකන්ද පාර හංදිය	1,200 0
17. ජයන්ති කඩේ හංදිය	1,200 0
18. තම්බුව හංදිය 2	1,200 0
19. තම්බුව හංදිය 1	1,200 0
20. රඹේ හංදිය	1,200 0
21. බන්ට් හංදිය	1,200 0
22. ගල්කරුහේන හංදිය	1,200 0
23. එගොඩගම හංදිය	1,200 0
24. වීරගොල්ල හංදිය	1,200 0
25. වලේකඩේ හංදිය	1,200 0
26. ගල්ටැංවැව හංදිය	1,200 0
27. පෙතියාගල පන්සල් හංදිය	1,200 0
28. කොඩිගල පන්සල් හංදිය	1,200 0
29. පොල්පිතිගම රෝහල අසල	1,200 0
30. පොල්පිතිගම ප්‍රාදේශීය සභා හංදිය	1,200 0
31. හාතිගමුව බෝගහ හංදිය	1,200 0
32. දීගම හංදිය	1,200 0
33. පහේ කණුව හංදිය	1,200 0
34. ශීලවංශ මාවත-බෝගහ හංදිය	1,200 0
35. කළුගල්ල හංදිය	1,200 0
36. කෝරුවාව හංදිය	1,200 0
37. කට්ටම්බේරිය හංදිය	1,200 0
38. පන්සියගම හංදිය	1,200 0
39. අළුදෙණිය හංදිය	1,200 0
40. මඩහපොල හංදිය	1,200 0
41. අකුරව හංදිය	1,200 0
42. ගොවිජන සේවා හංදිය මඩහපොල	1,200 0
43. අලිපල්ලම හංදිය	1,200 0
44. මල් හංදිය	1,200 0
45. දංගොල්ලාගම හංදිය	1,200 0
46. රණමුක්ගම දුම්රියපළ අසළ	1,200 0

එල්. ආර්. රංජිත් විජේනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
පොල්පිතිගම.

2022 අගෝස්තු මස 12 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11 - 297/10

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කසළ බදු පැනවීම

පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත ආකාරයට කසළ බදු අයකිරීමට 2022.08.12 වැනි දින 05-X යෝජනාව යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

එල්. ආර්. රංජිත් විජේනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
පොල්පිතිගම.

2022 අගෝස්තු මස 12 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2023 වර්ෂය සඳහා කසළ බදු පැනවීම

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තියේ පළවෙනි උපවගන්තියේ (අ) නිවේදනය යටතේ තීරණය විය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 02 වැනි වගන්තියේ 01 වන උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාට ඇති බලතල ප්‍රකාරව වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලදුව 2015.09.25 වැනි දින අංක 1933/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *(අති විශෙෂ) ගැසට් පත්‍රයේ* පළ කරන ලද ප්‍රාදේශීය සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක වන බැවින්, පහත සඳහන් ගාස්තු අයකළ යුතු බවට ගරු මහා සභාව යෝජනා කරන්නීය.

		රු. ශත
01.	කසළ සන අඩි 01 ක්	16 0
02.	කසළ කරත්තයක ප්‍රමාණය (6.0 x 4.0)	300 0
03.	කසළ ට්‍රැක්ටර් රථයක ප්‍රමාණය (සන අඩි 75)	1,200 0
04.	කර්මාන්ත ශාලාවලින් වෙන්කරන ලද කසළ සඳහා	4,500 0 (මාසිකව)

11 - 297/11

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සතිපොළ ගාස්තු අයකිරීම

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් 2022 අගෝස්තු මස 12 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී සභා යෝජනා අංක 05 - X යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාළව සතිපොළ ගාස්තු පහත සඳහන් ලෙස ගෙවිය යුතු බවට තීරණය කර ඇති බව මහජනතාව වෙත නිවේදනය කරමි.

එල්. ආර්. රංජිත් විජේනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, පොල්පිතිගම.

2022 අගෝස්තු මස 12 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

අනු. අංකය	*විස්තරය*	*සතිපොළ*	*2023 වර්ෂයට අය කරන මුදල රු. ශත*
1	ස්ථිර කඩ කාමරයකට (6 x 8)	පොල්පිතිගම, ගල්ටැංවැව, රඹේ	300 0
		කිරලබොක්කාගම, පොල්ගහන්ගොඩ, සාලියගම	200 0
2	එළිමහන් වෙළෙඳාම	පොල්පිතිගම, ගල්ටැංවැව, රඹේ	250 0
		කිරලබොක්කාගම, පොල්ගහන්ගොඩ, සාලියගම	150 0

අනු. අංකය	*විස්තරය*	*සතිපොළ*	*2023 වර්ෂයට අය කරන මුදල රු. ශත*
3	මනිබඩු, ප්ලාස්ටික් බඩු, විසිතුරු මල්පැළ, රෙදි වර්ග, වැව් මාළු, මුහුදු මාළු	පොල්පිතිගම, ගල්ටැංවැව, රඹේ	250 0
		කිරලබොක්කාගම, පොල්ගහන්ගොඩ, සාලියගම	150 0
4	වාහනවල තබාගෙන වෙළෙඳාම	පොල්පිතිගම, ගල්ටැංවැව, රඹේ	250 0
		කිරලබොක්කාගම, පොල්ගහන්ගොඩ, සාලියගම	150 0
5	තොග වෙළෙඳාම	පොල්පිතිගම, ගල්ටැංවැව, රඹේ, කිරලබොක්කාගම, පොල්ගහන්ගොඩ, සාලියගම	5%

11 - 297/12

මාතර මහා නගර සභාව

2023 වර්ෂය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල්, ආපනශාලා, නවාතැන්පොළ සඳහා බලපත්‍ර ලබාගැනීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරය යටතේ මහා නගර සභා ආඥාපනත මගින් පැවරී ඇති බලතල අනුව, මහා නගර සභා ආඥාපනතේ 247 අ වගන්තිය යටතේ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර හෝ එම මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ හෝටලයක් ආපනශාලාවක් හෝ නවාතැන් පොළක් සඳහා බලපත්‍රයක් ලබාගැනීමේ දී ලබාගන්නා වර්ෂයට පෙර වර්ෂයේ ආදායමෙන් 1% ක බලපත්‍ර ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අයකිරීමට 2022.09.08 වැනි දින පැවති මහා සභාව විසින් තීරණ අංක 2022/මාමනස/සභා යෝජනා/423 ඉ.5. යටතේ ඒකමතිකව සම්මත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එම බලපත්‍ර 2023 මාර්තු 31 ට පෙර අදාළ ව්‍යාපාරය විසින් ලබාගත යුතු බවත් මෙයින් දන්වා සිටිමි.

ඩී. ජී. යසරත්න,
නගරාධිපති,
මහා නගර සභාව - මාතර.

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
මාතර මහා නගර සභාවේ දී ය.

11 -346/1

මාතර මහා නගර සභාව

2023 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍රයක් නිකුත් කිරීමේ දී අයකරන ගාස්තු පැනවීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරය යටතේ මහා නගර සභා ආඥාපනත මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව, මහා නගර සභා ආඥාපනතේ 247 අ වගන්තිය යටතේ හා 2004.02.10 වැනි දින හා 2008.09.09 වැනි දිනයන් හි දී පැවති මහා සභාව විසින් වැළඳගත් 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ 1989.01.20 දිනැති අංක 541/17 දරන *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශිත සම්මත අතුරු ව්‍යවස්ථා මගින් බලපත්‍රයක් ලබාගත යුතු පහත උපලේඛනයේ I වන තීරයේ සඳහන් ස්ථානයන්, පරිශ්‍රයන් ව්‍යාපාරයන් සම්බන්ධයෙන් එහි ඉදිරියෙන් ඇති දෙවන තීරයේ සඳහන් අනුප්‍රමාණයන්ගෙන් යුත් බලපත්‍ර ගාස්තුවක් බලපත්‍ර ලබා දීමේ දී 2023 වර්ෂය සඳහා පනවා

අයකිරීමට 2022.09.08 දින පැවති මහා සභාව විසින් තීරණ අංක 2022/මාමනස/සභා යෝජනා/424 ඉ.06. යටතේ ඒකමතිකව සම්මත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එම බලපත්‍ර පහත සඳහන් ව්‍යාපාර විසින් 2023 ජනවාරි මස 31 ට පෙර ලබාගත යුතු බවත් මෙයින් දන්වා සිටිමි.

ඩී. ජී. යසරත්න,
නගරාධිපති,
මහා නගර සභාව - මාතර.

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
මාතර මහා නගර සභාවේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*I තීරය*	*II තීරය*	
			නියමිත වාර්ෂික බලපත්‍ර ගාස්තු	
		ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500 නොඉක්මවන විට	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 2,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ඌරන් ආදී සතුන් ඇති කිරීම	950 0	1,200 0	2,000 0
02.	මාළු විකිණීම	1,000 0	2,000 0	3,000 0
03.	මස් විකිණීම	2,000 0	3,000 0	5,000 0
04.	කොණ්ඩා සකසන්නන්ගේ සහ බාබර්වරුන්ගේ සාප්පු සහ සැළුන්හල්	700 0	900 0	2,000 0
05.	ලොන්ඩරියක් පැවැත්වීම	500 0	800 0	1,000 0
06.	ලැගුම් නිවාස	2,000 0	3,000 0	5,000 0
07.	හෝටල්	2,000 0	3,000 0	5,000 0
08.	බත් කඩයක් පැවැත්වීම	900 0	1,700 0	2,500 0
09.	ආපනශාලාවක් පැවැත්වීම	2,000 0	3,000 0	5,000 0
10.	තේ හා කෝපි කඩ	700 0	1,200 0	2,000 0
11.	කිරි පට්ටි පැවැත්වීම හා කිරි විකිණීම	700 0	1,200 0	2,000 0
12.	බේකරියක් පැවැත්වීම හා බේකරි කෑම විකිණීම	1,000 0	2,000 0	3,000 0
13.	අවමංගල්‍ය ශාලා සහ අවමංගල්‍ය භාරව කටයුතු කිරීම	2,000 0	3,000 0	5,000 0
14.	අයිස් කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	2,000 0	3,000 0	5,000 0
15.	එළවළු සහ පලතුරු විකිණීම	700 0	950 0	1,500 0
16.	මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 147 වන වගන්තියේ කාර්ය සඳහා පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.			
01.	පොහොර නිෂ්පාදනය	2,000 0	3,000 0	5,000 0
02.	පොහොර ගබඩාකර තැබීම	2,000 0	3,000 0	5,000 0
03.	හම් ගබඩාකර තැබීම	2,000 0	3,000 0	5,000 0
04.	උම්බලකඩ හොණ්ඩර 05 කට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	2,000 0	3,000 0	5,000 0
05.	කුකුළු ගොවිපළක් පවත්වාගෙන යාම	1,000 0	2,000 0	3,000 0
06.	කළු ගල් කැඩීම සහ කබොක් කැපීම	2,000 0	3,000 0	5,000 0
07.	බොරළු හැරීම	2,000 0	3,000 0	5,000 0
08.	ගවයන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	700 0	1,200 0	1,500 0
09.	සත්ව සායනයක් පවත්වාගෙන යාම	1,200 0	2,250 0	3,250 0
10.	රබර් සකස් කිරීම	700 0	1,200 0	1,700 0
11.	පොහොර හෝ හුණු දමා තිබුණු ගෝනි ගබඩා කිරීම	1,250 0	2,250 0	3,250 0

අනු. අංකය	I තීරය ව්‍යාපාරයේ ස්වභාවය	II තීරය නියමිත වාර්ෂික බලපත්‍ර ගාස්තු ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500 නොඉක්මවන විට රු. ශත	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට රු.ශත	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 2,500 ඉක්මවන විට රු. ශත
12.	බැටළුවන් හෝ එළුවන් හෝ එම දෙවර්ගය ම හෝ 10 දෙනකුට වඩා ගාල්කොට තැබීම සඳහා වූ මඩුවක් හෝ ගාලක් තබා ගැනීම	700 0	1,700 0	2,200 0
13.	උළු, කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම	2,000 0	3,000 0	4,000 0
14.	හුණු ගබඩාකොට තැබීම	700 0	1,700 0	2,200 0
15.	බොම්බයි ඒෑණු හොණ්ඩර 5 කට වඩා ගබඩාකර තැබීම	700 0	1,700 0	2,200 0
16.	අර්තාපල් හොණ්ඩර 5 කට වඩා ගබඩාකර තැබීම	700 0	1,700 0	2,200 0
17.	පොල්කටු අඟුරු හොණ්ඩර 1 කට වඩා ගබඩාකර තැබීම	500 0	750 0	1,000 0
18.	කුරුඳු, කරදමුංගු, හෝ කෙඳි ගෙන්දගම් දුම්ගස්සා සකස් කිරීම	700 0	950 0	1,200 0
19.	පරණ ලෝහ ගබඩා කර තැබීම	1,250 0	2,250 0	3,250 0
20.	සිමෙන්ති හොණ්ඩර 25 කට වඩා ගබඩාකර තැබීම	1,500 0	2,500 0	3,500 0
21.	කරවල හොණ්ඩර 10 කට වඩා ගබඩාකර තැබීම	950 0	1,200 0	1,700 0
22.	රබර් ඔට්ටපාලු සුන්බුන් ඇඹරීම හෝ චේලීම	700 0	1,200 0	1,700 0
23.	මරා සකස් කළ කුකුළු ආදී සතුන් විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යාම	1,500 0	2,500 0	4,000 0
24.	ගම් වර්ග නිෂ්පාදනය	950 0	1,200 0	1,700 0
25.	විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම	700 0	1,700 0	2,200 0
26.	බැටරි පුරවනු ලබන්නාවූ හෝ බැටරි ගබඩාකොට තබනු ලබන්නාවූ ආයතනයක් පවත්වාගෙන යාම	700 0	1,250 0	2,500 0
27.	ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නා වූ හෝ කට්ට කැපීම කරනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම	700 0	1,200 0	2,000 0
එක් තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් පහත පරිදි ප්‍රතිශත යටතේ වරිපනම් බද්දක් පනවා අය කළ යුතු බවට යෝජනා කරමි.

	ස්ථානය			*2023 වර්ෂයේ දී අය කිරීමට යෝජිත ප්‍රතිශතය (වාර්ෂික වටිනාකමින්)*
01.	පන්විල නගරය	I.	වත්තේගම පාර	7%
		II.	උඩුගොඩ පාර	7%
		III.	මඩුල්කැලේ පාර	7%
		IV.	ආවාස පාර	7%
		V.	පුරන්කුඹුර පාර	7%
02.	මඩුල්කැලේ නගරය	I.	කබරගල පාර	7%
03.	හුළුගඟ නගරය	I.	පන්විල පාර	7%
		II.	අලකොළ පාර	7%
		III.	බඹරැල්ල පාර	7%
04.	රෝටු කඩේ නගරය	I.	පන්විල කබරගල පාර	5%
		II.	මඩුල්කැලේ කබරගල පාර	5%
05.	තවලන්තැන්න නගරය	I.	හුළුගඟ බඹරැල්ල පාර	5%
06.	පන්විල - නගරයේ ආවාස පාරේ වරිපනම් අංක 22 දරන සද්ධර්මාරාම විහාරයේ සිට පෙන්ගුවින් ඇඟලුම් කර්මාන්ත ශාලාව දක්වා මාර්ගයේ මධ්‍යයේ සිට එක් පැත්තකට මීටර් 100 බැගින් දෙපස සීමාව			7%
07.	පන්විල පෙන්ගුවින් ඇඟලුම් කර්මාන්තයේ අසළ හන්දියේ සිට අප්පල්ලාබැද්ද මාර්ගයේ මීටර් 150ක් දුරට මාර්ගයේ මධ්‍යයේ සිට දෙපසට මීටර් 100 බැගින් වූ දෙපස සීමාව			7%
08.	පන්විල පොලීසිය අසලින් උඩුගොඩට යන පාරේ පිහිටි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය දක්වා මාර්ගයේ මධ්‍යයේ සිට දෙපසට මීටර් 100 බැගින් වූ දෙපස සීමාව			7%
09.	පන්විල - මඩුල්කැලේ ප්‍රධාන මාර්ගයේ සිට පුරන්කුඹුර පාරේ පුරන්කුඹුරගම හන්දිය දක්වා මාර්ගයේ මධ්‍යයේ සිට එක් පසකට මීටර් 100 බැගින් වූ දෙපස සීමාව			7%

	ස්ථානය	*2023 වර්ෂයේ දී අය කිරීමට යෝජිත ප්‍රතිශතය (වාර්ෂික වටිනාකමින්)*
10.	පන්විල ප්‍රධාන මාර්ගයේ සිට රාජසිංහ විදුහලේ මාවත - අංගම්මන දෙහිමඩිත්ත හන්දිය දක්වා එම මාර්ගයේ මධ්‍යයේ සිට එක් පසකට මීටර් 100 බැගින් මාර්ගයේ දෙපස සීමාව	7%
11.	මඩුල්කැලේ නගරයේ සිට මඩුල්කැලේ අත්කම් නිවාස මාර්ගයේ මඩුල්කැලේ රාජ්‍ය වතුයාය ඉහළ කොටස දක්වා එම මාර්ගයේ මධ්‍යයේ සිට දෙපසට මීටර් 100 බැගින් වූ මාර්ගයේ දෙපස සීමාව	7%
12.	මඩුල්කැලේ කබරගල මාර්ගයේ වරිපනම් අංක 144/1 හා වරිපනම් අංක 61 දරන දේපළවල සිට එම මාර්ගයේ 3/12 බෝක්කුව දක්වා මාර්ගයේ මධ්‍යයේ සිට දෙපසට මීටර් 100 බැගින් වූ මාර්ගයේ දෙපස සීමාව	7%
13.	පන්විල - කබරගල මාර්ගයේ මහපතන විදුහල් හන්දියේ සිට රෝටු කඩේ කඩ වීදිය අවසාන 6/11 බෝක්කුව දක්වා මාර්ගයේ මධ්‍යයේ සිට එක් පසකට මීටර් 100 බැගින් වූ දෙපස දුර සීමාව	5%
14.	හුළුගඟ - බඹරැල්ල මාර්ගයේ වරිපනම් අංක 80 සහ 81 දරන දේපළවල සිට එම මාර්ගයේ කොස්ගම ඇතුළුව පුවක්අත්ඔය දක්වා මාර්ගයේ මධ්‍යයේ සිට එක් පසකට මීටර් 100 බැගින් වූ දෙපස සීමාව	5%
15.	හුළුගඟ - බඹරැල්ල මාර්ගයේ තවලන්තැන්න අංක 47/1 දරන නිවස (සරත් ප්‍රනාන්දු මයා) සිට මැල්කඩය ඇතුළුව කි. මී. 31බී/205 දරන බෝක්කුව දක්වා මාර්ගයේ මධ්‍යයේ සිට මීටර් 100 බැගින් වූ මාර්ගයේ දෙපස සීමාව	5%

11-296/7

පන්විල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කසළ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් පන්විල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛන I හි දක්වෙන ප්‍රදේශවල පවත්වාගෙන යනු ලබන පහත උපලේඛන II හි සඳහන්වන පරිදි ව්‍යාපාරික කර්මාන්ත ආයතන පරිශ්‍රයන්ගෙන් 2023 වර්ෂයට අදාළ කසළ ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් වූ යෝජනාව 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 21 වැනි දින පවත්වන ලද පන්විල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක (ඉ) 01.lll.viii යටතේ පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. ජී. සෙනවිරත්න,
සභාපති,
පන්විල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 21 වැනි දින,
පන්විල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා ආනුශාංගික විධිවිධාන පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාවේ) පනතේ 2 වැනි

වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත්, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2013.06.28 වැනි දින අංක 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳව අතුරු ව්‍යවස්ථා 2016.03.04 වැනි දින අංක 1951 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ 3-173 යටතේ පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදුව එම *ගැසට් නිවේදනය* අනුව උපලේඛනයේ සඳහන් ආකාරයට 2023.01.01 වැනි දින සිට 2023.12.31 වැනි දින දක්වා කාල සීමාව සඳහා කසළ ගාස්තු අයකිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛන I හි දැක්වෙන ප්‍රදේශවල පවත්වාගෙන යනු ලබන පහත උපලේඛන II හි සඳහන් වන පරිදි ව්‍යාපාරික කර්මාන්ත ආයතන පරිශ්‍රයන්ගෙන් ගාස්තු අයකිරීමටත් නිවාස පරිශ්‍රයන් සඳහා ගාස්තු අය කිරීමෙන් නිදහස් කිරීමටත් යෝජනා කරමි.

උපලේඛන I

01. පන්විල වත්තේගම ප්‍රධාන මාර්ගයේ පිටවලට හැරෙන හන්දියේ සිට පන්විල නගරයේ ඔරලෝසු කණුව අසල දක්වා ප්‍රධාන මාර්ගය දෙපස සීමාව

02. පන්විල වත්තේගම ප්‍රධාන මාර්ගයෙන් රාජසිංහ විද්‍යාලයට හැරෙන හන්දියේ සිට ගල්වල පාර ආරම්භය දක්වා

03. පන්විල නගරයේ ඔරලෝසු කණුව අසල සිට ගාලකඩ හන්දිය දක්වා ප්‍රධාන මාර්ගය දෙපස සීමාව

04. පන්විල නගරයේ ඔරලෝසු කණුව අසල සිට ආවාස පාරේ ඇඟළුම් කර්මාන්ත ශාලාව දක්වා වූ මාර්ගය දෙපස සීමාව

05. හුළුගඟ සිට බඹරැල්ල මාර්ගයේ තවලන්තැන්න දක්වා ප්‍රධාන මාර්ගය දෙපස සීමාවේ (හුළුගඟ නගරය මැල්කඩේ නගරය හා සභාව වෙත කසළ ලබාදෙන පරිශ්‍රයන් ගෙන් පමණක්)

06. හුළුගඟ නගරයේ අලකොලය පාර, වරිපනම් අංක 01 හා 02 ස්ථානවල සිට අලකොලය රාජ්‍ය වතුයායට පිවිසුම් මාර්ගයේ අලකොලය වත්ත කොන්ක්‍රීට් නාමපුවරුව දක්වා මාර්ගය දෙපස සීමාව

07. මඩුල්කැලේ පහල කොටසේ විනාශ වූ තේ කර්මාන්තයට හැරෙන හන්දියේ සිට ප්‍රධාන මාර්ගයේ අක්බාර් අලි මහතාගේ වෙළඳසැල දක්වා සීමාව

08. මහපතන විද්‍යාලය හන්දියේ සිට මාඋස්සාව ඩී. පී. දුනුවිල මහතාගේ ඉඩමේ අවසානය තෙක් ප්‍රධාන මාර්ගය දෙපස සීමාව

උපලේඛන II

අනු. අංකය	*ව්‍යාපාර ස්වභාවය/ආයතන වර්ගය*		*අයකළ යුතු මාසික ගාස්තුව රු. ශත*	*අයකළ යුතු වාර්ෂික ගාස්තු රු. ශත*
01.	සාප්පු සහ කාර්යාලය		100 0	1,200 0
02.	තේ කඩ, ආපන ශාලා		100 0	1,200 0
03.	එළවළු සහ පළතුරු වෙළෙඳසැල් (වෙළඳාම හා ගබඩා කිරීම්)		100 0	1,200 0
04.	නේවාසික හෝටල්	4-1 නේවාසික කාමර සහිත කාමර 5ට අඩු	200 0	
		4-2 නේවාසික කාමර සහිත කාමර 5-10 දක්වා	500 0	
		4-3 නේවාසික කාමර සහිත කාමර 11-20 දක්වා	750 0	
		4-4 නේවාසික කාමර සහිත කාමර 20ට වැඩි	1.000 0	

අනු. අංකය	ව්‍යාපාර ස්වභාවය/ආයතන වර්ගය		අයකළ යුතු මාසික ගාස්තුව රු. ශත	අයකළ යුතු වාර්ෂික ගාස්තු රු. ශත
05.	මස්, මාළු, කුකුල් මස් හෝ බිත්තර අලෙවි සල්		100 0	1,200 0
06.	සිල්ලර වෙළඳ සල්		100 0	1,200 0
07.	කුඩා පරිමාණ වෙනත් ව්‍යාපාර (ලොතරැයි අලෙවිසල්, දුරකථන සේවා, උකස් මධ්‍යස්ථාන ආදී)		75 0	900 0
08.	කර්මාන්ත ශාලා	8-1 කුඩා කර්මාන්ත (සේවක සංඛ්‍යාව 5ට අඩු)	250 0	
		8-2 සුළු පරිමාණ කර්මාන්ත (සේවක සංඛ්‍යාව 25ට අඩු 5 ට වැඩි)	3,000 0	
		8-3 මධ්‍ය පරිමාණ කර්මාන්ත ශාලා (සේවක සංඛ්‍යාව 200ට අඩු 25ට වැඩි)	5,000 0	
		8-4 මහා පරිමාණ කර්මාන්ත ශාලා (සේවක සංඛ්‍යාව 200ට වැඩි)	7,500 0	
09.	කැණීම්, ඉදිකිරීම්, කඩා දැමීම්, ජලය, විදුලිය, දුරකථන හෝ වෙනත් පොදු පහසුකම් වෙනුවෙන්		ඇස්තමේන්තු කරන ප්‍රමාණය අනුව	

11-296/8

පන්විල ප්‍රාදේශීය සභාව

ස්ථාවර ජල ගාස්තු පැනවීම - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 118 වැනි වගන්තියෙන් පන්විල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පන්විල ප්‍රාදේශීය සභාව සඳහා 2023 වර්ෂයට අදාළ ස්ථාවර ජල ගාස්තු නියම කිරීම 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 21 වැනි දින පවත්වන ලද පන්විල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක (ඉ) 01.lll.ix යටතේ පහත ආකාරයට යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. ජී. සෙනවිරත්න,
සභාපති,
පන්විල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 21 වැනි දින,
පන්විල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 118 වැනි වගන්ති ප්‍රකාර සහ මෙම සභාව පිළිගත් සම්මත අතුරු ව්‍යවස්ථා අනුව පහත සඳහන් ප්‍රමාණයන් අනුව ස්ථාවර ජල ගාස්තුවක් 2023 වර්ෂයට පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

පන්විල නගරය :	රු. ශත
ගෘහස්ථ සේවා ස්ථාන සඳහා	300 0
වෙළඳ ව්‍යාපාරික ස්ථාන සඳහා	350 0

	රු. ශත
හුළු ගඟ නගරය :	
ගෘහස්ථ සේවා ස්ථාන සඳහා	300 0
වෙළඳ ව්‍යාපාරික ස්ථාන සඳහා	350 0
අරත්තන - දික්ඛින්න නගරය :	
ගෘහස්ථ සේවා ස්ථාන සඳහා	300 0
වෙළඳ ව්‍යාපාරික ස්ථාන සඳහා	350 0
මඩුල්කැලේ නගරය :	
ගෘහස්ථ සේවා ස්ථාන සඳහා	300 0
වෙළඳ ව්‍යාපාරික ස්ථාන සඳහා	350 0
(හුළුගඟ) අළකොළ ගම්උදාව :	
ගෘහස්ථ සේවා ස්ථාන සඳහා	300 0
වෙළඳ ව්‍යාපාරික ස්ථාන සඳහා	350 0
(හුළුගඟ) අළකොළ ජනපදය :	
ගෘහස්ථ සේවා ස්ථාන සඳහා	300 0
වෙළඳ ව්‍යාපාරික ස්ථාන සඳහා	350 0
කොස්ගම නගරය :	
ගෘහස්ථ සේවා ස්ථාන සඳහා	300 0
වෙළඳ ව්‍යාපාරික ස්ථාන සඳහා	350 0
කොස්ගම නගරය : (ජල මනු සවිකිරීමෙන් පසු ගාස්තු) :	
ගෘහස්ථ සේවා ස්ථාන සඳහා	150 0
ඒකකය 0-5 දක්වා	5 0
ඒකකය 6-10 දක්වා	10 0
ඒකකය 11 වැඩි	12 0
වෙළඳ ව්‍යාපාරික ස්ථාන සඳහා	200 0
ඒකකය 0-5 දක්වා	7 0
ඒකකය 6-10 දක්වා	12 0
ඒකකය 11 වැඩි	15 0
වෙනත් :	
විසන්ධි ජල සැපයුම නැවත සන්ධි කිරීමේ ගාස්තුව	
ගෘහස්ථ	1,500 0
ව්‍යාපාරික	1,750 0
නව ජල සේවාවක් සඳහා තැන්පත් මුදල	
* පන්විල, හුළුගඟ, කොස්ගම, අරත්තන, මඩුල්කැලේ අලකොල ගම් උදව, අලකොල ජනපදය සඳහා	
ගෘහස්ත	2,000 0
ව්‍යාපාර	3,000 0

නව ජල සේවාවක් සඳහා සේවා ගාස්තුව

	රු. ශත
පන්විල	4,000 0
හුළුගඟ, මඩුල්කැලේ, කොස්ගම, අරත්තන	3,500 0
අලකොල ගම්උදාව, අලකොල ජනපදය	2,500 0

	රු. ශත
ජල අයදුම්පත්‍ර ගාස්තුව	250 0
පාරිභෝගිකයෙකුගේ නම වෙනස් කිරීමේ ගාස්තුව	2,500 0

ජල මනුව සහිත ජල සැපයුමක් ලබා ගැනීම සඳහා ගාස්තුව (කම්කරු ගාස්තුව සමග) - රු.15,250 0

11-296/9

පන්විල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වැනි වගන්තිවලින් පන්විල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පන්විල ප්‍රාදේශීය සභාව සඳහා 2023 වර්ෂයට අදළ ප්‍රචාරක දන්වීම් පිළිබඳ ගාස්තු නියම කිරීම 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 21 වැනි දින පවත්වන ලද පන්විල ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 01.lll.x යටතේ පහත ආකාරයට යෝජනාව ඒකමතික ව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. ජී. සෙනවිරත්න,
සභාපති,
පන්විල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 21 වැනි දින,
පන්විල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 හා 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර, 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා අනුමත කර ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර, පන්විල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට/පාරකට/ඇළකට/මුහුදකට/අහසට පෙනෙන පරිදි වර්ග අඩියකට නොඅඩු දැන්වීමක් හෝ ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

අනු අංකය	පුවරුවේ ස්වභාවය	වර්ග මීටර් ප්‍රමාණය	ගාස්තුව රුපියල්		
			මාස 03 ට අඩු	මාස 03 හෝ 06 අතර	වසරක් සඳහා
01	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	800	1,200
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
06	ප්ලාස්ටික් පුවරු හෝ ස්ටිකර් පුවරු හෝ ඩිජිටල් මුද්‍රිත පුවරු (ෆ්ලෙක්ස්) මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	500	700	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	850	1,000	1,250
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින්		

පන්විල ප්‍රාදේශීය සභාව

කුළී රථවාහන නවතා තැබීම වෙනුවෙන් වාර්ෂික අවසර පත්‍ර ගාස්තුවක් අය කිරීම - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වැනි වගන්තිවලින් පන්විල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පන්විල ප්‍රාදේශීය සභාව සඳහා 2023 වර්ෂයට අදාළ කුළී රථ වාහන නවතා තැබීම වෙනුවෙන් වාර්ෂික අවසරපත්‍ර ගාස්තු නියම කිරීම 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 21 වැනි දින පවත්වන ලද පන්විල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක (ඉ) 01.lll.xi යටතේ පහත ආකාරයට යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. ජී. සෙනවිරත්න,
සභාපති,
පන්විල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 21 වැනි දින,
පන්විල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 යන වගන්තිවලින් ලැබී ඇති බලය ප්‍රකාරව, මධ්‍යම පළාත් සභා පරිපාලන ප්‍රදේශයේ පන්විල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර පනවා ඇති කුළී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා අනුශාංගික විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා අනුමත කර 2007 අගොස්තු 17 දින අංක 1510/42 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ)* හා ඒ සමග කියවිය යුතු මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා අනුමත කර 2013.03.22 දින අංක 1802/22 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ)* මගින් ප්‍රකාශයට පත් කරන ලද්දා වූද 2020 වර්ෂයට I වන උපලේඛනය පරිදි සියළුම කුලී රථ ගාල් ගාස්තු අය කිරීමටත් II වන උපලේඛනයේ සඳහන් වාර්ෂික ගාස්තුවක් පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

ඒ ඒ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට නැවත දැනුම් දීමකින් අවලංගු කරන තෙක් 2023 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට ගාස්තු පනවා ඇති බව දැනුම් දෙමි. අදාළ බදු සෑම වසරකම මාර්තු 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්, මාර්තු 31 වැනි දිනෙන් පසුව කුළී රථ ගාල් සඳහා ලියාපදිංචි වන අයවලුන් දින 14ක් ගතවීමට ප්‍රථමව අදාළ ගාස්තු ගෙවා අවසර පත්‍රය ලබාගත යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

I වැනි උපලේඛනය

	රු. ශත
පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින සියලුම නම්කරන ලද කුළී රථ වාහන නැවතුම් පළවල්/රථගාල් සඳහා ගාස්තු	1,500 0

II වැනි උපලේඛනය

1.	රථ වාහන නැවතුම්පල ස්ටිකර් සඳහා	150 0
2.	නව ලියාපදිංචි කිරීමක් සඳහා	3,500 0

11-296/11

පන්විල ප්‍රාදේශීය සභාව

නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීමේ හා වෙනත් ඉදිකිරීම් - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 22 (අ) වගන්තිය සමග කියවිය යුතු 122 හා 126 වැනි වගන්ති යටතේ පන්විල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පන්විල ප්‍රාදේශීය සභාව සඳහා 2023 වර්ෂයට අදාළ නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම වෙනුවෙන් 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 21 වැනි දින පවත්වන ලද පන්විල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක (ඉ) 01.lll.xii යටතේ පහත ආකාරයට යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු කරමි.

ඒ. ජී. සෙනවිරත්න,
සභාපති,
පන්විල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 21 වැනි දින,
පන්විල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ කියැවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221(අ) වගන්තිය සමග කියවිය යුතු 122 හා 126 වැනි වගන්තිවලින් ප්‍රාදේශීය සභාවලට බලය ලැබී ඇති විධිවිධාන මත 2023.01.01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම හා ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් මත පහත දැක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට හා නව ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

නිවාස දේපළ සංවර්ධනය කිරීම හා ඉඩම් කට්ටිකර විකිණීම

වෙන්දේසිකර විකුණනු ලබන සෑම ඉඩමක් සඳහාම ඉඩම් වෙන් කිරීමේ මිනින්දෝරු සැලසුම ප්‍රාදේශීය සභාවෙන් අනුමත කරවා ගත යුතුය. ඒ සඳහා පහත දැක්වෙන අනුබෙදීමේ ගාස්තුවක් අය කෙරේ :

	ඉඩම් කොටස්	*රු. ශත*
01.	පර්චස් 20 දක්වා	1,500 0
02.	පර්චස් 21-40 දක්වා	1,600 0
03.	පර්චස් 41-60 දක්වා	1,700 0
04.	පර්චස් 61-120 දක්වා	1,800 0
05.	පර්චස් 121 - 200 දක්වා	1,900 0
06.	පර්චස් 201 ට වැඩි වන සෑම පර්චස් 20ක් හෝ කොටසකට රු. 500 බැගින් අය කෙරේ.	

ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් :

බල ප්‍රදේශයේ සිදුකරනු ලබන සියලු ඉදිකිරීමක දී හෝ ගොඩනැගිල්ලක් වැඩිදියුණු කිරීමේ දී ගොඩනැගිලි ඉල්ලුම් පත්‍රයක් ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතුයි. මෙහි දී අනුමත වීථි රේඛා සීමාව හෝ ගොඩනැගිලි සීමාව සැලකිල්ලට ගනු ලැබේ. පරීක්ෂණ හා අනුමත කිරීමේ ගාස්තු පහත පරිදි වේ :

01. වර්ග අඩි 750 දක්වා (ගෘහස්ථ) රු. 1,000 කි ;
02. වර්ග අඩි 751 සිට වැඩිවන සෑම වර්ග අඩි 10 කට හෝ කොටසකට හෝ රු. 50 බැගින් අය කෙරේ.

03. වර්ග අඩි 750 දක්වා (වාණිජ) රු. 3,000.

04. වර්ග අඩි 751 සිට වැඩිවන සෑම වර්ග අඩි 10 ට හෝ කොටසකට හෝ රු. 100 බැගින් අය කෙරේ. (වාණිජ).

05. සීමා බැමි දික් අඩි 01ක් සඳහා රු. 100.

දුරකථන :

06.	දුරකථන සම්ප්‍රේෂණ කුළුණු උස මීටර් 5-20 අතර	රු. 40,000.
07.	දුරකථන සම්ප්‍රේෂණ කුළුණු උස මීටර් 21-50 අතර	රු. 50,000.
08.	දුරකථන සම්ප්‍රේෂණ කුළුණු උස මීටර් 51 ට වැඩි	රු. 70,000.
	මහා පරිමාණ ආදායම් උත්පාදන ව්‍යාපෘති :	
09.	විශේෂ සංවර්ධන ව්‍යාපෘති මිලියන 5 ට අඩු	රු. 75,000.
10.	විශේෂ සංවර්ධන ව්‍යාපෘති මිලියන 5-50 අතර	රු. 250,000.
11.	විශේෂ සංවර්ධන ව්‍යාපෘති මහා පරිමාණ	රු. 5,00,000.

11-296/12

පන්විල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියෙන් පන්විල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව පන්විල ප්‍රාදේශීය සභාව සඳහා 2023 වර්ෂයට අදාළ සංවර්ධනය නොකළ ඉඩම් මත බදු නියම කිරීම 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 21 වැනි දින පවත්වන ලද පන්විල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 01.lll.xiii යටතේ පහත ආකාරයට යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. ජී. සෙනවිරත්න,
සභාපති,
පන්විල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 21 වැනි දින,
පන්විල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ නිත්‍ය හෝ ස්ථාවර *නැනහොන්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(*අ*) ඒ ඉඩමෙ හි ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ,

(*ආ*) ඒ ඉඩම විධිමත් ලෙස වගා කිරීමට යටත්කර නොමැති විටක හෝ,

(*ඇ*) ඒ ඉඩම ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යටවී ඇති බිම් ප්‍රමාණය හෝ වගා කිරීමට යටත් බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 60%ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2023 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් 0.05%ක බද්දක් පැනවීමටත් අදාළ මුදල පන්විල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු යැයි ද යෝජනා කරමි.

11-296/13

පන්විල ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වැනි වගන්තියෙන් පන්විල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පන්විල ප්‍රාදේශීය සභාව සඳහා 2023 වර්ෂයට අදාළ සංවර්ධනය නොකළ ඉඩම් මත බදු නියම කිරීම 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 21 වැනි දින පවත්වන ලද පන්විල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක (ඉ) 01.lll.xiv යටතේ පහත ආකාරයට යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. ජී. සෙනවිරත්න,
සභාපති,
පන්විල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 21 වැනි දින,
පන්විල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වැනි වගන්තිය යටතේ පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක, ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% ක සමාන බද්දක් විකුණුම්කරුවකු හෝ වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් පන්විල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට පනවා අය කළ යුතු යැයි තීරණය කරමි.

11-296/14

පන්විල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට වෙනත් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය යටතේ පන්විල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පන්විල ප්‍රාදේශීය සභාව සඳහා 2023 වර්ෂයට අදාළ ගාස්තු නියම කිරීම 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 21 වැනි දින පවත්වන ලද පන්විල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක (ඉ) 01.lll.xv යටතේ පහත ආකාරයට යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. ජී. සෙනවිරත්න,
සභාපති,
පන්විල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 21 වැනි දින,
පන්විල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අනුව 2023 වර්ෂයට අදාළව පන්විල ප්‍රාදේශීය සභාව විසින් සේවා සැපයීම වෙනුවෙන් ගාස්තු පහත සඳහන් උපලේඛනය අනුව පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

		රු. ශත
01.	පාරිසරික අයදුම්පත්‍ර ගාස්තු	200 0
02.	පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් (තුන් අවුරුදු)	4,500 0
03.	පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු	200 0
04.	*පරීක්ෂා කිරීමේ ගාස්තු - (පාරිසරික බලපත්‍ර) :*	

උපරිම ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපෘතියේ මූලික ප්‍රාග්ධන ආයෝජන පදනම් කොට ගෙන නිශ්චය කරනු ලැබේ. පහත දැක්වෙන පරිදි උපරිමයකට යටත්ව, පරීක්ෂා කිරීමේ ගාස්තුව අය කෙරේ.

අනු. අංකය	*ආයෝජනය*	*ගාස්තුව රු. ශත*	*මුළු මුදල රු. ශත*
(i)	රු. 1,000,000 ට වැඩි	10,000 0	10,000 0
(ii)	රු. 500,001 - රු. 1,000,000 දක්වා	5,000 0	5,000 0
(iii)	රු. 250,001 - රු. 500,000 දක්වා	3,750 0	3,750 0
(iv)	රු. 250,000 අඩු	3,000 0	3,000 0

05.	ව්‍යාපාර ගාස්තු/බදු සඳහා නිකුත් කරනු ලබන අයදුම් පත්‍රය	රු. 100 0
06.	ලිපි ද්‍රව්‍ය ගාස්තු	රු. 250 0

		රු. ශත
07.	ගොඩනැගිලි අයදුම්පත්‍රයක් සඳහා (ගෘහස්ථ) වරිපනම් සීමාවෙන් බැහැරව	1,500 0
08.	ගොඩනැගිලි අයදුම්පත්‍රයක් සඳහා (ගෘහස්ථ) වරිපනම් සීමාව තුළ	2,000 0
09.	ගොඩනැගිලි අයදුම්පත්‍රයක් සඳහා (වාණිජ) වරිපනම් සීමාවෙන් බැහැරව	2,500 0
10.	ගොඩනැගිලි අයදුම්පත්‍රයක් සඳහා (වාණිජ) වරිපනම් සීමාව තුළ	3,000 0

11. වීථිරේඛා සහතික හා නොපවරා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීම

ඉඩමේ ප්‍රමාණය (අක්කර)	*මුළු ගාස්තුව රු. ශත*
01-03	3,000 0
04-06	3,250 0
07-10	5,000 0
11-20	10,000 0
21-30	15,000 0
31-40	35,000 0
41-50	50,000 0

12. නව පිඹුරුපතක් අනුමත කර ගැනීම :

ඉඩමේ ප්‍රමාණය (එක් කොටසක් සඳහා)	*ගාස්තුව*
	රු. ශත
අක්කර 1ට අඩු	2,500 0
අක්කර 1-5 දක්වා	4,000 0
අක්කර 6-10 දක්වා	7,500 0
අක්කර 11-15 දක්වා	10,000 0
අක්කර 16ට වැඩි	15,000 0

		රු. ශත
13.	අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම (ගෘහ) වරිපනම් සීමාවෙන් බැහැරව	2,000 0
14.	අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම (ගෘහ) වරිපනම් සීමාව තුළ	2,500 0
15.	අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම (වාණිජ) වරිපනම් සීමාවෙන් බැහැරව	4,000 0
16.	අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම (වාණිජ) වරිපනම් සීමාව තුළ	4,500 0
17.	ගොඩනැගිලි සැලසුමේ අනුමත කාලය දීර්ඝ කර ගැනීම (වසරක් සඳහා) (ගෘහස්ථ)	2,000 0
	(වාණිජ)	3,500 0
18.	වරිපනම් ගෙවන/නොගෙවන බවට සහතික කිරීමේ ගාස්තුව	700 0
19.	ඔප්පු උධෘත අයදුම්පත ගාස්තුව	700 0

20. *ඔප්පු උධෘත ලියාපදිංචි ගාස්තුව :*

ඔප්පුවේ වටිනාකම (රුපියල්)	*පරීක්ෂා කිරීමේ ගාස්තු*	*ලියාපදිංචි ගාස්තු*	*මුළු එකතුව*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01-50,000	1,250 0	500 0	1,550 0
50,001-1,00,000	1,250 0	750 0	1,750 0
100,001-150,000	1,250 0	1,000 0	2,000 0
150,001-200,000	1,250 0	1,250 0	2,250 0
200,001-250,000	1,250 0	1,500 0	2,500 0
250,001-500,000	1,250 0	1,750 0	2,750 0
500,001-1,000,000	1,500 0	3,500 0	5,000 0
1,000,001-2,000,000	1,500 0	6,000 0	7,500 0
2,000,001-3,000,000	1,500 0	8,500 0	10,000 0
3,000,001-4,000,000	1,500 0	13,500 0	15,000 0
4,000,001-5,000,000	1,500 0	18,500 0	20,000 0
5,000,000 ට වැඩි	1,500 0	23,500 0	25,000 0

		රු. ශත
21.	සුසාන භූමි ස්මාරක ඉදිකිරීම - වර්ග අඩියකට	2,500 0

22. කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු :

කොන්ත්‍රාත් වටිනාකම (රු.)	*අය කරනු ලබන ගාස්තුව*
	රු. ශත
50,000 දක්වා	1,500 0
50,001 - 1,00,000 දක්වා	1,750 0
1,00,001 5,00,000 දක්වා	2,750 0
5,00,001 10,00,000 දක්වා	3,250 0
10,00,001 20,00,000 දක්වා	3,750 0
20,00,001 සිට 50,00,000.00 දක්වා (C8)	7,500 0
50,00,001 - 1,00,00,000 දක්වා (C7)	15,000 0
10,00,0001 - 1,50,00,000 දක්වා	30,000 0

		රු. ශත
23.	කර්මාන්ත ලොග් සටහන් පොත හා ගිවිසුම් පත්‍ර ගාස්තුව	1,000 0
24.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	3,000 0
25.	ගලි බවුසරය ලබාගැනීම සඳහා අනුමැතිය ලබාගැනීම	2,000 0

27. මාර්ග පලුදුව සඳහා අවසර ලබාගැනීම :

(I) පස් පාර - හරහා කැපීම	2,000 0
(II) 2'x2' වලක් කැපීම (මාර්ගයේ උරහිස)	2,000 0
(III) කොන්ක්‍රීට් මාර්ගය පලුදු කිරීම - හරහා කැපීම	7,500 0
(IV) තාර මාර්ගය පලුදු කිරීම - හරහා කැපීම	7,500 0
(V) කාපට් මාර්ගය පලුදු කිරීම - හරහා කැපීම	9,500 0
(VI) ඉන්ටලොග් මාර්ගය පලුදු කිරීම - හරහා කැපීම	7,500 0

28. ඡායා පිටපත් ලබාදීම :

විස්තරය		*අයකරනු ලබන ගාස්තුව*
		රු. ශත
A4	තනිපිට 1ක් සඳහා	15 0
A4	දෙපිට 1ක් සඳහා	20 0
Legal	තනිපිට 1ක් සඳහා	20 0
Legal	දෙපිට 1ක් සඳහා	25 0
A3	තනිපිට 1ක් සඳහා	25 0
A3	දෙපිට 1ක් සඳහා	30 0

29. තණ කොළ කපන යන්ත්‍රය කම්කරු මහතෙකු ද සමග තෙල් රහිත දිනකට (පැය 8) කුලියට ලබා දීම රු. 2,500 0

30. JCB යන්ත්‍රය කුළියට ලබාදීම - දිනක ගාස්තුව පළමුව ගෙවිය යුතු ය.
මැෂින් පැයකට - රු. 4,400.00
(සේවා ලබා ගැනීමට පෙර (පැය 04) රු. 17,600 0ක මුදලක් තැන්පත් කළ යුතුය)

31. කොඩි කණුවක් එක් දිනකට කුළියට ලබා දීම රු. 30 0

32. ඩ්‍රම් ට්‍රක් යන්ත්‍රය කුළියට ලබා දීම :
* 10 km දක්වා රු. 7,650 0
* ඊට වැඩි වන සෑම 1km සඳහා රු. 380 0

33.	ට්‍රැක්ටරය හා ට්ලරය දිනකට කුළියට දීම (පැය 8කට)	රු. 16,700 0
34.	ඩීසල් ජල පොම්පය දිනකට කුළියට ලබා දීම	රු. 3,000 0
35.	පුද්ගලික ආයතනවලින් කසළ ලෝඩ් එකක් ප්‍රවාහනය කිරීම	
	* පළමු 10km දක්වා	රු. 4,000 0
	* වැඩිවන සෑම 1km සඳහා	රු. 250 0

36. ජල බවුසරය සඳහා :

	රු. ශත
• ස්ථාවර ගාස්තු	2,250 0
• පළමු 1km සඳහා	1,400 0
• ඊට වැඩිවන සෑම 1km සඳහා	700 0
• නවතා තැබීමේ ගාස්තු	4,000 0

37. කෲ කැබ් රථය කුළියට ලබා දීම -

• 10 km දක්වා	රු. 4,380 0
• වැඩිවන සෑම 1km සඳහා	රු. 219 0

		රු. ශත
38.	පුස්තකාල අයදුම්පත්‍රය :	50 0
	පුස්තකාල ඇප තැන්පතු :	
39. (i)	පුස්තකාල සාමාජික ඇප ළමා (අවු. 5-14 අතර)	100 0
(ii)	පුස්තකාල සාමාජික ඇප ළමා (අවු. 15-18 අතර)	150 0
(iii)	පුස්තකාල සාමාජික වාර්ෂික දායක ගාස්තු (අවු. 5-14 අතර)	50 0
(iv)	පුස්තකාල සාමාජික වාර්ෂික දායක ගාස්තු (අවු. 15-18 අතර)	50 0
(v)	පුස්තකාල වැඩිහිටි සාමාජික - වාර්ෂික ඇප	300 0
(vi)	පුස්තකාල වැඩිහිටි සාමාජික - වාර්ෂික දායක ගාස්තු	150 0

පුස්තකාල දඩ මුදල්

40.	පුස්තකාල දඩ මුදල දිනකට (එක් පොතකට)	ළමා	5 0
		වැඩිහිටි	10 0

41. පාඨකයෙකුට ලබාදෙන පුස්තකාල පොතක් අස්ථාන ගත වීමක දී එම පොතේ වටිනාකම මෙන් දෙගුණයක් හා එම පොතේ වටිනාකමින් 25% මුදලක් දෙපාර්තමේන්තු ගාස්තු වශයෙන් අයකරනු ලැබේ.

42.	සහතික කරන ලද ඡායා පිටපත් නිකුත් කිරීම	500 0
43.	3'' x 2'' ජාතික කොඩිය දිනකට	30 0
44.	2'' x 5'' පථාකය දිනකට	50 0
45.	ජාතික කොඩිය, පථාක, රැගෙන යන භාණ්ඩ අස්ථාන ගතවුවහොත් රැගෙන යන භාණ්ඩයේ වටිනාකම හා ප්‍රමාදවන දිනක් සඳහා රු. 25 0 බැගින් දඩ මුදලක් අය කිරීම.	
46.	රෝගීන්ගේ රුධිරයේ සීනි පරීක්ෂාව සඳහා ගාස්තු	200 0
47.	වෛද්‍ය සහතික නිකුත් කිරීම	200 0

48. පන්විල වෙළෙඳ සංකීර්ණයේ කඩ කුළී අයකිරීම :

• කඩ කාමර අංක - 77/2 (මාසික ගාස්තුව)	3,500 0
• ඉතිරි කඩ කාමර 29 සඳහා මාසික ගාස්තු	3,000 0

49. හුළුගඟ නගරයේ සතිපොළ ගාස්තු අයකිරීම :

• හුළුගඟ පොළ භූමියේ භූමිය මත ගාස්තු අය කිරීම (දිනකට)	150 0

50. නකල්ස් නිවාඩු නිකේතනය :

* දේශීය සංචාරකයින් සඳහා දිනකට	රු. 15,000 0
* විදේශීය සංචාරකයින් සඳහා දිනකට	රු. 25,000 0
* **වාහන නැවතුම්පල ගාස්තු**	
මෝටර් බයිසිකලය	රු. 100 0
ත්‍රීරෝද රථය	රු. 200 0
කාර්	රු. 300 0
වෑන් රථය	රු. 500 0
බස් රථය	රු. 1,000 0

51. **හුළුගඟ නැරඹුම් මැදිරිය**

පහළ මහළ

• දේශීය සංචාරකයින් සඳහා දිනකට	රු. 15,000 0
• විදේශීය සංචාරකයින් සඳහා දිනකට	රු. 25,000 0
• ඊට අමතරව දේශීය සංචාරකයින් සඳහා 8 දෙනෙකුට වැඩි නවාතැන් ගන්නා අවස්ථාවලදී එක් අයෙකුගෙන් දිනකට	රු. 500 0
• හුළුගඟ නැරඹුම් මැදිරියේ මුළුතැන්ගෙය හා මුළුතැන්ගෙයි උපකරණ භාවිතා කිරීම දිනකට	රු. 1,000.0
• හුළුගඟ නැරඹුම් මැදිරිය (එළිමහන් ස්ථානය) විවාහ මංගල ඡායාරූපකරණය සඳහා ලබාදීම	රු. 2,000.00

දිය ඇල්ල නැරඹුම් මැදිරිය සඳහා ප්‍රවේශ පත්‍ර ගාස්තු :

• දේශීය ළමුන් සඳහා	රු. 20 0
• දේශීය වැඩිහිටියන් සඳහා	රු. 50 0
• විදේශීය සංචාරක ළමයින් සඳහා	රු. 250 0
• විදේශීය සංචාරක වැඩිහිටියන් සඳහා	රු. 500 0

52. කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂණය එක් ස්ථාන පරීක්ෂණය සඳහා රු. 600 00
(ප්‍රවාහන පහසුකම් කොන්ත්‍රාත් කරුවන් විසින් ම සපයා ගත යුතුය.)

53. හිස් බිම් කට්ටි :

හිස් බිම් කට්ටි 01 සඳහා වාර්ෂික බදු කුළිය	රු. 6,000 0
හිස් බිම් කට්ටි 02 සඳහා වාර්ෂික බදු කුළිය	රු. 3,600 0
හිස් බිම් කට්ටි 03 සඳහා වාර්ෂික බදු කුළිය	රු. 10,200 0
හිස් බිම් කට්ටි 04 සඳහා වාර්ෂික බදු කුළිය	රු. 7,800 0
හිස් බිම් කට්ටි 04A සඳහා වාර්ෂික බදු කුළිය	රු. 5,400 0
හිස් බිම් කට්ටි 05 සඳහා වාර්ෂික බදු කුළිය	රු. 11,400 0
හිස් බිම් කට්ටි 06 සඳහා වාර්ෂික බදු කුළිය	රු. 14,400 0
හිස් බිම් කට්ටි 07 සඳහා වාර්ෂික බදු කුළිය	රු. 27,000 0
හිස් බිම් කට්ටි 08 සඳහා වාර්ෂික බදු කුළිය	රු. 15,000 0
හිස් බිම් කට්ටි 08A සඳහා වාර්ෂික බදු කුළිය	රු. 11,400 0

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළව අතුරු ව්‍යවස්ථාව යටතේ 2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2023 වර්ෂයේ දී පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මතම ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග' කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්ත වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් ස්ථානය හෝටලයක, ආපනශාලාවක, නවාතැන්පොලක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නේ ද, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ ලියාපදිංචි කර අනුමත කර හෝ පිළිගත්තා වූ ද, එක් අවස්ථාවක වූ ද අවස්ථාවකදී එකී හෝටලයේ, ආපන ශාලාවේ හෝ නවාතැන් පොළෙහි 2022 වර්ෂයේ ලැබීම්වලින් සියයට එකක (1%) ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

උපලේඛනය

1988 අගෝස්තු මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 දරන විශේෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ ප්‍රසිද්ධ කරනු ලැබ ඇති සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍ර නිකුත් කිරීමට නියමිත කර්මාන්ත හා වෙළෙඳ ව්‍යාපාර :

අනු. අංකය	*වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
			පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට වැඩි රු, 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ	*රු. ශ.*	*රු. ශ.*
01	ලැගුම් නිවාස	500 0	750 0	1,000 0
02	හෝටල්	500 0	750 0	1,000 0
03	බත් කඩ, ආපන ශාලා සහ තේ, කෝපි කඩ	500 0	750 0	1,000 0
04	බේකරි	500 0	750 0	1,000 0
05	කිරි පට්ටි හා කිරි වෙළෙඳාම	500 0	750 0	1,000 0

අනු. අංකය	වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය	I වැනි තීරුව	II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750ට වැඩි රු, 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 ඉක්මවන අවස්ථාවක
		රු. ශ	රු. ශ.	රු. ශ.
06	ආහාර විකිණීම	500 0	750 0	1,000 0
07	අයිස් කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
08	සිසිල් බීම කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
09	ලොන්ඩරි	500 0	750 0	1,000 0
10	ගවගාල්	500 0	750 0	1,000 0
11	ඝාතක මඩු	500 0	750 0	1,000 0
12	කොන්ඩා කැපීමේ සහ සැලුන් සහ බාබර් සාප්පු	500 0	750 0	1,000 0
13	සිල්ලර වෙළෙඳාම	500 0	750 0	1,000 0
14	එළවළු වෙළඳාම	500 0	750 0	1,000 0
15	පලතුරු වෙළෙඳාම	500 0	750 0	1,000 0
16	බුලත්, පුවක් වෙළඳාම	500 0	750 0	1,000 0
17	රෙදිපිළි අලෙවිය	500 0	750 0	1,000 0

2016 පෙබරවාරි මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1955/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ ප්‍රසිද්ධ කරනු ලැබ ඇති මධ්‍යම පළාත් සභාවේ සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍ර නිකුත් කිරීමට නියමිත කර්මාන්ත හා වෙළෙඳ ව්‍යාපාර :

පීඩාකාරී ව්‍යාපාර :

18	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
19	පොහොර ගබඩා කර විකිණීම	500 0	750 0	1,000 0
20	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
21	සම් විකිණීම	500 0	750 0	1,000 0
22	සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
23	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
24	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තැබීම	500 0	750 0	1,000 0
25	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
26	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
27	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
28	සත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
29	පුන්නක්කු නිපදවීම හෝ කිලෝ ග්‍රෑම් 200 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
30	සබන් නිෂ්පාදනය කිරීම.	500 0	750 0	1,000 0
31	සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
32	අළුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
33	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

අනු. අංකය	වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය	I වැනි තීරුව	II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750ට වැඩි රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 ඉක්මවන අවස්ථාවක
		රු. ශ	රු. ශ.	රු. ශ.
34	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
35	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
36	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
37	සිරප් හෝ පලතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
38	රසකැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
39	පොල් ලෙලි පෙඟවීම හෝ පල් කිරීම	500 0	750 0	1,000 0
40	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
41	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
42	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
43	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
44	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
45	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
46	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
47	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
48	පලතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
49	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
50	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
51	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
52	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
53	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
54	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
55	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
56	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
57	ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
58	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
59	ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
60	සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1000 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
61	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
62	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
63	ප්ලාස්ටික් හෝ ඇලුමිණියම් භාණ්ඩ අලෙවිය	500 0	750 0	1,000 0
64	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
65	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
66	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
67	ධාන්‍ය හෝ මාංෂ භෝග කිලෝ ග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0

අනු. අංකය	වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය	I වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශ	II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි රු, 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශ.	III වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශ.
68	කුකුල් මස් හා වෙනත් මස් වර්ග පැකට් කර විකිණීම	500 0	750 0	1,000 0
69	කාබනික පොහොර (කොම්පොස්ට්) හා කෘෂි රසායනික ද්‍රව්‍ය (කාබනික) අලෙවිය	500 0	750 0	1,000 0
70	ටයිල් ගබඩාකර විකිණීම	500 0	750 0	1,000 0
	අන්තරාදායක ව්‍යාපාර :			
71	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝ ග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
72	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
73	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
74	කුකුළන් 100 ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළු ගාලක් හෝ කුකුළු කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
75	එළුවන්, ඌරන් 10 වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
76	ගඩොල් හෝ උළු ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
77	දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
78	කළුගල් කැණීම අතින්	500 0	750 0	1,000 0
79	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
80	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
81	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
82	ගිනි පෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
83	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
84	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
85	ස්වර්ණාභරණ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
86	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
87	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
88	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබාගැනීම	500 0	750 0	1,000 0
89	පාපැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
90	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
91	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
92	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0
93	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
94	ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
95	දැව ගබඩා කිරීම	500 0	750 0	1,000 0

අනු. අංකය	වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
			පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට වැඩි රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ	*රු. ශ.*	*රු. ශ.*
පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර :				
96	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
97	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
98	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
99	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
100	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
101	බැටරි විද්‍යුත් ආරෝපනය කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
102	මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
103	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
104	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
105	ගෑස් සිලින්ඩර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
106	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීමේ හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
107	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
108	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
109	කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
110	පෑස්සුම් වැඩපල	500 0	750 0	1,000 0
111	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැලපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
112	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
113	වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
114	විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
115	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
116	සත්ව ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
117	බටහිර ඖෂධ අලෙවිය	500 0	750 0	1,000 0

2016 පෙබරවාරි මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1955/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ ප්‍රසිද්ධ කරනු ලැබ ඇති මධ්‍යම පළාත් සභාවේ සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍ර නිකුත් කිරීමට නියමිත කර්මාන්ත හා වෙළෙඳ ව්‍යාපර :

118	සංචාරක වෙළෙඳාම	500 0	750 0	1,000 0
119	මාළු විකිණීම	500 0	750 0	1,000 0
120	මස් විකිණීම	500 0	750 0	1,000 0
121	පෞද්ගලික ඉගෙනුම් ආයතන	500 0	750 0	1,000 0

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 දින දී,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

01. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ, එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට හෝ ඊට පෙර ගෙවා අවසන් කර ලැබිය යුතු බවටත්,

02. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 106 වැනි වගන්තියේ විස්තර කර ඇති පරිදි පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති යම් කර්මාන්ත ශාලාවකින් එහි අවට පරිසරයේ සෞඛ්‍ය තත්ත්වයට අන්තරායක් නැතහොත් හානියක් සිදුවිය හැකි එහෙත් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් අතුරු ව්‍යවස්ථාවක විස්තර කර නොමැති සියලු කර්මාන්තවලින් කර්මාන්ත බද්දක් අය කිරීමටත් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *වෙළඳ ව්‍යාපාරයේ ස්වාභාවය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට වැඩි රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ	*රු. ශ.*	*රු. ශ.*
1	මැටි භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවිය	500 0	750 0	1,000 0
2	බීරළු කැටයම් නිර්මාණ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
3	රෙදි කැබලි ගබඩා කර අලෙවි කිරීම	500 0	750 0	1,000 0
4	ශබ්ද විකාශණ යන්ත්‍ර කුළියට දීම	500 0	750 0	1,000 0
5	බිම් මල් වගා කිරීම	500 0	750 0	1,000 0
6	ඔරලෝසු අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
7	පින්තූර රාමු කිරීම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය	II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750ට වැඩි රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
8	මහන මැෂින් අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
9	විදුලි කාර්මික වැඩපලක්	500 0	750 0	1,000 0
10	ඇඳුම් මැසීම	500 0	750 0	1,000 0
11	පාවහන් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
12	ෆයිබර් ග්ලාස් කර්මාන්ත	500 0	750 0	1,000 0
13	බැටරි නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ කර්මාන්තය	500 0	750 0	1,000 0
14	බලවේග පෙහෙකම්හල්	500 0	750 0	1,000 0
15	වෛද්‍ය රසායනාගාර	500 0	750 0	1,000 0
16	වාහන සේවා ස්ථාන	500 0	750 0	1,000 0
17	ඉන්ධන පිරවුම්හල්	500 0	750 0	1,000 0
18	සිසිල් බීම කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
19	ඇඹරුම්හල් (වී, ධාන්‍ය හා කුළු බඩු)	500 0	750 0	1,000 0
20	තේ කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
21	හුනු පෝරණු	500 0	750 0	1,000 0
22	වායු සමීකරණ යන්ත්‍ර	500 0	750 0	1,000 0
23	යකඩ හෝ වානේ කම්හල්	500 0	750 0	1,000 0
24	දුරකතන කුටි	500 0	750 0	1,000 0
25	ජංගම දුරකතන අලෙවි සැල්	500 0	750 0	1,000 0
26	සී.ඩී. තැටි අලෙවිය	500 0	750 0	1,000 0
27	සිවිලිම් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
28	අබලි ද්‍රව්‍ය එකතු කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0

11-332/2

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර පාතහේවාහැට ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

උපලේඛනය

අංක 1

I වැනි තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
01. රු. 6,000.00 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
02. රු. 6,000.00 ඉක්මවන එහෙත් රු. 12,000.00 නොඉක්මවන අවස්ථාවක	90 0
03. රු. 12,000.00 ඉක්මවන එහෙත් රු. 18,750.00 නොඉක්මවන අවස්ථාවක	180 0
04. රු. 18,750.00 ඉක්මවන එහෙත් රු. 75,000.00 නොඉක්මවන අවස්ථාවක	360 0
05. රු. 75,000.00 ඉක්මවන එහෙත් රු. 1,50,000.00 නොඉක්මවන අවස්ථාවක	1200 0
06. රු. 1,50,000.00 ඉක්මවන අවස්ථාවක	3000 0

පහත සඳහන් ආයතන හා ව්‍යාපාරවලින් ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුයි.

01. මෝටර් රථ හා යතුරුපැදි අලෙවිසැල්
02. කළුගල් ඇඹරීමේ ස්ථාන
03. පෞද්ගලික පංති පවත්වාගෙන යනු ලබන ආයතන (ළමුන් 50 ට වැඩි)
04. පෞද්ගලික පෙර පාසල් හා ළමා සුරැකුම් මධ්‍යස්ථාන
05. භාණ්ඩ ගබඩා කර තොග අලෙවිය
06. වාහන සේවා ස්ථාන (සේවකයින් 05 කට වැඩි)
07. බලවේග පෙහෙකම්හල් (තේ, රබර් නිෂ්පාදන කර්මාන්තශාලා)
08. පෞද්ගලික ජල විදුලි බලාගාර
09. සුපිරි වෙළෙඳසැල්
10. ගෘහ භාණ්ඩ හා විදුලි උපකරණ අලෙවිය හා ගබඩාව
11. ඖෂධ තොග වශයෙන් ගබඩාකර අලෙවිය
12. කළුගල් කැණීමේ ස්ථානය
13. ස්වර්ණාභරණ නිෂ්පාදනය හා අලෙවිය

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බද්ද, මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ සමාන වාරික හතරකින් පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා වරිපනම් බද්ද 2023 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බද්දේ වටිනාකමෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසය අවසන්වීමට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ I වැනි උප වගන්තියෙන් පාතහේවාහැට ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල පිහිටි සියලුම නිවාස, ගොඩනැගිලි, ඉඩම් හා ගෙපත්වල 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද වාර්ෂික තක්සේරු වටිනාකම 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ II වැනි උපවගන්තියෙන් පාතහේවාහැට ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, මෙහි පහත දක්වා ඇති වරිපනම් බදු අයකරන කොට්ඨාස තුළ පිහිටා ඇති සියලුම, නිවාස, ගොඩනැගිලි, ඉඩම් හා ගෙපත්වල වාර්ෂික වටිනාකම මත 2022 වර්ෂයේ අයකරනු ලැබූ වරිපනම් බදු ප්‍රතිශතය 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

01. තලාතුඔය කොට්ඨාසය :

1. ගුරුදෙණිය පාර 2. නුවර පාර 3. කිරිමැටිය පාර 4. මාරස්සන පාර	15% වරිපනම් බද්ද

02. මාරස්සන කොට්ඨාසය :

1. කන්දහන්දිය පාර 2. තලාතුඔය පාර 3. පස්ගම පාර 4. උඩුදෙණිය පාර	10% වරිපනම් බද්ද

03. මයිලපිටිය කොට්ඨාසය :

1. නුවර පාර 2. කන්දහන්දිය හඟුරන්කෙත පාර 3. ගල්ලිඳ පාර	10% වරිපනම් බද්ද

04. ගලහ කොට්ඨාසය :

1. නුවර පාර 2. පරණ දෙල්තොටවත්ත පාර 3. හේවාහැට පාර 4. පුපුරුස්ස පාර	15% වරිපනම් බද්ද

05. දෙල්තොට කොට්ඨාසය :

1. බෝපිටිය පාර 2. හේවාහැට පාර 3. ගලහ පාර	10% වරිපනම් බද්ද

11-332/4

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ සමාන වාරික හතරකින් පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා අක්කර බද්ද 2023 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බද්දේ වට්නාකමෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසය අවසන්වීමට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

01. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් පාතහේවාහැට ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයේදී බලාත්මක කරන ලද සත්‍යෝක්ෂණය කිරීම 2023 වර්ෂයේ දී පිළිගැනීමටත්,

02. එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ III වැනි උපවගන්තියෙන් පාතහේවාහැට ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, එකී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථීර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ සහ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමාගේ විධානය යටතේ පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ බල ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වැනි කොටසේ 1989 පෙබරවාරි මස 03 වැනි දින *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හෙයින් ද,

2:1. ඒ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 5කට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු වන අවස්ථාවක රුපියල් 50.00ක වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත්,

2:2. ඉහත 2:1 යටතේ දක්වා ඇති ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩිවන සෑම හෙක්ටයාරයක් මතම රුපියල් 10.00ක වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත්, පතාහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

11-332/5

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙම බද්දට යටත්වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකු ම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2023 වර්ෂය සඳහා වන මෙම බද්ද පාතහේවාහැට ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ IV වැනි උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේදී පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*
		රු. ශත
01.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
02.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
	(අ) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළෙඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*
		රු. ශත
03	සෑම කරත්තයක් සඳහාම	20 0
04	සෑම අත් කරත්තයක් සඳහාම	10 0
05	සෑම රික්ෂෝවක් සඳහාම	7 50
06	සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
07	සෑම ඇතෙකු සඳහා	50 0

8 විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීම්වලින් නිදහස් කෙරේ.

11-332/6

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සංවර්ධනය නොකළ ඉඩම් මත එකී ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් සියයට එකක (1%) බද්දක් අයකිරීමටත් එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර පාතහේවාහැට ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (I) වැනි උපවගන්තිය අනුව පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථාවර *නැනහොන්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ,
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමකට යටත් කොට නොමැති විට හෝ,
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1:4 අනුපාතයට වඩා අඩු වන්නේ නම්,

එම ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් ලෙස සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2023 වර්ෂය සඳහා එක් එක් ඉඩමේ, භූමි ප්‍රමාණයේ ප්‍රාග්ධන අගයෙන් සියයට එකක (1%) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට පෙර පාතහේවාහැට ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් යෝජනා කරනු ලැබේ.

11-332/7

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු පැනවීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා ආනුශාංගික විධිවිධාන පනත යටතේ මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබ මෙහි පහත දක්වන ලද ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු පැනවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, එම වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව 2016 පෙබරවාරි මස 23 වැනි දින අංක 1955/7 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු පැනවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවන් හි ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලය ලැබී ඇති අතර, එම ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු පැනවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙහි 3 වැනි උපවගන්තියෙහි විධිවිධාන අනුව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් අනුමැතිය ලබා ඇත. මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභාවක් වන පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2017 දෙසැම්බර් මස 15 වැනි දින අංක 2050 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් නිවේදනයක් නිකුත් කරමින් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව පිළිගෙන ඇත.

ඒ අනුව මධ්‍යම පළාතේ, පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රාදේශීය සභා අතුරු ව්‍යවස්ථා මාලාවේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තියේ (xxx) වැනි උපවගන්තිය යටතේ සම්පාදිත ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇත.

(1) මෙම ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ප්‍රචාරක දැන්වීම පුවරු ප්‍රදර්ශනය කරන සෑම පුද්ගලයකු විසින් ම අදාළ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තුව 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට පෙර පාතහේවාහැට ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් නිවේදනය කිරීමටත්,

(2) මෙහි පළමුවන උපලේඛනය I වැනි තීරුවේ සඳහන් කිසියම් ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

උපලේඛනය

අනු. අංකය	*ප්‍රචාරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03ට අඩු රු. 250	*මාස 3 හෝ 06 අතර රු. 500*	*වසරක් රු. 1,000*
1	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1/2ට වැඩි 2ට අඩු	2ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 250ක් බැගින්		
2	රෙදි ඩිජිටල් බැනර් සඳහා	1/2ට වැඩි 2ට අඩු	2ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 250ක් බැගින්		
3	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1/2ට වැඩි 2ට අඩු	2ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300ක් බැගින්		
4	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1/2ට වැඩි 2ට අඩු	2ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300ක් බැගින්		
5	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1/2ට වැඩි 2ට අඩු	2ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200ක් බැගින්		
6	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1/2ට වැඩි 2ට අඩු	2ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200ක් බැගින්		
7	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1/2ට වැඩි 2ට අඩු	2ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500ක් බැගින්		

(3) පාතහේවාහැට ප්‍රාදේශීය සභාවට අයත් දැන්වීම් පුවරුවක, ඉඩමක හෝ ගොඩනැගිල්ලක හෝ පරිශ්‍රයක දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කරන විට වරිපනම් බදු අයකරන ප්‍රදේශයක (නාගරික ප්‍රදේශ) වූ විට මාසික බිම් කුළිය ලෙස රු. 1,000 ද, වරිපනම් බද්ද නොගෙවන ප්‍රදේශයක (ග්‍රාමීය) ප්‍රදේශයක වූ විට රු. 250 ක මාසික බිම් කුළියක් අය කිරීමටත්, පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

11-332/8

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ඝාතක මඩු සඳහා ගාස්තු අය කිරීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා ආනුශාංගික විධිවිධාන පනත යටතේ මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබ, මෙහි පහත දක්වන ලද ගෝ ඝාතකාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා එම වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව 2016 පෙබරවාරි මස 23 වැනි දින අංක 1955/7 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරනු ලැබ ඇත.

එකී ගෝ ඝාතකාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවන්හි ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලය ලැබී ඇති අතර, එම ගෝ ඝාතකාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙහි 3 වැනි උපවගන්තියෙහි විධිවිධාන අනුව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් අනුමැතිය ලබා ඇත. මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභාවක් වන පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2017 දෙසැම්බර් මස 15 වැනි දින අංක 2050 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් නිවේදනයක් නිකුත් කරමින් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව පිළිගෙන ඇත.

ඒ අනුව, මධ්‍යම පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රාදේශීය සභා අතුරු ව්‍යවස්ථා මාලාවේ ගෝ ඝාතකාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තියේ (xi) වැනි උපවගන්තිය යටතේ සම්පාදිත ගෝ ඝාතකාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇත.

(1) මස් වෙළෙඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව මස් වෙළෙඳාම, ප්‍රවාහනය සහ ප්‍රදර්ශනය සඳහා සෑම පුද්ගලයකු විසින් ම මස් වෙළෙඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව 2023 වර්ෂයේ සිට සෑම මසකම පූර්ව ආසන්න මාසය අවසාන වීමට පෙර අදාළ මාසය සඳහා මස් වෙළෙඳාම, ප්‍රවාහනය සහ ප්‍රදර්ශනය කිරීම හා ඝාතනය සඳහා අදාළ ගාස්තු පාතහේවාහැට ප්‍රාදේශීය සභාව වෙත ගෙවා නියමිත බලපත්‍රය ලබාගත යුතු බවටත්,

(2) මෙහි පළමුවන උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් මස් වෙළෙඳාම, ප්‍රවාහනය, ප්‍රදර්ශනය කිරීම හා ඝාතනය II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

උපලේඛනය

අනු. අංකය	*32 වැනි සම්මත අතුරු ව්‍යවස්ථාවේ 15 වගන්තියේ ඡේද*	*I වැනි තීරුව*	*II වැනි තීරුව* *රු. ශත*
1	15 (අ)	මී ගවයෙකු හෝ එළ ගවයෙකු සඳහා ඝාතන අවසර පත්‍ර ගාස්තුව සහ ප්‍රදර්ශන මඩු ගාස්තුව	1,500 0
2	15 (ආ)	මී ගවයකු හෝ එළ ගවයෙකු සඳහා ඝාතක අවසර පත්‍ර ගාස්තුව	1,000 0
3	15 (ඇ)	බැටළුවකු හෝ එළුවෙකු සඳහා ඝාතන අවසර පත්‍ර ගාස්තුව සහ ප්‍රදර්ශන මඩු ගාස්තුව	1,500 0
4	15 (ඈ)	බැටළුවකු හෝ එළුවෙකු සඳහා ඝාතන අවසර පත්‍ර ගාස්තුව	1,000 0
5	15	සභාව සතු ටෙන්ඩර් මස් කඩ කාමර සඳහා මීගවයකු හෝ එළගවයකු ඝාතන අවසර පත්‍ර ගාස්තුව	000 0
6	15	සභාව සතු ටෙන්ඩර් මස් කඩ කාමර සඳහා බැටළුවකු හෝ එළුවෙකු සඳහා ඝාතන අවසර පත්‍ර ගාස්තුව	00 0
7	15 (ඉ)	මී ගවයකු හෝ එළගවයෙකුගේ හෝ එළුවෙකුගේ මළකඳ සහ බොකු ප්‍රවාහනය කිරීමේ අවසර පත්‍ර ගාස්තුව	1,000 0
8	15 (ඊ)	බැටළුවෙකුගේ, එළුවකුගේ, ඌරකුගේ මළකඳ සහ බොකු ප්‍රවාහනය කිරීමේ අවසර පත්‍ර ගාස්තුව	1,000 0
9	15 (උ)	බැටළුවෙකුගේ, එළුවෙකුගේ, ඌරකුගේ මළකඳ සහ බොකු වෙළෙඳපලෙන් පිටත ප්‍රවාහනය කිරීමේ අවසර පත්‍ර ගාස්තුව	1,000 0
10	15	සභාව සතුව ටෙන්ඩර් මස් කඩ කාමර සඳහා බැටළුවෙකුගේ, එළුවෙකුගේ, ඌරකුගේ මළකඳ සහ බොකු ප්‍රවාහනය කිරීමේ අවසර පත්‍ර සඳහා - මාසික	2,500 0

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තු අය කිරීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් 27 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තියේ (අ), (ඇ) සහ (ඈ) යන උපවගන්තිවලින් විස්තර කර ඇති ස්ථාන හා පරිශ්‍රයන් හැර ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි සහ කැලි කසළ බැහැර කිරීමේ සේවාවන් පවත්වාගෙන යන සීමාවන් තුළ පිහිටි සියලුම ස්ථාන හා පරිශ්‍රවලින් ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තුවක් මාසිකව අය කිරීමටත්,

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221 (අ) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 සහ 126 වැනි වගන්තියේ IV උප වගන්තියෙන් පාතහේවාහැට ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ඇති කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා 1988 අගෝස්තු මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ IV (ආ) වැනි කොටසෙහි (පළාත් පාලන) ප්‍රසිද්ධ කරනු ලැබ ඇති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221 (ආ) වගන්තිය සමග කියවිය යුතු පනතේ 122 සහ 126 වගන්තිවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, ඉහත කී (1952 අංක 6 පනත) 2 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තියෙන් කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා පිළිගැනීමට පාතහේවාහැට ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත. ඒ අනුව එම කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව මධ්‍යම පළාතේ පළාත් සභාවේ යෝජනා මගින් සම්මත වූ බව 1990 අප්‍රේල් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 607 දරන *ගැසට් පත්‍රයේ* පැනවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූ පොදු කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා I වැනි හා II වැනි කොටසේ අංක 01 සිට 42 දක්වා වූ අතුරු ව්‍යවස්ථාව 1991 පෙබරවාරි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 635 දරන *ගැසට් පත්‍රයෙන්* පැනවූ නිවේදනය අනුව පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන පරිදි යෝජනා සම්මුතියක් මගින් පිළිගෙන ඇති බවටත්,

3. 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 9 වැනි අතුරු ව්‍යවස්ථාව මත කසළ ශෝධන අතුරු ව්‍යවස්ථාවේ 4 වැනි වගන්තිය අනුව පහත ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තුවක් උපලේඛනයේ, II වැනි තීරුවේ නිරූපිත විෂයට අනුකූලව II වැනි තීරුවේ නිරූපිත අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණයන් අනුව ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තුවක් ප්‍රාදේශීය සභාව විසින් ගණනය කර පනවා අය කිරීමටත්,

4. 2023 වර්ෂයට ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගාස්තුවක් පහත උපලේඛනයේ විස්තර කර ඇති පරිදි ඝණ අපද්‍රව්‍යයේ ස්වභාවය අනුව වාර්ෂිකව නියමිත ගාස්තුව අය කිරීමටත්,

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව තීරණය කරනු ලැබේ.

I උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*	
අනු. අංකය	*බැහැර කරන ඝණ අපද්‍රව්‍යයේ ස්වභාවය*	*වාර්ෂික වටිනාකම රු. 5,000 සිට රු. 10,000 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 10,000ට වැඩි*
		රු. ශත	*රු. ශත*
1	යකඩ (ලෝහමය ඝණ අපද්‍රව්‍ය)	150 0	200 0
2	වීදුරු	150 0	200 0

අනු. අංකය	බැහැර කරන ඝණ අපද්‍රව්‍යයේ ස්වභාවය	I වැනි තීරුව වාර්ෂික වටිනාකම රු. 5,000 සිට රු. 10,000 දක්වා රු. ශත	II වැනි තීරුව වාර්ෂික වටිනාකම රු. 10,000ට වැඩි රු. ශත
3	අබලන් විදුලිමය උපකරණ	150 0	200 0
4	ප්ලාස්ටික්	150 0	200 0
5	පොලිතීන්	150 0	200 0
6	කාඩ්බෝඩ් හෝ කඩදාසි	150 0	200 0
7	දූව සහ දූව ඉරුම් කුඩු	150 0	200 0
8	එළවළු, පලතුරු ඇතුළු කාබනික ද්‍රව්‍ය	150 0	200 0

11-332/10

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා අසාමාන්‍ය රථවාහන ධාවනය නිසා ප්‍රාදේශීය සභාවට දූරීමට සිදුවන වියදම් පියවා ගැනීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 (ආ) වගන්තිය සහ 70 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය අනුව පාතහේවාහැට ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත විෂයට අනුකූලව එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක් අනුව වියදමක් අයකර ගැනීමටත් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

උපලේඛනය

අනු. අංකය	I වැනි තීරුව විස්තරය	II වැනි තීරුව මාසික ගාස්තුව රු. ශත
01	කළුගල් කැණීමේ ස්ථානයක්	1,500 0
02	ගල් ඇඹරුම්හලක් සඳහා	1,000 0
03	තිරුවානා ගල් කැණීමේ ස්ථානයක් සඳහා	2,500 0
04	ලී ඉරුම්හලක් සඳහා	2,000 0
05	ජල විදුලි බලාගාරයක්	10,000 0
06	විදුලි සන්දේශන කුළුණක් සඳහා	10,000 0
07	තිරුවාන කුඩු කිරීම සඳහා	3,000 0
08	වැලි පොලක් පවත්වාගෙන යාම සඳහා	1,500 0
09	පස් ප්‍රවාහනය සඳහා	1,000 0
10	කිරිමැටි ප්‍රවාහනය සඳහා	1,500 0

එහෙත් එක් විදුලි සන්දේශන කුළුණක විදුලි සන්දේශන සේවාවන් එකකට වැඩියෙන් පවත්වාගෙන යන අවස්ථාවක එම සේවා ආයතනයෙන් රුපියල් 3,000ක අතිරේක ගාස්තුවක් අය කිරීමටත් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

තිරුවානා ගල් කැනීම හා විකිණීමේ දී අදාල ආයතන සමග ගිවිසුම් අත්සන් කොට එහි වාර්ෂික ආදායමෙන් 1% ක වාර්ෂික බද්දක් අයකිරීමටත් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරන ලදී.

පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කුඩා විදුලි බලාගාර සඳහා ගාස්තු අයකිරීමේ දී අදාල කුඩා විදුලි බලාගාරය අයත් ආයතනය සමග ගිවිසුම් ගතවීමෙන් අනතුරුව එහි වාර්ෂික ආදායමෙන් 1% ක වාර්ෂික බද්දක් අයකිරීමටත් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරන ලදී.

11-332/11

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ජලය සැපයීමේ ගාස්තු

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 (ආ) සහ 221 වැනි වගන්තියේ ආ වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 හා 126 වැනි වගන්තියේ XIII වැනි උපවගන්තියෙන් පාතහේවාහැට ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ඇති කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා 1988 අගෝස්තු මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටසෙහි (පළාත් පාලන) ප්‍රසිද්ධ කරනු ලැබ ඇති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221 (ආ) වගන්තිය සමග කියවිය යුතු පනතේ 122 සහ 126 වගන්තිවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව ඉහත කී (1952 අංක 6 පනත) 2 වන වගන්තියේ 3 වන උපවගන්තියෙන් කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා පිළිගැනීමට පාතහේවාහැට ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත. ඒ අනුව එම කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව මධ්‍යම පළාතේ පළාත් සභාවේ යෝජනා මගින් සම්මත වූ බව 1990 අප්‍රේල් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 607 දරන *ගැසට් පත්‍රයේ* පැනවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූ පොදු කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා I වැනි හා II වැනි කොටසේ අංක 01 සිට 42 දක්වා වූ අතුරු ව්‍යවස්ථාව 1991 පෙබරවාරි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 635 දරන *ගැසට් පත්‍රයෙන්* පැනවූ නිවේදනය අනුව පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන පරිදි යෝජනා සම්මුතියක් මගින් පිළිගෙන ඇති බවටත්,

2. 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 34 වැනි අතුරු ව්‍යවස්ථාව වන ජල සම්පාදන අතුරු ව්‍යවස්ථාවේ 40 වන වගන්තියේ 1 වැනි උප වගන්තිය අනුව ගෘහ කාර්යයන් සඳහා ජල ගාස්තු අය කිරීමට උපලේඛන අංක 01 හි දැක්වෙන පිළිවෙල අනුව ජල ගාස්තු අය කිරීමටත්, I වැනි තීරුවේ යම් විෂයාංකයක් සීමාව ඇතුළත පවත්නා අවස්ථාවක

එකී II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයට ජල ගාස්තුවක් 2023 වර්ෂයට පනවා අය කිරීමටත්, උපලේඛනයේ III වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණය අනුව ජල සේවා ගාස්තුවක් අය කිරීමටත්, ජල මනු සවිකර නොමැති පෞද්ගලික ජල සම්බන්ධතාවයක් සඳහා මාසිකව නේවාසික රු. 350ක් සහ ව්‍යාපාරික රු. 800ක ස්ථාවර ජල ගාස්තුවක් අය කිරීමටත් හා ජල මනුව අක්‍රිය වී ඇති පෞද්ගලික ජල සම්බන්ධතාවයක් සඳහා මාසිකව රු. 500 ක ස්ථාවර ජල ගාස්තුවක් අය කිරීමටත්,

3. 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 40 වන වගන්තියේ II වැනි උපවගන්තිය අනුව ගෘහ කාර්යයන් නොවන පෞද්ගලික ජල සම්බන්ධතා සඳහා II වැනි උපලේඛන පිළිවෙල අනුව I වැනි තීරුවේ යම් විෂයාංකයක සීමාව ඇතුළත පවත්නා අවස්ථාවක II වන තීරුවෙහි අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණය අනුව ජල ගාස්තුව 2023 වර්ෂයට පනවා අය කිරීමටත් එකී II වැනි උපලේඛනයේ III වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණය අනුව ජල සේවා ගාස්තුවක් අය කිරීමටත්, ජල මනු සවිකර නොමැති ගෘහ කාර්යයන් සඳහා හෝ ජල මනු අක්‍රීය වී ඇති ගෘහ කාර්යයන් සඳහා නොවන ජල සම්බන්ධතාවයක් සඳහා හෝ මාසික රු. 500ක ස්ථාවර ජල ගාස්තුවක් අය කිරීමටත්,

4. 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත වන 40 වන අතුරු ව්‍යවස්ථාව වන ජල සම්පාදන අතුරු ව්‍යවස්ථාව විධිවිධාන අනුව පාතහේවාහැට ප්‍රාදේශීය සභාව ජල සේවාවන්ට සම්බන්ධ අනෙකුත් කාර්යයන් සඳහා උපලේඛන අංක 03 හි දැක්වෙන පිළිවෙල අනුව ජල සේවා ගාස්තු අය කිරීමටත් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

I වන උපලේඛනය

ගෘහ කාර්යයන් සඳහා ජල ගාස්තු

I වැනි තීරුව	*II වැනි තීරුව*	*III වැනි තීරුව*
මාසික පරිභෝජන ජල ඒකක සංඛ්‍යාව	*ඒකකයක් සඳහා පරිහරණ ගාස්තු සේවා ගාස්තු (5X12=60)*	*සේවා ගාස්තුව*
	රු. ශත	*රු. ශත*
00-05	12 0	140 0
06-10	15 0	210 0
11-15	20 0	210 0
16-20	30 0	210 0
21-25	35 0	350 0
26-30	45 0	350 0
31-40	60 0	420 0
41-50	70 0	420 0
51-75	75 0	700 0
75ට වැඩි	100 0	1,120 0

II වන උපලේඛනය

ගෘහ කාර්යයන් හැර වෙනත් කාර්යයන් සඳහා ජලය සැපයීමේ ගාස්තු

I වැනි තීරුව	*II වැනි තීරුව*	*III වැනි තීරුව*
මාසික පරිභෝජන ජල ඒකක සංඛ්‍යාව	*ඒකකයක් සඳහා පරිහරණ ගාස්තු සේවා ගාස්තු*	*සේවා ගාස්තුව*
	රු. ශත	*රු. ශත*
00-05	15 0	280 0
06-10	17 0	280 0
11-15	25 0	320 0
16-20	36 0	320 0
21-25	60 0	480 0
26-30	90 0	480 0
31-40	120 0	800 0
41-50	140 0	960 0
51-75	150 0	1,280 0

III වන උපලේඛනය

1. ජල සේවා සැපයීමට අදාළ ගාස්තු

I. පානීය ජල සැපයුම් ගාස්තු (ප්‍රධාන සැපයුම් නළයේ සිට ඇති දුර අනුව) :

නේවාසික	
0 - 50m	- රු. 19,000 0
50 - 75m	- රු. 22,000 0
75 - 100m	- රු. 25,000 0
ව්‍යාපාරික	
0-100m	- රු. 21,000 0

I. ජල සැපයුම් සඳහා ඇප තැන්පත්	- රු. 1,000 0
II. විසන්ධි කළ ජල සැපයුම් නැවත සන්ධි කිරීම	- රු. 1,000 0
III. ජල ලේඛනයේ නම වෙනස් කර ගැනීම	- රු. 750 0
IV. ජල ඉල්ලුම් පත්‍ර	- රු. 200 0
V. ජල සැපයුම් මාර්ගය වෙනස්කර ගැනීම	- රු. 500 0

2. 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 40 වන අතුරු ව්‍යවස්ථාව වන ජල සම්පාදන අතුරු ව්‍යවස්ථාවෙහි 35 වැනි වගන්තිය අනුව කාර්තුවක් පාසා ජල ගාස්තු ගෙවිය යුතු බවටත්, පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

උයන්වත්ත හා මුරපොළ ජල පොම්පාගාර මගින් මෝටර් කර ජලය ලබාදෙන ජල පාරිභෝගිකයින් සඳහා පහත පරිදි ගාස්තු අය කිරීමට පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

අනු අංක	*බිල්පත් වර්ගය*		*මිල රු.*
01	ජල මනු සවිකර නොමැති පෞද්ගලික ජල සම්බන්ධතාවක් සඳහා මාසික නේවාසික ස්ථාවර ගාස්තු		400 0
02	ජල මනු සවිකර නොමැති පෞද්ගලික ජල සම්බන්ධතාවක් සඳහා මාසික ව්‍යාපාරික ස්ථාවර ගාස්තු/රාජ්‍ය ආයතන		850 0
03	ජල මනු අක්‍රිය වී ඇති පෞද්ගලික ජල සම්බන්ධතාවයක් සඳහා මාසික ගාස්තු		600 0
04	ගෘහ කාර්යයන් සඳහා ජල ඒකක ගාස්තු (නේවාසික)		
	මාසික පරිභෝජන ජල ඒකක සංඛ්‍යාව රු. ශත	ඒකක සඳහා පරිහරණ ගාස්තු රු. ශත	සේවා ගාස්තු රු. ශත
	00-05	20 0	165 0
	06-10	25 0	250 0
	11-15	35 0	250 0
	16-20	50 0	250 0
	21-25	58 0	410 0
	26-30	750	410 0
	31-40	100 0	500 0
	41-50	115 0	500 0
	51-75	120 0	825 0
	75ට වැඩි	165 0	1320 0

05	ගෘහ නෙවන කාර්යයන් සඳහා ජල ඒකක ගාස්තු (ව්‍යාපාරික)		
	මාසික පරිභෝජන ජල ඒකක සංඛ්‍යාව රු. ශත	ඒකක සඳහා පරිහරණ ගාස්තු රු. ශත	සේවා ගාස්තු රු. ශත
	00-05	25 0	300 0
	06-10	30 0	300 0
	11-15	40 0	340 0
	16-20	60 0	340 0
	21-25	100 0	510 0
	26-30	155 0	510 0
	31-40	120 0	800 0
	41-50	200 0	850 0
	51-75	255 0	1,360 0
	75ට වැඩි	340 0	2,550 0

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව සතු ලීටර් 6,000 ජල බවුසරය හා ලීටර් 4,000 ජල බවුසරය මා ඔය සිට තලාතු ඔය සහ ගලහා සිට තලාතුඔය දක්වා ජල ප්‍රවාහනය කිරීම සඳහා පහත පරිදි ගාස්තු සංශෝධනය කර අයකිරීමටත් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

ජලය ලීටර් ප්‍රමාණය 6,000	මා ඔය සිට තලාතුඔය ගලහා සිට තලාතුඔය	රු. 6,900 0	වැඩිවන කි.මී.1 සිට කි. මී. 3 දක්වා	කි.මී. 3 සිට කි. මී. 5 දක්වා	කි.මී. 5 සිට කි. මී. 8 දක්වා
			රු. 300 0	ර. 600 0	ර. 1,000 0
ජලය ලීටර් ප්‍රමාණය 4,000	මා ඔය සිට තලාතුඔය ගලහා සිට තලාතුඔය	රු. 5,750 0	වැඩිවන කි.මී.1 සිට කි. මී. 3 දක්වා	කි.මී. 3 සිට කි. මී. 5 දක්වා	කි.මී. 5 සිට කි. මී. 8 දක්වා
			රු. 870 0	ර. 1,450 0	ර. 2,300 0

11-332/12

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ත්‍රිරෝද රථ නවතා තැබීම පිළිබඳ ගාස්තු අය කිරීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේදී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා ආනුශාංගික විධිවිධාන පනත යටතේ මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබ මෙහි පහත දක්වන ලද ත්‍රිරෝද රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා එම වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව 2016 පෙබරවාරි මස 23 වැනි දින අංක 1955/7 *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරනු ලැබ ඇත.

එකී ත්‍රිරෝද රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවන් හි ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට බලය ලැබී ඇති අතර, එම ත්‍රිරෝද රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙහි 3 වැනි උපවගන්තියෙහි විධිවිධාන අනුව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් අනුමැතිය ලබා ඇත. මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභාවක්වන පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2017 දෙසැම්බර් මස 15 වැනි දින අංක 2050 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය* මගින් නිවේදනයක් නිකුත් කරමින් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව පිළිගෙන ඇත.

ඒ අනුව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රාදේශීය සභා අතුරු ව්‍යවස්ථා 2016.02.23 වැනි දින හා අංක 1955/7 *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති එම *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථා මාලාවේ ත්‍රිරෝද රථ නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථාවේ 4 (IV) අනුව එක් එක් ත්‍රිරෝද රථ නැවතුම්පලෙහි නවතා තැබීම සඳහා බලපත්‍ර ලබාදෙන උපරිම ත්‍රිරෝද රථ පිළිබඳව දෙවන උපලේඛනයේ සඳහන් වේ. මෙය පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

ත්‍රිරෝද රථ වාහන නවතා තැබීමේ ගාස්තු

පළමුවන උපලේඛනය

I තීරුව	*II තීරුව*
01. ත්‍රිරෝද රථයක් සඳහා	රු. 1,800 0 (වාර්ෂිකව)

ත්‍රිරෝද රථ වාහන නවතා තැබීමේ ගාස්තු

දෙවන උපලේඛනය

නැවතුම් පලේ අංකය	*ත්‍රිරෝද රථ නැවතුම්පලෙහි නම*	*අනුමත ත්‍රිරෝද රථ සංඛ්‍යාව*
1	අම්පිටිය, තලාතුඔය මාර්ගයේ තලාතුඔය බස් නැවතුම ඉදිරිපිට දකුණුපස දිගින් අඩි 100ක්	35
2	තලාතුඔය, ගුරුදෙණිය මාර්ගයේ ප්‍රාදේශීය කාර්යාලයට ප්‍රවිෂ්ඨ මාර්ගයේ සිට තලාතුඔය නගරය දෙසට දික් අඩි 150ක්	50
3	තලාතුඔය, මාරස්සන මාර්ගයේ තලාතුඔය මාරස්සන විවිධ සේවා සමුපකාර සමිතිය ඉදිරිපිට වම්පස දිගින් අඩි 150ක්	20
4	කදාකුල බෝධිය ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ සිට පින්නගොල්ල මාර්ගයේ දිගින් අඩි 75ක්	15

නැවතුම් පලේ අංකය	*ත්‍රිරෝද රථ නැවතුම්පලෙහි නම*	*අනුමත ත්‍රිරෝද රථ සංඛ්‍යාව*
5	තලාතුඔය මාරස්සන මාර්ගයේ මුදුණකඩේ හන්දිය ප්‍රාදේශීය සභා උපකාර්යාලයට ප්‍රවිෂ්ට මාර්ගයේ සිට ඉදිරියට දිගින් අඩි 05ක්	05
6	තලාතුඔය මාරස්සන මාර්ගයේ බව්ලාන මාර්ගය ආරම්භක හන්දියේ දකුණුපස දිගින් අඩි 50ක්	25
7	තලාතුඔය කන්ද හන්දිය මාර්ගයේ රජ මාවත සන්ධි වන කිවුල්ලිද හන්දිය දකුණුපස දිගින් අඩි 75ක්	25
8	තලාතුඔය මාරස්සන මාර්ගයේ වෙලේගම්මැද්ද හන්දිය දකණුපස දිගින් අඩි 50ක්	10
9	මාරස්සන ප්‍රධාන නගරය සිට කන්දේවෙල මාර්ගය ආරම්භක හන්දියේ වම්පස දිගින් අඩි 60ක්	25
10	මාරස්සන අම්බලම ඉදිරිපිට දිගින් අඩි 50ක්	10
11	මාරස්සන පස්ගම හන්දිය ඉදිරිපිට දිගින් අඩි 50ක්	25
12	මාරස්සන පස්ගම මාර්ගයේ වම්පස හේවාවිස්ස ගොන්නගහමුල ක්‍රීඩාගාරය ඉදිරිපිට දිගින් අඩි 60ක්	05
13	මාරස්සන පස්ගම මාර්ගයේ වම්පස බව්ලාන හන්දියේ සිට මාරස්සන දෙසට දිගින් අඩි 60ක්	05
14	පස්ගම හන්දිය නාථ දේවාලයට ප්‍රවිෂ්ට මාර්ගයේ සිට මාරස්සන දෙසට දිගින් අඩි 75ක්	10
15	මාරස්සන නගරයේ ගොවිජන කේන්ද්‍රයට ප්‍රවිෂ්ට මාර්ගයේ සිට ඉදිරිපිට දිගින් අඩි 100ක්	30
16	මාරස්සන කොළඹිස්ස මාර්ගයේ කන්ද හන්දිය මොරගහමුල හන්දිය දකුණුපස දිගිල් අඩි 75ක්	05
17	කන්දහන්දිය කොළඹිස්ස මාර්ගයේ උඩුදෙණිය මුස්ලිම් විද්‍යාලයට ප්‍රවිශ්ට හන්දියේ දකුණුපස දිගින් අඩි 30ක්	05
18	කන්දහන්දිය කොළඹිස්ස මාර්ගයේ වම්පස දෙහල්කඩ හන්දියේ සිට ඉදිරියට දිගින් අඩි 50ක්	05
19	දෙහල්කඩ කහඹිලියාව මාර්ගය ආරම්භයේ සිට වම්පස දිගින් අඩි 60ක්	05
20	කන්දහන්දිය කොළඹිස්ස මාර්ගයේ පොත්ගොඩ හන්දිය වම්පස විශාඛා වෙළඳ සල ඉදිරිපිට දිගින් අඩි 75ක්	15
21	කන්දහන්දිය කොළඹිස්ස මාර්ගය නීලවල හන්දිය වම්පස දිගින් අඩි 50ක්	05
22	කන්දහන්දිය කොළඹිස්ස මාර්ගයේ මුරපොල හන්දිය දකුණුපස දිගින් අඩි 100ක්	05
23	කොළඹිස්ස හන්දියේ බස් නැවතුම්පල ඉදිරිපිට දිගින් අඩි 75ක්	20
24	කොළඹිස්ස දෙල්තොට මාර්ගයේ එනසල්ගොල්ල විද්‍යාලය හන්දිය වම්පසින් දිගින් අඩි 100ක්	05
25	උඩුදෙණිය බෝපිටිය හන්දිය ඉදිරිපිට දිගින් අඩි 100ක්	10
26	උඩුදෙණිය ප්‍රධාන මාර්ගයේ සිට දෙහල්කඩ මාර්ගයට හැරෙන හන්දියේ සිට ඉදිරියට දෙහල්කඩ දෙසට දිගින් අඩි 30ක්	05
27	මයිලපිටිය ගල්ලිඳ හන්දිය පැරණි මාර්ගයේ පාලම අසල සිට නගරය දෙසට දිගින් අඩි 150ක්	20
28	මයිලපිටිය මහා විද්‍යාලයට ප්‍රවිෂ්ට මාර්ගයේ සිට නගරය දෙසට දිගින් අඩි 50ක්	05
29	කන්දහන්දිය අධිකාරිගම මාර්ගයේ වටරවුම සැතපුම් පුවරුවේ සිට හඟුරන්කෙත දෙසට දිගින් අඩි 100ක්	20
30	කන්දහන්දිය අධිකාරිගම මාර්ගයේ දකුණුපස පල්ලේමාඔය පාලමේ සිට කන්දහන්දිය දිගින් අඩි 60ක්	10
31	හඟුරන්කෙත ප්‍රධාන මාර්ගයේ සිට කන්දහන්දිය මාරස්සන මාර්ගය ආරම්භයේ වම්පස දිගින් අඩි 150ක්	30
32	කන්දහන්දිය හඟුරන්කෙත මාර්ගයේ වම්පස මාඔය පාලම සිට කන්දහන්දිය දෙසට දිගින් අඩි 30ක්	05
33	කන්දහන්දිය හඟුරන්කෙත මාර්ගයේ වම්පස උනුවින්න කනත්ත අසල බස් නැවතුම් ඉදිරිපිට දිගින් අඩි 50ක්	05
34	බව්ලාන බස් නැවතුම් ඉදිරිපිට දිගින් අඩි 30ක්	10
35	තලාතුඔය මොරගොල්ල මාර්ගයේ අංකෙලිපිටිය හන්දිය වම්පස මඩිත්ත මාර්ගය ආරම්භයේ සිට තලාතුඔය දෙසට දිගින් අඩි 30ක්	10

නැවතුම් පලේ අංකය	*ත්‍රිරෝද රථ නැවතුම්පලෙහි නම*	*අනුමත ත්‍රිරෝද රථ සංඛ්‍යාව*
36	තලාතුඔය මොරගොල්ල මාර්ගයේ මහ වංගුව බුදු පිළිමය අසල සිට ඉදිරිපිට දිගින් අඩි 60ක්	10
37	තලාතුඔය මොරගොල්ල මාර්ගයේ මොරගොල්ල හන්දිය වම්පස බෝක්කුවේ සිට ඉදිරියට දිගින් අඩි 120ක්	10
38	මොරගොල්ල බෙල්වුඩ් හන්දිය කිරිමැටිය අතුරු මාර්ගය ආරම්භයේ සිට ගලහ දෙසට දිගින් අඩි 100ක්	20
39	මහනුවර ගලහ ප්‍රධාන මාර්ගයේ වම්පස බෙල්වුඩ් මාර්ගය ආරම්භයේ සිට ගලහ දෙසට දිගින් අඩි 30ක්	15
40	මහනුවර ගලහ ප්‍රධාන මාර්ගයේ දකුණුපස ගලහ අන්නාසිවත්ත මාර්ගයේ සිට ප්‍රාදේශීය සභා පුස්තකාලය ඉදිරිපිට දිගින් අඩි	25
41	ගලහ පුපුරැස්ස පාර	25
42	ගලහ ප්‍රධාන වීදියේ අරේකරේ මාර්ගයේ ආරම්භයේ සිට දෙල්තොට දෙසට දිගින් අඩි 150ක්	40
43	ගලහ දෙල්තොට මාර්ගයේ වම්පස ලංකා බැංකුව ඉදිරිපිට දිගින් අඩි 40ක්	05
44	දෙල්තොට හේවාහැට පාර ගබඩාගම හන්දියේ සිට නගරය දෙසට දිගින් අඩි 50ක්	40
45	දෙල්තොට ගලහ මාර්ගයේ හේවාහැට හන්දියේ සිට නගරය දෙසට වම්පස දිගින් අඩි 75ක්	40
46	දෙල්තොට ප්‍රධාන වීදියේ ප්‍රාදේශීය සභා පොදු වෙළඳපල භූමියට ප්‍රවිෂ්ට මාර්ගයේ සිට කරගස්කඩ විද්‍යාලය දිගින් අඩි 100ක්	60
47	දෙල්තොට බෝපිටිය මාර්ගයේ කරගස්කඩ විද්‍යාලයට ප්‍රවිෂ්ට මාර්ගයේ සිට නගරය දෙසට දිගින් අඩි 75ක්	35
48	වතුලියද්ද වැවේ කඩේ පාර ආරම්භක හන්දියේ ගාල්තැන්න දෙසට දකුණුපස අඩි 50ක්	10
49	ගාල්තැන්න පාර බෝගහලන්ද හන්දියේ වම්පස අඩි 50ක්	05
50	මොනරංගල රෝහල ඉදිරිපට නැවතුම්පල	10
51	ගාල්තැන්න පාර තලපිටිය හන්දිය වම්පස අඩි 50ක්	10
52	ගාල්තැන්න ගොවිසෙවන ඉදිරිපිට ප්‍රාදේශීය සභා මාවතෙන් දකුණුපස අඩි 100ක්	10
53	ගාල්තැන්න මාර්ගයේ ලුණුවැල්ල හන්දිය වම්පස අඩි 100ක්	10
54	රටේමුල්ල ග්‍රාමීය බැංකුව ඉදිරිපිට දකුණුපස අඩි 50ක්	10
55	වැල්දඹල හන්දිය ඇතුල්ගම දෙසට වම්පස අඩි 100ක්	10
56	පූලියද්ද හන්දයේ සිට ඇතුල්ගම දෙසට වම්පස අඩි 100ක්	10
57	කොටබෝගල හන්දියේ සිට රටේමුල්ල දෙසට වම්වස අඩි 150ක්	10
58	ඇතුල්ගම මහකඩේ ඉදිරිපිට රටේමුල්ල දෙසට වම්වස අඩි 50ක්	20
59	එලමල්දෙණිය හන්දියේ සිට පනන්වල දෙසට අඩි 50ක්	10
60	පනන්වල හන්දියේ සිට අංකෙලිපිටිය දෙසට අඩි 100ක්	15
61	නැහිනිවල පාලම අසල සිට මහනුවර දෙසට මී. 50ක්	15
62	ගලහ පොදු වෙළඳපොල ඉදිරිපිට	20
63	දංගමුව හන්දියේ සිට උඩුදෙණිය පාර	10
64	අතුරගම හන්දිය	15
65	බෝපිටිය නගරය වනහපුව හන්දිය	05
66	වාඩියගොඩ බස් නැවතුම්පල අසළ	05
67	මා උස්සාව හන්දිය	05
68	ලූල් කඳුර සමුපකාරය ඉදිරිපිට	10

නැවතුම් පලේ අංකය	*ත්‍රිරෝද රථ නැවතුම්පලෙහි නම*	*අනුමත ත්‍රිරෝද රථ සංඛ්‍යාව*
69	පල්ලේගම ග්‍රාමීය බැංකුව ඉදිරිපිට	05
70	දෙල්තොට නාරංහින්න පරණ රෝහල ඉදිරිපිට	15
71	හන්තාන 04 කණුව කෝවිල අසල	05
72	හන්තාන 04 කණුව එඩරුමැටිය හවන්දිය අසල	05
73	දමුණුගොල්ල පොදු ළිඳ අසල	05
74	ගලහ හන්දිය	17
75	තලාතුඔය නුවර පාරේ 5 කණුව හන්දිය දිගින් අඩි 50ක්	10
76	තලාතුඔය මාරස්සන මාර්ගයේ දූල්මුරේ හන්දිය (පන්සල් හංදිය) දිගින් අඩි 50	10
77	උඩුදෙණිය පාර දෙමලාතොට හන්දිය දිගින් අඩි 50ක්	10
78	කන්දහන්දිය මාරස්සන මාර්ගයේ නිලවල කොළඹිස්ස හන්දිය දිගින් අඩි 50ක්	10
79	ග්‍රේට්වැලි නිවාස 30 වතුයාය ගේට්ටුව අසල	10

11-332/13

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

කුළී රථ නවතා තැබීම පිළිබඳ ගාස්තු අය කිරීම - 2023 වර්ෂය

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේදී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා ආනුශාංගික විධිවිධාන පනත යටතේ මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබ මෙහි පහත දක්වන ලද කුළී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා එම වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව 2016 පෙබරවාරි මස 23 වැනි දින අංක 1955/7 *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරනු ලැබ ඇත.

එකී කුළී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවන් හි ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට බලය ලැබී ඇති අතර, එම කුළී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු

ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙහි 3 වැනි උපවගන්තියෙහි විධිවිධාන අනුව මධ්‍යම පළාත් සභාව විසින් අනුමැතිය ලබා ඇත. මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභාවක් වන පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2017 දෙසැම්බර් මස 15 වැනි දින අංක 2050 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් නිවේදනයක් නිකුත් කරමින් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව පිළිගෙන ඇත.

ඒ අනුව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රාදේශීය සභා අතුරු ව්‍යවස්ථා 2016.02.23 වැනි දින හා අංක 1955/7 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථා මාලාවේ ත්‍රිරෝද රථ නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථාවේ 4 (IV) අනුව එක් එක් ත්‍රිරෝද රථ නැවතුම්පලෙහි නවතා තැබීම සඳහා බලපත්‍ර ලබාදෙන උපරිම කුළී රථ පිළිබඳව දෙවන උපලේඛනයේ සඳහන් වේ.

මෙය පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

I වැනි උපලේඛනය

අනු. අංකය	*කුළී රථ වර්ගය*	*වාර්ෂික ගාස්තුව රු. ශත*
01.	මෝටර් රථයක් සඳහා	3,600 0
02.	වෑන් රථයක් සඳහා	3,600 0
03.	ලොරි රථයක් සඳහා	6,000 0
04.	බස් රථයක් සඳහා	6,000 0
05.	වෙනත් බර වාහනයක් සඳහා	6,600 0

II වැනි උපලේඛනය

අනු. අංකය	*නැවතුම්පලේ නම*	*කුළීරථ සංඛ්‍යාව*
01.	ගලහ පොදු වෙළෙඳපොල භූමිය	20
02.	දෙල්තොට පොදු වෙළෙඳපොල භූමිය	25
03.	දෙල්තොට සමූපාකාරය අසල භූමිය	10
04.	ගලහ පුෂ්පදාන විදුහල අසල භූමිය	10

11-332/14

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සතිපොළ ගාස්තු අයකිරීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින දී,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා ආනුශාංගික විධිවිධාන පනත යටතේ මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබ මෙහි පහත දක්වන ලද ප්‍රාදේශීය සභා පොළ පිළිබඳ ගාස්තු පැනවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා එම වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව 2016 පෙබරවාරි මස 23 වැනි දින අංක 1955/7 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරනු ලැබ ඇත.

එකී සති පොළ පුවරු ගාස්තු පැනවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවන්හි ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලය ලැබී ඇති අතර, එම සතිපොළ ගාස්තු පැනවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙහි 3 වැනි උපවගන්තියෙහි විධිවිධාන අනුව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් අනුමැතිය ලබා ඇත. මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභාවක්වන පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2017 දෙසැම්බර් මස 15 වැනි දින අංක 2050 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් නිවේදනයක් නිකුත් කරමින් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව පිළිගෙන ඇත.

ඒ අනුව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රාදේශීය සභා අතුරු ව්‍යවස්ථා මාලාවේ සතිපොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තියේ (xxii) වැනි වගන්තිය යටතේ සම්පාදිත ප්‍රාදේශීය සභා සතිපොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පාතහේවාහැට ප්‍රදේශීය සභාව විසින් පිළිගෙන ඇත.

සතිපොළ ගාස්තු සතිපොළ පැවැත්වෙන දිනයේ මධ්‍යාහ්නට හෝ ඊට පෙර පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් පත්කර ඇති නිලධාරියාට, සේවකයෙකුට හෝ ප්‍රාදේශීය සභාවේ නිලධාරියෙකුට හෝ නියෝජිතයෙකුට ගෙවිය යුතු බව නිවේදනය කරන ලදී.

මෙහි පළමුවන උපලේඛනයේ පළමුවන තීරුවේ සඳහන් කිසියම් වෙළෙඳාමක් වෙනුවෙන් දෙවන තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීම.

අනු. අංකය	*විස්තරය*	*සතිපොළ ගාස්තු දෛනික පිරිවැටුම*							
		සිට (රු.)	*දක්වා (රු.)*	*ගාස්තුව (රු.)*	*සිට (රු.)*	*දක්වා (රු.)*	*ගාස්තුව (රු.)*	*වැඩි (රු.)*	*ගාස්තුව (රු.)*
01	එළවළු	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0
02	පලතුරු	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0
03	සිල්ලර බඩු	5,000 0	10,000 0	50 0	10,000 0	20,000 0	100 0	20,000 0	250 0
04	රෙදිපිළි	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0
05	මාළු හා කරවල	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0
06	විසිතුරු පැළ වර්ග	2,500 0	5,000 0	50 0	5.000 0	10,000 0	100 0	10,000 0	250 0
07	ගෘහ උපකරණ	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0
08	කෘෂි උපකරණ	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0
09	ප්ලාස්ටික් බඩු	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0
10	වෙනත්	2,500 0	5,000 0	50 0	5,000 0	10,000 0	100 0	10,000 0	250 0

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට සේවාවන් සඳහා ගාස්තු අය කිරීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින දී,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් සම්පාදනය කරන ලද ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාව 2016.02.23 වැනි දින හා අංක 1955/7 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති එම *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථා මාලාවේ සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව පහත සඳහන් සේවාවන් සඳහා අය කිරීමටත් පහත උපලේඛනයේ උපලේඛන අංක 01 හි I වැනි තීරුවේ යම් විෂයාංකයක සීමාව ඇතුළත පවත්නා අවස්ථාවක II වැනි තීරුවෙහි අනුරූප සටහනෙයි නිරූපිත අනු ප්‍රමාණය අනුව සේවා ගාස්තුවක් අය කිරීමටත්,

1 වැනි තීරුව		*11 වැනි තීරුව*
		රු. ශත
1. වරිපනම් ලිපි නිකුත් කිරීම සඳහා	-	500 0
2. වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීමේ හා ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු	-	1,000 0
3. විදුලි ලිපි නිකුත් කිරීම සඳහා	-	500 0
4. ගිවිසුම් පතක්	-	100 0
5. මිණුම්පත් සහ බිල්පත් (කට්ටලයක්)	-	100 0
6. පරිසර බලපත්‍ර අයදුම්පත්‍ර ගාස්තුව (නව)	-	500 0
7. පරිසර බලපත්‍ර අයදුම්පත් ගාස්තුව (අලුත් කිරීම)	-	100 0
8. ගොඩනැගිලි අයදුම්පත්	-	1,000 0
9. වීථිරේඛා සහ නොපවරා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තුව රු. 500ක් වන අතර එම ගාස්තුව පර්චස් 15ක් සඳහා අයකරනු ලැබේ. එසේම තව දුරටත් එකී සහතිකය ඉල්ලා සිටිනු ලබන ඉඩමේ ප්‍රමාණය පර්චස් 15කට වැඩිවන අවස්ථාවක වැඩිවන සෑම පර්චස් 10ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 25ක ගාස්තුවක් අය කිරීම		
10. අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා අයඳුම්පත්	-	300 0
11. වෙළෙඳ බලපත්‍ර අයඳුම්පත්	-	100 0
12. භූමි පර්යේෂණ ඉල්ලුම් පත්‍රය	-	50 0
13. වෙනත් ලිපි නිකුත් කිරීම	-	300 0
14. කඩකුලී ගිවිසුමේ නම වෙනස් කිරීම	-	2,000 0
15. ලේඛන සෙවීමේ ගාස්තු එක් වසරක් සඳහා රු. 25ක් ද, එක් පිටුවක් සඳහා රු. 20ක ගාස්තුවක් ද අය කිරීම		
16. ලේඛන පිටපත් කිරීම පිටපත් 01ක් සඳහා	-	50 0
17. අතිරේක තක්සේරු දැන්වීම් පිටපතක් සඳහා	-	25 0
18. ත්‍රීරෝද රථ අයදුම්පත්	-	100 0

19. තාවකාලික අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා භූමිය වෙන් කර දීමේ ගාස්තු :

අනු. අංකය	*භූමි වර්ග අඩි ප්‍රමාණය*	*දිනකට ගාස්තුව රු. ශත*
01	වර්ග අඩි 25 උපරිමය දක්වා	500 0
02	වර්ග අඩි 25-50 දක්වා	750 0
03	වර්ග අඩි 50-75	රු. 1,000 0 ව. අඩි. 75ට වැඩිවන සෑම ව. අඩියක් සඳහා රු. 25 0

අය කිරීමටත් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරනු ලැබේ.

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් ගොඩනැගිලි අයදුම් පත්‍රයක් නිකුත් කිරීමෙන් පසුව නිකුත් කරන ලද පහත අයදුම්පත්‍ර සඳහා පහත පරිදි ගාස්තු අයකිරීමට පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරන ලදී.

අ/ අ	*විස්තරය*	*ගාස්තුව රු. ශත*
01	බලපත්‍ර කාලය දීර්ඝ කිරීම සඳහාවන අයදුම්පත්‍රය	100 0
02	අනුකූලතා සහතික සඳහා වන අයදුම්පත්‍රය	200 0
03	ඉඩම් අනුබෙදීම/ඒකාබද්ධ කිරීම සහ සංවර්ධනය සඳහා අයදුම්පත්‍රය	300 0

11-332/16

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට පුස්තකාල සේවාවන් සඳහා ගාස්තු අය කිරීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින දී,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා ආනුශාංගික විධිවිධාන පනත යටතේ මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබ මෙහි පහත දක්වන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා එම වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව 2016 පෙබරවාරි මස 23 වැනි දින අංක 1955/7 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරනු ලැබ ඇත.

එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවන් හි ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට බලය ලැබී ඇති අතර, එම කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙහි 3 වැනි උපවගන්තියෙහි විධිවිධාන අනුව මධ්‍යම පළාත්, පළාත් සභාව විසින් අනුමැතිය ලබා ඇත. මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභාවක්වන පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2017 දෙසැම්බර් මස 15 වැනි දින අංක 2050 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් නිවේදනයක් නිකුත් කරමින් පාතහේවාහැට ප්‍රාදේශීය සභාව පිළිගෙන ඇත.

ඒ අනුව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රාදේශීය සභා අතුරු ව්‍යවස්ථා 2016.02.23 වැනි දින හා අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති, එම *ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත්කර ඇති 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 36 වැනි අතුරු ව්‍යවස්ථාවේ පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙන් සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තිය අනුව පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් නිරූපිත විෂයට අනුරූපව II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණයෙන් අනුව 2023 වර්ෂයේ පුස්තකාල සේවා ගාස්තු පනවා අය කිරීමටත් යෝජනා කරනු ලැබේ.

අනු. අංකය	*ගාස්තුව*	*මුදල* *රු. ශත*
1	සාමාජික අයදුම්පත් ගාස්තු	10 0
2	ඇප තැන්පත් ගාස්තු	100 0
3	සාමාජික ගාස්තුව	40 0
4	සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුව	40 0 (වර්ෂිකව)
5	පොත් ආපසු භාරදීමේ ප්‍රමාද ගාස්තුව	5 0 (දිනකට)
6	පාඨකයා ලබා ගත් පොතක් නැතිවීමේ දී ගෙවිය යුතු ගාස්තුව	පොතේ වටිනාකම සහ 40% දෙපාර්තමේන්තු ගාස්තු

11 - 332/17

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා විනෝද බඳු අය කිරීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින දී,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

267 වැනි අධිකාරය විනෝද බඳු ආඥාපනතේ කාර්යය සඳහා අදාළ වන කිසියම් විනෝද කටයුත්තක් පාතහේවාහැට සභා බල ප්‍රදේශය තුළ සිදුකරන සෑම තැනැත්තෙකුගෙන් එම විනෝද කටයුත්ත,

(අ) සිනමා දර්ශනයක් වන විට ඒ සඳහා ඇතුළත් කරගන්නා තැනැත්තන්ගෙන් අයකර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට 25%ක ප්‍රමාණයට සමාන මුදලක් ; සහ,

(ආ) වෙනත් විනෝද කාර්යයක් වන විට ඒ සඳහා ඇතුළත් කරගන්නා තැනැත්තන්ගෙන් අයකර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට 12.5%ක ප්‍රමාණයට සමාන මුදලක් ද,

ඉහත කී විනෝද බඳු ආඥාපනතේ 2 වැනි වගන්තියෙන් පළාත් පාලන ආයතනවලට ලැබී ඇති බලතල ප්‍රකාර, විනෝද බද්ද වශයෙන් පනවා අයකර ගත යුතු යයි පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරයි.

11-332/18

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ආදාහනාගාර ගාස්තු පැනවීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින දී,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

මධ්‍යම පළාත් සභාව විසින් සම්පාදනය කරන ලද ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාව 2016.02.23 දිනැති හා අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථා මාලාවේ ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 2 වැනි වගන්තිය අනුව පහත සඳහන් ආදාහනාගාර ගාස්තු අය කිරීමටත්, පහත උපලේඛනයේ උපලේඛන අංක 01 හි I වැනි තීරුවේ යම් විෂයාංකයක සීමාව ඇතුළත පවත්නා අවස්ථාවක II වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණය අනුව සේවා ගාස්තුවක් අය කිරීමටත්, පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරයි.

අනු. අංකය	*විස්තරය*	*ගාස්තුව රු. ශත*
01	පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකුගේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා	13,000 0
02	පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු නොවන අයෙකුගේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා	15,000 0

11-332/19

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ගවමස් එළුමස් හා මාළු අලෙවිසැල් හා ගෝඝාතකාගාර සඳහා බලපත්‍ර ලබාදීම

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 27 වැනි දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. ආර්. යාපා බණ්ඩාර,
සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින දී,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2023 වසර සඳහා පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත සඳහන් උපලේඛනවල සඳහන් ස්ථානවල ගවමස්, එළුමස් හා මාළු අලෙවිසැල් හා ගෝඝාතකාගාර ස්ථාපිත කිරීමට යෝජිත බැවින් බල ප්‍රදේශයේ පදිංචි යම් අයෙකුගේ විරෝධතාවක් වේ නම් විරෝධතාවය මා වෙත පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත දැන්විය යුතු බවත් ගෝඝාතක ආඥාපනතේ 7 (2) ආ උපවගන්තිය අනුව පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරයි.

අනු. අංකය	*ස්ථානය හා වෙළෙඳ ස්වභාවය*
01	ගලහ පොදු වෙළෙඳපල අංක 01 මාළු කඩය
02	ගලහ පොදු වෙළෙඳපල අංක 02 ගවමස් කඩය
03	ගලහ පොදු වෙළෙඳපල අංක 03 එළුමස් කඩය
04	ගලහ පොදු වෙළෙඳපල අංක 04 කුකුල් මස් කඩය
05	දෙල්තොට පොදු වෙළෙඳපල ගවමස් කඩය
06	දෙල්තොට පොදු වෙළෙඳපල මාළු කඩය

පෞද්ගලික ගව මස් කඩ :

අනු අංකය	*ස්ථානය*	*ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය*
01	උඩුදෙණිය	එම්. එම්. තාරික්, උඩුදෙණිය, මඩිගේ, මාරස්සන
02	අනුරාඩැනියෙල් ගම නිවාස - 30	එම්. එස්. එම්. රිස්වාන්, බෝපිටිය පාර, දෙල්තොට
03	පට්ටියාගම පල්ලේගම	ෂරීෆ් දීන් මුහම්මද් රිස්වාන්, පල්ලේගම, දෙල්තොට

ගෝඝාතකාගාර :

අනු. අංකය	*ස්ථානය*	*ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය*
01	උඩුදෙණිය මඩිගේ ගෝඝාතකාගාර	එම්. එම්. තාරික්, උඩුදෙණිය, මඩිගේ, මාරස්සන
02	වාඩියගොඩ ගෝඝාතකාගාර	ජේ. එම්. රිෆ්කාන් 274/ඒ, වාඩියගොඩ, දෙල්තොට.
03	කුරුඳුගහ මඩිත්ත නොහොන් වේවැල්බැද්දේගොඩ ගෝඝාතකාගාර	ඒ. අමානුල්ලා, අංක 185/3, මුස්ලිම් කොළණිය, දෙල්තොට
04	පට්ටියගම ගෝඝාතකාගාරය	ෂරීෆ්දීන් මුහම්මද් රිස්වාන්, පල්ලේගම, දෙල්තොට

11-332/20

මහරගම නගර සභාව

2023 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මහරගම නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2022 වර්ෂයෙහි නොවැම්බර් මස 03 වැනි දින යෝජනා අංක 06.1 යටතේ මහරගම නගර සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ටිරාජ් ලක්රුවන් පියරත්න,
සභාපති,
මහරගම නගර සභාව.

2022 නොවැම්බර් මස 03 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160 වගන්තියෙහි (1) වැනි උපවගන්තියෙන් මහරගම නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහරගම නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2023 වර්ෂයේ වාර්ෂික වටිනාකම සඳහා 2020 වර්ෂයේ දී සිදුකරන ලද තක්සේරුව 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත 255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160 වගන්තියෙහි (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් නේවාසික 7%ක් ද, වාණිජ 10%ක වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කළ යුතු බවටත්, මෙයින් යෝජනා කරමි.

තව ද, 2023 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2023 එම වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම්, වාර්ෂික වරිපනම් බද්දෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ III වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල නගර සභා අරමුදලට ගෙවන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද මහරගම නගර සභාව ලබා දිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5%ක වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු කාර්තුව	2023 මාර්තු මස 31 දිනට පෙර	ජනවාරි මස 31
දෙවන කාර්තුව	2023 ජුනි මස 30 දිනට පෙර	අප්‍රේල් මස 30
තුන්වන කාර්තුව	2023 සැප්තැම්බර් මස 30 දිනට පෙර	ජූලි මස 31
හතරවන කාර්තුව	2023 දෙසැම්බර් මස 31 දිනට පෙර	ඔක්තෝබර් මස 31

11-313/1

මහරගම නගර සභාව

2023 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

255 වැනි අධිකාරයවන නගර සභා ආඥාපනතේ 162 වැනි වගන්තිය හා 164 වැනි වගන්තිය යටතේ මහරගම නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයෙහි නොවැම්බර් මස 03 වැනි දින, යෝජනා අංක 06.1 යටතේ මහරගම නගර සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ටිරාජ් ලක්රුවන් පියරත්න,
සභාපති,
මහරගම නගර සභාව.

2022 නොවැම්බර් මස 03 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 වැනි අධිකාරයවන නගර සභා ආඥාපනතේ 162 වැනි වගන්තිය හා 164 වැනි වගන්තිය යටතේ මහරගම නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවේ විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා මහරගම නගර සභා ප්‍රදේශයේ ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනින් නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතුයැයි යෝජනා කරමි.

එසේම, තවදුරටත්, ඒ ස්ථානය හෝටලයක්, ආපනශාලාවක් හෝ නවාතැන්පළ වශයෙන් පාවිච්චි කරනු ලබන්නාවූ ද, ඒ හෝටලය, ආපනශාලාව හෝ නවාතැන්පළ (1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා) ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ හෝ පිළිගනු ලැබ ඇත්තාවූ අවස්ථාවක එසේ අයකළ යුතු බලපත්‍ර ගාස්තුව, බලපත්‍ර ගාස්තු අයකර, ගනු ලැබූ වර්ෂයට පෙරාතුවම වූ වර්ෂය සඳහා එම හෝටලයේ, ආපන ශාලාවේ හෝ නවාතැන්පළේ ලැබීම්වලට අනුකූල විය යුතු අතර, ඒ ඒ ලැබීම්වලින් සියයට එකක් (1%)ක් නොඉක්ම විය යුතු බවත්, එම හෝටලය ආපනශාලාව හෝ නවාතැන්පළ පවත්වාගෙන යනු ලබන පළමු වන වර්ෂය එය වන අවස්ථාවක, ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව බලපත්‍ර ගාස්තුව තීරණය කොට අය කළ යුතු බවටත්, මම යෝජනා කරමි.

උපලේඛනය

	I වැනි තීරුව		*II වැනි තීරුව*	
අනු. අංකය.	*බලය දෙනු ලබන කාර්යය*	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන රු. 1,500 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	බේකරි	500 0	750 0	1,000 0
2.	බත්කඩ	500 0	750 0	1,000 0
3.	භෝජන ශාලා හා ආහාර පාන විකිණීමේ ස්ථානයන්	500 0	750 0	1,000 0
4.	ලඟුම්හල්	500 0	750 0	1,000 0
5.	කිරිපිටි හා කිරි විකිණීම	500 0	750 0	1,000 0
6.	කරණවැම් මැදිරි හා බාබර් සාප්පු	500 0	750 0	1,000 0
7.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
8.	මස් විකිණීම	500 0	750 0	1,000 0
9.	හරක් ගාල් කිරීම	500 0	750 0	1,000 0
10.	තේ, කෝපි කඩ	500 0	750 0	1,000 0
11.	අන්තරාදායක වූ අප්‍රිය වූ ද, පීඩාකාරී වූ ද, අන්තරාදායක වූ ද, පීඩාකාරී හා අන්තරාදායක වූ ද ව්‍යාපාර	500 0	750 0	1,000 0

ඉහත 11 හි පීඩාකාරී වූ ද, අන්තරාදායක වූ ද, පීඩාකාරී හා අන්තරාදායක වූ ද, ව්‍යාපාර, සම්මත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පහත උපලේඛන පරිදි ආදේශ කරනු ලැබේ.

පළමුවැනි උපලේඛනය

පීඩාකාරී ව්‍යාපාර :

1. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම
2. සම් පදම් කිරීම
3. සම් විකිණීම
4. සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)
5. ඡායාරූප ශාලාවක් පැවැත්වීම
6. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම
7. විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම
8. කරවල, ලූණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම
9. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම
10. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම

11. සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම
12. පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
13. සබන් නිෂ්පාදනය කිරීම
14. සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම
15. අලුත් හෝ පරණ ලෝහ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
16. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
17. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම
18. වේවැල් භාණ්ඩ නිපදවීම
19. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
20. සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම
21. රසකැවිලි වර්ග නිපදවීම
22. පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)
23. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)
24. දත් බුරුසු නිපදවීම
25. රා එකතු කිරීම
26. විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම
27. යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දුව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම
28. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
29. සෝඩා නිපදවීම
30. සම් භාණ්ඩ නිපදවීම
31. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම
32. මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂභෝග, කුළුබඩු හෝ කිරිපිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම
33. ඉටිපන්දම් නිපදවීම
34. කපුරු නිපදවීම
35. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම
36. රෙදි සෝදන නිල් නිපදවීම
37. ලාකඩ නිපදවීම
38. සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
39. පාසල් රටහුණු නිපදවීම
40. ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
41. ටයර් නැවත පිරවීම
42. ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම
43. සිමෙන්ති කිලෝග්‍රෑම් 1,000 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
44. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
45. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම
46. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
47. පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම
48. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම
49. ධාන්‍ය හෝ මාෂ භෝග කිලෝග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම

දෙවැනි උපලේඛනය

අන්තරායදායක ව්‍යාපාර :

1. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
2. මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම
3. මුද්‍රණාලයක් පැවැත්වීම
4. කුකුළන් 100 ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළු ගාලක් හෝ කුකුළු කොටුවක් පැවැත්වීම
5. එළුවන්, ඌරන් 10 ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම
6. ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම
7. දර ගබඩාවක් පැවැත්වීම
8. කළු ගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්
9. සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
10. අයිස්ක්‍රීම් නිෂ්පාදනය
11. පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
12. ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
13. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
14. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම

(ii) වාර්ෂික වටිනාකම රු. 50,000 0 වැඩි දේපළ සඳහා රු. 500 0 (රුපියල් පන්සීයක්)
(iii) පූර්ව වර්ෂ සඳහා රුපියල් 50.00 (රුපියල් පනහක්)

ව්‍යාපාර දේපළ සඳහා,

(i) වාර්ෂික වටිනාකම රු. 50,000 0 දක්වා දේපළ සඳහා රු. 500.00 (රුපියල් පන්සීයක්)
(ii) වාර්ෂික වටිනාකම රු. 50,000 0 සිට 500,000 0 දක්වා දේපළ සඳහා රු.750 0 (රුපියල් හත්සිය පනහක්)
(iii) වාර්ෂික වටිනාකම රු. 500,000 0 ට වැඩි දේපළ සඳහා රු. 1,000 0 (රුපියල් දහසක්) මුදලක් පනවා අය කිරීම.
(iv) අතිරේකව තක්සේරු දැන්වීම් ලබා ගැනීම සඳහා රු. 35 0 (රුපියල් තිස් පහක්) මුදලක් පනවා අය කිරීම.

තක්සේරු අංශයේ එක් දිනකට :

(i) ඉඩම් හා ගොඩනැගිලි අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන් ලියාපදිංචි කිරීම.
(ii) ඉඩම් හා ගොඩනැගිලි අයිතිකරුවන්ට නව අංක ලබා දීම.
(iii) නොපරවා ගැනීමේ සහතික ලබා දීම.
(iv) හිමිකම් සහතික ලබා දීම.
(v) පදිංචිකරු නම ඇතුළත් කිරීම
(vi) වාර්ෂික තක්සේරු වටිනාකම සංශෝධනය කිරීම.

ඉහත දක්වා ඇති සේවාන් ලබාදීම සඳහා දැනට අය කරනු ලබන ලියාපදිංචි ගාස්තුවලට අමතරව රු. 750 0 (රුපියල් හත්සිය පනහක) මුදලයක් අය කරනු ලබන අතර එම මුදලින් රු. 250 0 (රුපියල් දෙසීය පනහක්) ලිපිගොනුවෙහි රාජකාරී සඳහා සහභාගි වන සමස්ත කාර්යය මණ්ඩලයට හිමි වේ. නිවැරදි තොරතුරු අවශ්‍යවන අතර එසේ නොවන්නේ නම් කිසිදු හේතුවක් මත නැවත මුදල් ගෙවනු නොලැබේ.

(i) අයදුම්පත්‍ර පෙ.ව. 10.30ට පෙර භාරදිය යුතුය.
(ii) පළමු අයදුම්පත්‍ර 15 සඳහා පමණක් එක් දින සේවාව සපයනු ලැබේ.
(iii) අදාළ සහතිකපත් ප.ව. 3.00 සිට ප.ව. 4.00 දක්වා නිකුත් කරනු ලැබේ.

11 - 365/3

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

දෙහිවල- ගල්කිස්ස මහා නගර සභාව විසින් 2022 ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 07 (VII)07 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
දෙහිවල- ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

252 වැනි අධිකාරිය යටතේ 1947 අංක 16 දරන මහා නගර සභා ආඥාපනතේ 247 ඈ වගන්තියේ (1) උපවගන්තිය අනුව මහා නගර සභා බලතල ප්‍රකාරව, දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා සුදුසු වන විටක හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ සභාවේ මතය අනුව යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක,

(අ) ඒ ඉඩමෙහි ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

(ආ) ඒ ඉඩමෙන් ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය යෝජනා සම්මතයක් මගින් සභාව විසින් නියම කරනු ලැබූ නියමිත අනුපාතයට වඩා අඩු නම්, හෝ

(ඇ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2023 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩම් භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම දෙක (0.2%) ක වාර්ෂික බද්දක් පැනවීම.

11 - 365/4

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2023 වර්ෂය සඳහා නොපවරා ගැනීම් සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු පැනවීම

දෙහිවල- ගල්කිස්ස මහා නගර සභාව විසින් 2022 ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 07 (VII)10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
දෙහිවල- ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

01. නොපවරා ගැනීම් සහතික නිකුත් කිරීම ගාස්තු අය කිරීම

නේවාසික දේපළ සඳහා :

i. වාර්ෂික වටිනාකම රු. 50,000 දක්වා දේපළ සඳහා රු. 306.25 (රුපියල් තුන්සිය හයයි ශත විසිපහක්)
ii. වාර්ෂික වටිනාකම රු. 50,000 වැඩි දේපල සඳහා රු. 503.13 (රුපියල් පන්සිය තුනයි ශත දහතුනක්)

ව්‍යාපාර දේපළ සඳහා

iii. වාර්ෂික වටිනාකම රු. 50,000 දක්වා දේපළ සඳහා රු. 1,006.25 (රුපියල් එක් දහස් හයයි ශත විසි පහක්)
iv. වාර්ෂික වටිනාකම රු. 50,001 සිට රු. 500,000 දක්වා දේපළ සඳහා රු. 1,505.00 (රුපියල් එක්දහස් පන්සිය පහක්)
v. වාර්ෂික වටිනාකම රු. 500,001 වැඩි දේපළ සඳහා රු. 2,003.76 (රුපියල් දෙදහස් තුනයි ශත හැත්තෑ හයක්)

ඉහත ගාස්තු වලට අතිරේකව නියමිත ලේඛන සැකසුම් ගාස්තු, ලෙස නොපවරා ගැනීමේ සහතික සඳහා රු. 50.00 (රුපියල් පනහක්) අය කිරීමට යෝජනා කෙරේ.

වරිපනම් අංශයේ එක් දින සේවාව - නොපවරා ගැනීමේ සහතික ලබාදීම.

ඉහත දක්වා ඇති සේවාවන් ලබාදීම දැනට අය කරනු ලබන ලියාපදිංචි ගාස්තුවලට අමතරව රු. 750 0 (රුපියල් හත්සිය පනහක) මුදලක් අය කරනු ලබන අතර එම මුදලින් රු. 250 0ක් (රුපියල් දෙසිය පනහක්) ලිපිගොණුවෙහි රාජකාරී සඳහා සහභාගි වන සමස්ත කාර්යය මණ්ඩලයට හිමි වේ. නිවැරදි තොරතුරු අවශ්‍යවන අතර එසේ නොවන්නේ නම් කිසිදු හේතුවක් මත නැවත මුදල් ගෙවනු නොලැබේ.

* අයදුම්පත්‍ර පෙ.ව. 10.30 ට පෙර භාරදිය යුතුය.

* අදාළ සහතිකපත් ප.ව. 3.00 සිට ප.ව. 4.00 දක්වා නිකුත් කරනු ලැබේ.

11 - 365/5

දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව

2023 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම

දෙහිවල- ගල්කිස්ස මහා නගර සභාව විසින් 2022 ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 07(VII)04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
දෙහිවල- ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතෙන් දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාවට පැවරී ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරනු ලබන පහත සඳහන් පොදු උපයෝගී සේවා, සුභ සාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය කරන ආනුෂාංගික කාර්යයන් ඉටු කිරීමේ දී මහා නගර සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2023 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක කිරීමටත් දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නීය.

2023 වර්ෂය සඳහා වාහන ගාල්කිරීමේ ගාස්තුව
(පැය දෙකක කාලයක් ගාල්කිරීම සඳහා)

	විස්තරය	ගාස්තුව රු. ශත
1.	යතුරු පැදියක් සඳහා	20 0
2.	මෝටර් කාර් එකක්/ත්‍රී රෝද රථයක් සඳහා	30 0
3.	වෑන් රථයක්/මිණි බස් රථයක් සඳහා	50 0
4.	ලොරියක් සඳහා	80 0
5.	පා පැදියක් සඳහා	10 0
6.	සංචාරක බස් රථයක් සඳහා	100 0

2023 වර්ෂය සඳහා විවිධ බලපත්‍ර ගාස්තු

	විස්තරය	ගාස්තුව රු. ශත
1.	වෙන්දේසි/බ්‍රෝකර් බලපත්‍රයක් සඳහා	1,000 0
2.	සංචාරක වෙළෙඳ බලපත්‍රයක් සඳහා	1,000 0
3.	දේපළ උකස්කරයක් ලියාපදිංචි කිරීම සඳහා	1,000 0
4.	සංදර්ශන බලපත්‍රයක් සඳහා	1,000 0
5.	ගෝ ඝාතක බලපත්‍රයක් සඳහා - ගවයෙකුට	1,000 0
	එළුවෙකුට	500 0
6.	ප්‍රසිද්ධ රැගුම් බලපත්‍රයක් සඳහා	1,000 0
7.	මුහුදු වෙරළ බලපත්‍ර	1,000 0
8.	ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය සඳහා අවසර ලබා දීමේ ගාස්තු	1,000 0
9.	සමාජ ශාලා බලපත්‍ර ගාස්තු	5,000 0

11 - 365/6

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2023 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳව බදු පැනවීම

දෙහිවල- ගල්කිස්ස මහා නගර සභාව විසින් 2022 ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 07(VII)04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
දෙහිවල- ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

252 වැනි අධිකාරය වූ 1947 අංක 16 දරන මහා නගර සභා ආඥාපනතේ 245 (1) වගන්තිය අනුව මහා නගර සභා බලතල ප්‍රකාරව, දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය තුළ තබා ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සියලු වාහන හා සතුන් වෙනුවෙන් මහා නගර සභා ආඥාපනතේ සතර වන උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණයක වාර්ෂික බද්දක් පනවා අය කිරීමට දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නීය.

		රු. ශත
(01) (i)	මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් ට්‍රැක්ටරයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් ම සඳහා	100 00
(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක්ම සඳහා,	
	(අ) එය වෙළෙඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම්	100 00
	(ආ) එය වෙළෙඳ කටයුත්තක් නොවන කාර්යයක් සඳහා පාවිච්චි කරන්නේ නම්	100 00

(02) රෝදවල විශ්කම්භය අඟල් 26ට නොවැඩි ළමා වාහන, විල් බැරැක්ක, හුදෙක් පෞද්ගලික ස්ථාන තුළ පමණක් වෙළෙඳ කටයුතු සඳහා භාවිතා කරන අත් කරත්තයක් සහ වෙළෙඳ කටයුතු සඳහා භාවිතා නොකරන අත්කරත්තයක් මෙම ගෙවීම්වලින් නිදහස් වේ.

මේ උපලේඛනයේ වෙළෙඳ කටයුතු යන යෙදුමට යම් වෙළෙඳ ව්‍යාපාරයකට හෝ කර්මාන්තයකට සම්බන්ධව විකිණීම සඳහා වුව ද අන්‍ය කාර්යයක් සඳහා වුව ද යම් භාණ්ඩයක් හෝ බඩු හෝ ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය කිසිවක් හෝ ගෙනයෑම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

11 - 365/7

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2023 වර්ෂය සඳහා පොළ ගාස්තු සහ ජංගම වෙළඳාම් රථ ගාස්තු පැනවීම

දෙහිවල- ගල්කිස්ස මහා නගර සභාව විසින් 2022 ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 07(VII)04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
දෙහිවල- ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව I

දෙහිවල- ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය තුළ ජංගම වෙළෙඳාම් රථවලින් වර්ෂයකට රු. 1,000 00 (රුපියල් දහස) ක ගාස්තුවක් පනවා අය කිරීමටත්, එම ගාස්තු අය කිරීම 2023.01.01 වැනි දින සිට ක්‍රියාත්මක කිරීමටත්, දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නීය.

යෝජනාව II

252 වැනි අධිකාරය වූ 1947 අංක 16 දරන මහා නගර සභා ආඥාපනතේ 155 වැනි වගන්තිය හා උක්ත වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 267 වගන්තිය ප්‍රකාරව වෙළෙඳ පොලවල් සහ ඉස්තාල, කරත්ත, ගවයන් ආදිය තබා ගැනීම සඳහා 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ රත්මලාන පොදු වෙළෙඳ පොළෙහි වෙළඳාම් කිරීම සඳහා පහත සඳහන් පරිදි දෛනිකව ගාස්තු පනවා අය කිරීමටත්, එම ගාස්තු අය කිරීම 2023.01.01 වැනි දින සිට ක්‍රියාත්මක කිරීමටත්, දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නීය.

පොළ ගාස්තු වැට් බද්ද ඇතුළුව දිනකට :

	රු. ශත
1. සාප්පු බඩු වෙළෙඳාම සඳහා	100 0
2. මාළු පමණක් වෙළෙඳාම සඳහා	100 0
3. එළවළු ලෑල්ලක් සඳහා	50 0
4. පළතුරු පමණක් විකිණීම සඳහා	50 0
5. පළා වර්ග පමණක් විකිණීම සඳහා	25 0
6. එළවළු, පළතුරු, පළා වර්ග මිශ්‍ර සිල්ලර බඩු සඳහා	50 0

11 - 365/8

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2023 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව විසින් 2022 ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 07(VII)04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

252 වැනි අධිකාරය වූ 1947 අංක 16 දරන මහා නගර සභා ආඥාපනතේ 247 (අ) (1) වගන්තිය අනුව සහ 247 (අ) (2) වගන්තිය අනුව එකී ආඥාපනතේ හෝ එකී ආඥාපනත යටතේ සාදන ලද, අංක 541/17 දරන 1989 ජනවාරි 20 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (IV) (ආ) වන කොටසේ පළාත් පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා යටතේ මහා නගර සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර වෙනුවෙන් ගාස්තුවක් නියමකර අයකර ගැනීමටත්, එම ගාස්තු අයකිරීම 2023.01.01 වැනි දින සිට ක්‍රියාත්මක කිරීමටත් දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නීය. ඒ අනුව එවැනි යම් ස්ථානයක වාර්ෂික වටිනාකම මෙහි පහත දැක්වෙන I වන තීරුව

I වැනි තීරුව *වාර්ෂික වටිනාකම*	*II වැනි තීරුව* *රු. ශත*
රු. 1,500 නොඉක්මවන විට	2,000
රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට	3,000
රු. 2,500 ඉක්මවන විට	5,000

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ, 2023 වර්ෂය සඳහා බලපත්‍ර ලබාගත යුතු කාර්යයන් සම්බන්ධ ලැයිස්තුව

1. මාළු විකිණීම
2. මස් විකිණීම
3. ගව, බැටළු, කුකුළු යනාදී සතුන් සඳහා වෙළෙඳ පොළවල්
4. කොණ්ඩා සකස් කරන්නන් සහ බාබර්වරුන්ගේ සාප්පු සහ සැලුන් හල්
5. පීඩාකාරී හෝ අන්තරාදායක කර්මාන්ත හෝ ව්‍යාපාර

(අ) මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර, (252 වැනි අධිකාරයවන) මහ නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්යය සඳහා **පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර** ලෙස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර :

I. මිනිරන් වර්ග කිරීම හා සකස් කිරීම
II. මිනිරන් ගබඩාකර තැබීම
III. පොහොර නිෂ්පාදනය
IV. පොහොර ගබඩාකර තැබීම
V. හම් ගබඩාකර තැබීම
VI. උම්බලකඩ (හොන්ඩර 5කට වැඩියෙන්) ගබඩාකර තැබීම
VII. කුකුළු වෙළෙඳපොළක් පවත්වාගෙන යාම
VIII. කලුගල් කැඩීම සහ කබොක් කැපීම
IX. බොරලු හැරීම
X. අශ්වයන් හෝ ගවයන් සඳහා ඉස්තාලයක්, වෙළෙඳපොළක්, ගාලක් හෝ ලැයිමක් තබා ගැනීම
XI. පශු ගිලන් හලක් පවත්වාගෙන යාම
XII. රබර් සකස් කිරීම
XIII. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබුණු ගෝනි, ගබඩා කිරීම, ශුද්ධ කිරීම, අළුත්වැඩියා කිරීම, හෝ ඒවායේ දූලි ඉවත් කිරීම
XIV. පුවක් සකස් කිරීම
XV. තලාතූ මිනිරන් සකස් කිරීම
XVI. බැටළුවන් හෝ එළුවන් හෝ ඒ දෙවර්ගයම හෝ 10 දෙනෙකුට වඩා ගාල් කොට තැබීම සඳහා වූ මඩුවක් හෝ ගාලක් තබා ගැනීම.
XVII. උළු, කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
XVIII. හුණු ගබඩාකොට තැබීම
XIX. බොම්බයි එෑණු හොණ්ඩර 5 කට වඩා ගබඩාකොට තබා ගැනීම
XX. අර්තාපල් හොණ්ඩර 5 කට වඩා ගබඩාකොට තබා ගැනීම
XXI. පොල් කටු, අඟුරු හොණ්ඩරයකට වඩා ගබඩාකොට තබා ගැනීම
XXII. කුරුඳු, කරදමුංගු හෝ කෙඳි, ගෙන්දගම් දුම් ගස්සා සකස් කිරීම
XXIII. පරණ ලෝහ ගබඩාකර තැබීම
XXIV. සිමෙන්ති හොණ්ඩර 25 කට වඩා ගබඩාකර තැබීම
XXV. කරවල හොණ්ඩර 10 කට වඩා ගබඩාකර තැබීම
XXVI. ලුණු දැමූ මාළු හොණ්ඩර 10 කට වඩා ගබඩා කර තැබීම
XXVII. රබර් ඔට්ටපාලු සුන්බුන් ඇඹරීම හෝ වේලීම
XXVIII. ට්‍රංක පෙට්ටි නිෂ්පාදනය
XXIX. මරා සකස් කළ කුකුළු ආදී සතුන් විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යාම
XXX. ගම් වර්ග නිෂ්පාදනය
XXXI. විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
XXXII. බැටරි පුරවනු ලබන්නා වූ හෝ බැටරි ගබඩා කොට තබනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම
XXXIII. ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නා වූ හෝ කට්ට කැපීම කරනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම
XXXIV. ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම

XXXV. හිස් බෝතල් 100 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
XXXVI. කුරුඳු පොතු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
XXXVII. කොකෝවා හොණ්ඩර 10 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
XXXVIII. මිනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කොට තැබීම හෝ මිනී පෙට්ටි සෑදීම සහ ගබඩා කොට තැබීම
XXXIX. ගෘහ භාණ්ඩ සෑදීම හෝ ගබඩා කොට තැබීම හෝ ගෘහ භාණ්ඩ සෑදීම සහ ගබඩා කොට තැබීම
XL. මැණික් වෙළෙන්දන් විසින් මැණික් කැපීම හා ඔප දැමීම
XLI. බලපත්‍රලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩා කොට තැබීම
XLII. වේවැල් බඩු සෑදීම හෝ ගබඩා කොට තැබීම හෝ වේවැල් බඩු සෑදීම සහ ගබඩා කොට තැබීම
XLIII. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කොට තැබීම
XLIV. යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
XLV. පිටි හෝ කුළු බඩු ඇඹරීම
XLVI. පුන්නක්කු හැර, සත්ත්වාහාර හොණ්ඩර 20 කට වඩා ගබඩාකර තැබීම
XLVII. සත්ත්ව ආහාර සඳහා හැර වෙනත් කාර්යයන් සඳහා ධාන්‍ය ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම, එහෙත් සමුපකාර සමිතියක් විසින් ගබඩා කොට තබා ගන්නා එවැනි ධාන්‍ය මෙම නියමයට යටත් නොවේ.
XLVIII. රබර් භාණ්ඩ නිෂ්පාදනය
XLIX. මෝර වරල් සකස් කිරීම හා ගබඩා කොට තැබීම
L. යන්ත්‍රානුසාරයෙන් ඇටකටු ඇඹරීම
LI. පුන්නක්කු ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
LII. පොලිතින්, සෙලියුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදන නිපදවීම සහ ගබඩා කර තැබීම
LIII. ඇසිඩ් ගැලුම් 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම
LIV. කපුරු නිෂ්පාදනය
LV. බූට් සපත්තු සහ හෝ පාවහන් නිෂ්පාදනය
LVI. ඉටිපන්දම් නිෂ්පාදනය

(ආ) මෙහි පහත සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරිය වන) මහ නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්යය සඳහා අන්තරාදායක කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අන්තරාදායක කර්මාන්ත හෝ ව්‍යාපාර :

I. වාෂ්ප, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දුව හෝ ලී ඉරීම
II. සිසිල් බීම නිෂ්පාදනය
III. කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම
IV. යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් නිෂ්පාදනය
V. යන්ත්‍රානුසාරයෙන් තල තෙල් නිෂ්පාදනය
VI. තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අත් මෝලක් තබා ගැනීම
VII. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කොට තැබීම හෝ කෙඳි නිෂ්පාදනය සහ ගබඩා කොට තැබීම
VIII. ගිනි පෙට්ටි නිෂ්පාදනය
IX. ඉඹුල් පුළුන් ගබඩා කොට තැබීම
X. පොල්තෙල් ගැලුම් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
XI. මැතිලේටඩ් ස්ප්‍රිතු ගබඩා කොට තැබීම
XII. ඇසිටිලින් නිෂ්පාදනය
XIII. උළු 500 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
XIV. ගඩොල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
XV. කබොක් ගල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
XVI. සිගරට් නිෂ්පාදනය
XVII. බීඩි නිෂ්පාදනය
XVIII. තීන්ත වර්ග වාර්නිශ් හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
XIX. ලී පෙට්ටි හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
XX. කොහු නිෂ්පාදනය
XXI. පොහොර, නුණු හෝ මිනිරන් දමා තිබුණු ගෝනි හැර වෙනත් ගෝනි 100 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
XXII. පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම

XXIII. රස කැවිලි නිෂ්පාදනය
XXIV. පොල්කටු, අඟුරු හැර වෙනත් අඟුරු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
XXV. බෝට්ටු හෝ බත්තල් සෑදීම
XXVI. ලී පෙට්ටි සැදීම
XXVII. ඔක්සිජන් සහ වෑල්ඩිං වැඩ කරනු ලබන්නා වූ ද, මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූ ද, ගරාජයක් නොවන්නා වූ ද, වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
XXVIII. මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූ ද, යකඩ සහ ලෝහ වැඩ කරනු ලබන්නා වූ ද, ගරාජයක් නොවන්නා වූ ද, වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
XXIX. මෝටර් වාහන අලුත්වැඩියා කරන ආයතනයක් පවත්වාගෙන යාම
XXX. මෝටර් වාහන සර්විස් කරන ආයතනයක් පවත්වාගෙන යාම
XXXI. යාන්ත්‍රික බලය යොදගනු ලබන්නා වූ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
XXXII. අතින් හෝ පා පොලුවලින් ක්‍රියා කරවන යන්ත්‍රයක් පාවිච්චි කෙරෙන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
XXXIII. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තැබීම
XXXIV. පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර් 54.5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
XXXV. ගෙන්දගම් සහ/ හෝ ගෙන්දගම් කුඩු කිලෝග්‍රෑම් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම
XXXVI. තීන්ත හා වාර්නිෂ් නිෂ්පාදනය
XXXVII. 100 කට අධික ප්‍රමාණයක් පතරොම් ගබඩා කර තැබීම
XXXVIII. කොහු හෝ පුළුන් මෙට්ට හෝ කොට්ට හෝ කුෂන් නිෂ්පාදනය සහ/ හෝ ගබඩා කර තැබීම
XXXIX. අලුත් ටයර් හෝ ටියුබ් 150 කට අධික ප්‍රමාණයක් ගබඩා කර තැබීම
XL. පාවිච්චි කළ කඩදාසි කිලෝග්‍රෑම් 250 කට අධික ප්‍රමාණයක් ගබඩා කර තැබීම
XLI. ස්ප්‍රේ පේන්ට් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම
XLII. යාන්ත්‍රික ශීතකරණ සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
XLIII. යාන්ත්‍රික බලය පාවිච්චි කරනු ලබන්නා වූ ද, ඇඳුම් මැසීම කරනු ලබන්නා වූ ද, ආයතනයක් පවත්වාගෙන යාම
XLIV. කමිස කොලර් සහ කමිස අත් රැළි දමන ආයතනයක් පවත්වාගෙන යාම

(ඇ) **මෙහි පහත සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 147 වන වගන්තියේ කාර්යය සඳහා අන්තරාදයක සහ පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.**

I. ඩ්‍රයික්ලීන් වැඩ කරන ආයතනයක් පවත්වාගෙන යාම
II. යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ, ක්‍රෝමියම් ආලේප කිරීම, රන් ආලේප කිරීම, රිදී ආලේප කිරීම හෝ තඹ ආලේප කිරීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම
III. යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නා වූ ද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ කරනු ලබන්නා වූ ද, ගරාජයක් නොවන්නා වූ ද, ආයතනයක් පවත්වාගෙන යාම
IV. ගල් අඟුරු ගෑස් නිෂ්පාදනය සහ ගබඩා කිරීම
V. කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය
VI. අශුද්ධ ලෝහ උණුකිරීම
VII. ගිනිකෙළි භාණ්ඩ ගබඩා කිරීම
VIII. කිලෝග්‍රෑම් දෙකකට අධික ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරන ද්‍රව්‍ය ගබඩාකිරීම
IX. ගම්, ඉටි හෝ දුම්මල (රෙසින්) ගබඩා කිරීම
X. බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය
XI. තාර පෙරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
XII. ශීතකරණ අලුත්වැඩියා කිරීම, රීකන්ඩිෂන් කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
XIII. මෝටර් කාර් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
XIV. ස්කූටර් හෝ මෝටර් සයිකල් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
XV. පුපුරණ ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම

අප්‍රසන්න හා අන්තරාදයක වෙළඳාම් හෝ ව්‍යාපාර : (සම්මත අතුරු ව්‍යවස්ථාවේ 275 පිටුවට අනුව)

I. රබර් නිවාරණය කිරීම
II. පොහොර, හුණු හෝ මිනිරන් බහා තැබූ ගෝනි මළු ගබඩා කිරීම, කුඩු පිස දැමීම, ශුද්ධ කිරීම හෝ අළුත්වැඩියා කිරීම

III. තලාතූ මිනිරන් නිවාරණය කිරීම
IV. හුණු ගබඩා කිරීම
V. කිලෝග්‍රෑම් 50 කට වැඩියෙන් පොල් කටු අඟුරු ගබඩා කිරීම
VI. ගෙන්දගම් දුම් භාවිතා කරමින් කුරුඳු, කරදමුංගු හෝ කෙඳි නිවාරණය කිරීම
VII. ඔට්ටපාලු ඇඹරීම හෝ වේලීම
VIII. බැටරි චාජ් කරනු ලබන හෝ ගබඩා කරනු ලබන යාන්ත්‍රික බලය භාවිතයට ගන්නා ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
IX. ටියුබ් හෝ ටයර් වොල්කනයිස් කරන යාන්ත්‍රික බලය යොදා නොගන්නා ගරාජයක් හැර, වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
X. කිලෝග්‍රෑම් 50 ට වැඩියෙන් කුරුඳු ගබඩා කිරීම
XI. කිලෝග්‍රෑම් 500ට වැඩියෙන් කොකෝවා ගබඩා කිරීම
XII. මිනීපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම නැතහොත් මිනීපෙට්ටි නිෂ්පාදනය කිරීම
XIII. දැව භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම නැතහොත් නිෂ්පාදනය කිරීම
XIV. බලපතුලත් වෙළෙන්දෙක් විසින් රබර් ගබඩා කිරීම
XV. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය සහ ගබඩා කිරීම නැතහොත් නිෂ්පාදනය හා ගබඩා කිරීම
XVI. යාන්ත්‍රික බලය භාවිතා කරන්නා වූ ද රෙදි වියන කම්හලක් පවත්වාගෙන යාම
XVII. පිටි හෝ තුනපහ වර්ග කෙටීම
XVIII. රබර් බඩු නිෂ්පාදනය කිරීම
XIX. දුම්, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව හෝ ලී ඉරීම
XX. කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම
XXI. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය
XXII. යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය
XXIII. තෙල් සිදීම සඳහා සෙක්කුවක් හෝ අතින් ක්‍රියාකරවන මෝලක් පවත්වාගෙන යාම
XXIV. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩාකිරීම නැතහොත් කෙඳි නිෂ්පාදනය හා ගබඩාකිරීම
XXV. ගිනිපෙට්ටි නිෂ්පාදනය
XXVI. පුළුන් ගබඩා කිරීම
XXVII. ලීටර් 227 1/2 ට වැඩියෙන් පොල්තෙල් ගබඩා කිරීම
XXVIII. මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කිරීම
XXIX. ඇසිටිලින් නිෂ්පාදනය
XXX. සිගරට් නිෂ්පාදනය
XXXI. බීඩි නිෂ්පාදනය
XXXII. කිලෝග්‍රෑම් 250 ට වැඩියෙන් තීන්ත වර්ග හෝ වාර්නිෂ් ගබඩා කිරීම
XXXIII. කිලෝග්‍රෑම් 250 ට වැඩියෙන් ලී පෙට්ටි ගබඩා කිරීම
XXXIV. කොහු නිෂ්පාදනය
XXXV. රසකැවිලි නිෂ්පාදනය
XXXVI. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි මළු හැර කිලෝග්‍රෑම් 100 කට වැඩියෙන් වෙනත් ගෝනි මළු ගබඩා කිරීම
XXXVII. පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150 ට වැඩියෙන් ගබඩා කිරීම
XXXVIII. පොල් කටු අඟුරු හැර වෙනත් අඟුරු කිලෝග්‍රෑම් 50 ට වැඩියෙන් ගබඩා කිරීම
XXXIX. ලී පෙට්ටි නිෂ්පාදනය
XL. යාන්ත්‍රික බලය පාවිච්චි කරන ඔක්සිජන් සහ වෙල්ඩින් වැඩකරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
XLI. යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නා වූ යකඩ හෝ ලෝහ වැඩ කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
XLII. යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් මෝටර් වාහන සර්විස් කරන, මෝටර් රථ අළුත්වැඩියා කරන ගරාජයක් හැර වෙනත් ස්ථානයක් පවත්වාගෙන යාම
XLIII. යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් මෝටර් රථ සර්විස් කරන, මෝටර් රථ අලුත්වැඩියා කරන ගරාජයක් හැර වෙනත් ස්ථානයක් පවත්වාගෙන යාම
XLIV. යාන්ත්‍රික බලය පාවිච්චි කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
XLV. අත් යන්ත්‍ර හෝ පාගන යන්ත්‍ර පාවිච්චි කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
XLVI. පරණ ඇඳුම් ගබඩා කිරීම
XLVII. ලීටර් 54 ට වැඩියෙන් පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ගබඩා කිරීම පිණිස අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
XLVIII. ඇඳුම් ඩ්‍රයි ක්ලීන් කරන ආයතනයක් පවත්වාගෙන යාම
XLIX. යාන්ත්‍රික බලය පාවිච්චියට නොගෙන විද්‍යුත් ලෝහාලේපය කිරීම, ක්‍රෝමියම් ආලේපනය කිරීම, රන් ආලේපනය කිරීම, රිදී ආලේපනය කිරීම හෝ තඹ ආලේපනය කිරීම කරන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම

L. යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් විද්‍යුත් ලෝහාලේපනය කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
LI. මෝටර් රථ අළුත්වැඩියා කරන ගරාජ් සහ ආර්ක් වෙල්ඩිං වැඩ
LII. කවර වර්ගයක හෝ උපකරණයක් ක්‍රියාකරවීම සඳහා විදුලි බලය හෝ යාන්ත්‍රික බලය භාවිතා කෙරෙන යම් ස්ථානයක්
LIII. කිලෝග්‍රෑම් 50 ට වැඩියෙන් ඕනෑම වර්ගයක ප්ලාස්ටික් බඩු තබා ගැනීම
LIV. සියලු වර්ගවල ප්ලාස්ටික් බඩු නිෂ්පාදනය
LV. කිලෝග්‍රෑම් 50 ට වැඩියෙන් ඕනෑම වර්ගයක පොලිතීන් බඩු තබා ගැනීම
LVI. සියලු වර්ගවල පොලිතීන් බඩු නිෂ්පාදනය
LVII. කොහු නිෂ්පාදනය හා තබා ගැනීම
LVIII. කිලෝග්‍රෑම් 1000 ට වැඩියෙන් තේ කොළ තබා ගැනීම
LIX. කිලෝග්‍රෑම් 250 ට වැඩියෙන් කඩදාසි සහ / හෝ කවර වර්ගයක හෝ කඩදාසි බඩු ගබඩා කිරීම
LX. ඇඟළුම් නිෂ්පාදනය
LXI. බත් කඩ
LXII. රසායන ද්‍රව්‍ය
LXIII. කිලෝග්‍රෑම් 50 ට වැඩි සියලු වර්ගවල ගිනිකෙලි භාණ්ඩ තබා ගැනීම
LXIV. කිලෝග්‍රෑම් 150 ට වැඩියෙන් එල්පීජී (LPG) සිලින්ඩර් ගබඩා කිරීම
LXV. හිස් වැසුම් සහ තොප්පි නිෂ්පාදනය
LXVI. කිලෝග්‍රෑම් 100 ට වැඩියෙන් රබර් බඩු (සියලු වර්ගවල) ගබඩා කිරීම
LXVII. කිලෝග්‍රෑම් 250 ට වැඩියෙන් කපාපු පොල් ගබඩා කිරීම
LXVIII. කිලෝග්‍රෑම් 250 ට වැඩියෙන් රබර් ඇට ගබඩා කිරීම
LXIX. ලීටර් 91 ට වැඩියෙන් ඇසිඩ්
LXX. එක්වරකට සේවා නියුක්තියන් 25 ට වැඩියෙන් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් කර්මාන්ත ශාලාවක්
LXXI. ද්‍රව බනිජ තෙල් ගෑස් ඇතුළුව බනිජතෙල් නිෂ්පාදනය, ගබඩා කිරීම
LXXII. පතරොම් සහ වෙඩි බෙහෙත්

6. කර්මාන්ත ශාලා සහ කර්මාන්ත
7. ලොන්ඩරි
8. ලැගුම් නිවාස
9. හෝටල්
10. බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ
11. කිරි පට්ටි හා කිරි විකිණීම
12. ගවගාල් කිරිපට්ටි
13. බේකරි
14. පිහිනුම් තටාක
15. අවමංගල ශාලා සහ අවමංගල්‍ය කටයුතු භාරකරුවෝ
16. ILV වන කොටසේ III වන කොටස - ප්‍රසිද්ධ රඟ දැක්වීම් සඳහා පාවිච්චි කරන සිනමාහල්, රඟහල් සහ වෙනත් ස්ථාන
17. සිසිල් බීම නිෂ්පාදනාගාර
18. අයිස් කර්මාන්ත ශාලා
19. බටහිර / ආයුර්වේද ඖෂධ ගබඩා
20. නිමි ඇඳුම් ගබඩා
21. පෞද්ගලික රෝහල්
22. සුරතල් සතුන් / මසුන් අලෙවි කිරීම
23. ආහාර වර්ග නිෂ්පාදනය, සැකසීම සහ ගබඩා කිරීම
24. ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා කිරීම
25. පෞද්ගලික අධ්‍යාපන ආයතන

එසේ ම තවදුරටත් එම ස්ථානය හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක් වශයෙන් පාවිච්චි කරනු ලබන්නා වූ ද, ඒ හෝටලය, ආපනශාලාව හෝ නවාතැන්පොළ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද, අවස්ථාවක ඉහත සඳහන් පරිදි අයකළ යුතු බලපත්‍ර ගාස්තුව පෙර වර්ෂයේ එම හෝටලයෙහි ආපනශාලාවෙහි *නැතහොත්* නවාතැන්පොළෙහි ලැබීම් වලින් 1% ක් විය යුතු ය. එම හෝටලය, ආපනශාලාව හෝ නවාතැන්පොළ පවත්වාගෙන යනු ලබන පළමුවන වර්ෂය එය වන අවස්ථාවක ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව බලපත්‍ර ගාස්තු තීරණය කිරීමට දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නී ය.

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2023 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව විසින් 2022 ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 07(VI1)04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

252 වන අධිකාරය වූ 1947 අංක 16 දරන මහා නගර සභා ආඥාපනතේ 247 (ආ) වැනි වගන්තියෙන් මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවන්නා වූ කිසියම් කර්මාන්තයක් දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත, 2023 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම, මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ ඇතුළත් ප්‍රමාණයන් අතර, පවත්නා අවස්ථාවක, එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙකුටම එකී කර්මාන්ත බද්ද 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර දෙහිවල- ගල්කිස්ස මහ නගර සභාවට ගෙවිය යුතු බවටත්, දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

I වැනි තීරුව *වාර්ෂික වටිනාකම*	*II වැනි තීරුව* *රු. ශත*
රු. 1,500 නොඉක්මවන විට	2,000 0
රු. 1,500 ඉක්මවන නමුත් රු.2,500 නොඉක්මවන විට	3,000 0
රු. 2,500 ඉක්මවන විට	5,000 0

කර්මාන්ත බදු පනවනු ලබන කර්මාන්ත ලැයිස්තුව පහත දැක්වේ :

1. වාහන කුෂන් සීට් කවර නිෂ්පාදනය
2. පස් සෝදු වැලි නිෂ්පාදනය කිරීම
3. ගමන් මළු/පාසල් බෑග් නිෂ්පාදනය
4. හතු නිෂ්පාදනය
5. විදුලි බල්බ නිෂ්පාදනය
6. සූර්ය පැනල නිෂ්පාදනය
7. මෝටර් කොයිල් එතීමේ නිෂ්පාදන
8. වෙස්මුහුණු නිෂ්පාදනය
9. හඳුන්කුරු නිෂ්පාදනය
10. සුවඳ කුඩු නිෂ්පාදනය
11. කුළුබඩු පැකට් කිරීම
12. පාපිසි/බුමුතුරුණු නිෂ්පාදනය
13. නාම පුවරු සකස් කිරීම
14. පින්තූර රාමු සකස් කිරීම
15. බීරළු කැටයම් කැපීම

16. මාළු අල්ලන දැල් නිෂ්පාදනය කිරීම
17. සුරුට්ටු නිෂ්පාදනය කිරීම
18. මැණික් කැපීමේ හා පුහුණු කිරීමේ පාසලක් පවත්වාගෙන යාම
19. කැටපත් නිෂ්පාදනය කිරීම
20. ඇස් කණ්නාඩි නිෂ්පාදනය කිරීම
21. ලාම්පු ආවරණ නිෂ්පාදනය කිරීම
22. සුවඳ විලවුන් නිෂ්පාදනය
23. විනාකිරි නිෂ්පාදනය
24. අකුරු කෙටීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
25. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
26. විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය
27. කඩදාසි බෑග් නිෂ්පාදනය
28. කාර් හුඩ් සහ ආසන සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
29. සිහිවටන නිෂ්පාදනය
30. පැණි සෑදීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
31. මැටි භාණ්ඩ නිෂ්පාදනය
32. කැටයම් කැපීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
33. කම්හල් වැඩපලක් පවත්වාගෙන යාම

මීට අමතරව ව්‍යාපාර බදු හෝ ව්‍යාපාර බලපත්‍ර ගාස්තු යටතට නොගැනෙන්නා වූ ද යම් නිෂ්පාදනයක් සිදුකරනු ලබන්නා වූ ද අනෙකුත් ව්‍යාපාරික ස්ථාන.

11 - 365/10

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2023 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව විසින් 2022 ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 07(V1I)04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

252 වැනි අධිකාරය වූ 1947 අංක 16 දරන මහා නගර සභා ආඥාපනතේ 247 (ඇ) වගන්තියෙන් මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී ආඥාපනතේ 247 (ආ) වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ ද කිසියම් ව්‍යාපාරයක් දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත, 2023 වර්ෂයේ දී කරනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලත් ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් එකී ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙක් ම එකී ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර දෙහිවල- ගල්කිස්ස මහ නගර සභාවට ගෙවිය යුතු බවටත්, දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

(අ) බදු වක්‍රය -

I වැනි තීරුව බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ දී ගෙවිය යුතු බද්ද ව්‍යාපාරයෙන් ලත්, ලැබීම් ප්‍රමාණය	II වැනි තීරුව රු. ශත
01. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
02. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
03. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
04. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
05. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
06. රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

(ආ) බදු පනවනු ලබන වෘත්තීන් ලැයිස්තුව -

I. කොමිස් ඒජන්තවරු
II. ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්
III. මුදල් ණයට දෙන්නන්
IV. බ්‍රෝකර්වරුන්
V. වෙන්දේසිකරුවන්
VI. මුදල් ආයෝජකයන්
VII. රන් බඩු උකස්කරුවන්
VIII. උපදේශකවරුන්

ව්‍යාපාර බදු/කර්මාන්ත බදු අයකර ගැනීමේ දී මේ වන විට ඉදිරිපත් කර ඇති යෝජනාවලට අමතරව පහත සඳහන් කරුණු අමතර වශයෙන් සළකා බැලීම සඳහා ඉදිරිපත් කරමි.

1. එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කිහිපයකින් යුත් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි කිහිපයක් එක් ව්‍යාපාරයක්/කර්මාන්තයක් පවත්වාගෙන යන්නේ නම් වාර්ෂික බදු ගණනය කිරීම සඳහා පමණක් එය එක් ස්ථානයක් වශයෙන් සලකා ව්‍යාපාර/කර්මාන්ත බදු අය කරනු ඇත.

2. එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කිහිපයකින් යුත් ගොඩනැගිල්ලක විවිධ ව්‍යාපාර/කර්මාන්ත පවත්වාගෙන යන්නේ නම් එම ව්‍යාපාර හෝ කර්මාන්ත සඳහා යොදු ගෙන ඇති බිම් ප්‍රමාණයේ අනුපාතය අනුව වාර්ෂික වටිනාකම කොටස් කර ව්‍යාපාර බදු වෙන වෙනම අය කරනු ඇත.

3. වරිපනම් අංක කිහිපයකින් සමන්විත ගොඩනැගිල්ලක එකම වර්ගයේ ව්‍යාපාරයක්/කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන විට දී එය එකම වරිපනම් අංකයක පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක්/කර්මාන්තයක් ලෙස සළකා කර්මාන්ත බදු අය කරනු ඇත. ගාස්තුව ගණනය කිරීමේ දී අදාළ සියලුම ගොඩනැගිලිවල වරිපනම් අංකවල වාර්ෂික වටිනාකම ඒකාබද්ධ කර ලැබෙන මුළු තක්සේරුව අනුව ව්‍යාපාර බදු/කර්මාන්ත බදු තීරණය කරනු ඇත.

4. වරිපනම් අංක කිහිපයක විවිධ ව්‍යාපාර/කර්මාන්ත පවත්වාගෙන යන අවස්ථාවක එකී වරිපනම් අංක එකට යාව පිහිටියේ වුව ද තම එක් එක් ව්‍යාපාරය හෝ කර්මාන්තය වෙනුවෙන් වෙන වෙනම ව්‍යාපාර බදු/කර්මාන්ත බදු අය කරනු ඇත.

5. එක් වරිපනම් අංකයක් යටතේ ව්‍යාපාර/කර්මාන්ත කිහිපයක් පවත්වාගෙන යන්නේ නම් ඒ එක් එක් ව්‍යාපාරය/කර්මාන්තය සඳහා යොදු ගනු ලබන ස්ථානයේ බිම් ප්‍රමාණයට අනුපාතිකව එකී ගොඩනැගිල්ලේ වාර්ෂික තක්සේරුව කොටස් කර ව්‍යාපාර බදු/කර්මාන්ත බදු වෙන වෙනම අය කරනු ඇත.

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2023 වර්ෂය සඳහා විනෝද බදු අය කිරීම

දෙහිවල- ගල්කිස්ස මහා නගර සභාව විසින් 2022 ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 07(VII)04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
දෙහිවල- ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වගන්තිය ප්‍රකාරව එකී පනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුළුවීමේ ගාස්තුවෙන් 25% ක විනෝද බද්දක් පනවා අය කිරීමටත්, එසේ වුවද මහා නගර සභා බල ප්‍රදේශය තුළ සිනමා ශාලා තුළ පෙන්වනු ලබන චිත්‍රපට සංදර්ශන සඳහා අයකරනු ලබන ඇතුළුවීමේ ගාස්තුවෙන් 7.5% ක විනෝද බද්දක් පනවා අය කිරීමටත් දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නීය.

11 - 365/12

දෙහිවල- ගල්කිස්ස මහා නගර සභාව

2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගාස්තු පැනවීම

දෙහිවල- ගල්කිස්ස මහා නගර සභාව විසින් 2022 ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 07(VII)04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
දෙහිවල- ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

විස්තරය	*ගාස්තුව රු. (වර්ග අඩියකට)*	
	සාමාන්‍ය නාමපුවරු සඳහා	*ප්‍රතිදීපන නාමපුවරු සඳහා*
1. සාමාන්‍ය ව්‍යාපාර නාම පුවරුවක් සඳහා		
I.වර්ග අඩි 50 දක්වා	ගාස්තු නැත	රු. 50 0
II.ව්‍යාපාර නාම පුවරුවක් වර්ග අඩි 50 ඉක්මවන්නේ නම් (සම්පූර්ණ වර්ග එලයට)	රු. 30 0	රු. 50 0
III.සාමාන්‍ය වෙළෙඳ ව්‍යාපාරයක් වෙළෙඳ නාම පුවරුවක් වෙනත් ආයතනයක් හෝ භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා පුළුල් ප්‍රදර්ශනයක් කරන්නේ නම් ඒවා අංක 02 යටතේ ගාස්තුවලට යටත් වේ.		

විස්තරය	*ගාස්තුව රු. (වර්ග අඩියකට)*	
	සාමාන්‍ය නාමපුවරු සඳහා	*ප්‍රතිදීපන නාමපුවරු සඳහා*
2. ගොඩනැගිලි මත හෝ භූමියක සවිකර ඇති ගුවන් පුවරුවක් හෝ බිත්තියක් මත සවිකර ඇති, ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා ගාස්තුව		
I. මධ්‍යම රජයෙන් නඩත්තු කෙරෙන මාර්ගවලට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කෙරෙන පුවරුවක් නම්,		
වර්ග අඩි 100 නොඉක්මවන පුවරුවක් සඳහා	රු. 100 0	රු. 150 0
වර්ග අඩි 100 ඉක්මවන පුවරුවක් සඳහා	රු. 150 0	රු. 200 0
II. පළාත් සභාවෙන් නඩත්තු කෙරෙන පාරකට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කෙරෙන පුවරුවක් නම්,		
වර්ග අඩි 100 නොඉක්මවන පුවරුවක් සඳහා	රු. 50 0	රු. 75 0
වර්ග අඩි 100 ඉක්මවන පුවරුවක් සඳහා	රු. 100 0	රු. 150 0
III. අනෙකුත් අතුරු මාර්ගවලට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කෙරෙන පුවරු සඳහා ගාස්තු	රු. 50 0	රු. 150 0
3. එල්.ඊ.ඩී. හෝ සමාන තාක්ෂණයක් භාවිතා කරමින්, චංචල දැන්වීම් දැන්වීම් ප්‍රදර්ශනය කරනු ලබන පුවරුවක් සඳහා ගාස්තුව, වර්ග අඩියකට	රු. 400 0	
4. බිත්තියක් මත තීන්ත ආලේප කර ඇති ප්‍රචාරක දැන්වීමක් සඳහා	රු. 40 0	රු. 75 0
5. ග්‍රැන්ටි ස්වභාවයේ පුවරුවක් සඳහා	රු. 300 0	රු. 500 0
6. වීථි නාම පුවරුවක් සඳහා එක් පුවරුවකට රු. 1,000 0 බැගින් ප්‍රචාරක ගාස්තු හැටියට ගෙවිය යුතුය (අවම වශයෙන් පුවරු 200ක්)	රු. 400 0	රු. 500 0
7. පෝස්ටර් ඇලවීම සඳහා සවි කරන පුවරු	රු. 100 0	රු. 150 0

මෙම ගාස්තුව මාස 12 ක කාලයක් සඳහා වන අතර, දැන්වීම් පුවරුව දෙපැත්තේම එකම දැන්වීම ප්‍රදර්ශනය කරන්නේ නම්, දෙවන පැත්ත සඳහා අයකරනු ලබන්නේ නියමිත ගාස්තුවෙන් 25% ක් පමණි. පුවරුවේ දෙපැත්තෙහි වෙනස් වූ දැන්වීම් ප්‍රදර්ශනය කරන්නේ නම් සම්පූර්ණ ගාස්තුව අයකරනු ලැබේ.

ගාස්තුව අය කිරීමේ කාර්යය සඳහා, දැන්වීම් පුවරුවේ ප්‍රමාණය ගණනය කිරීමේ දී, පුවරුව සවි කිරීමට යොදාගනු ලබන ආධාරක හැර පුවරුවේ මුහුණත දිග හා පළල සැළකිල්ලට ගනු ලැබේ.

ඉහත ගාස්තුවලට අතිරේකව එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවිය යුතු වේ.

ආකාශ කොඩි, බැනර් සහ කටවුට්,

	ගාස්තුව (වර්ග අඩියකට) රු. ශත
මුදල් ඉපයීමේ කාර්යයක් නොවන විට	25 0
මුදල් ඉපයීමේ කාර්යයන් සඳහා වන විට (ආධාරකය එල්ලා තබනු ලබන කටවුට් ඇතුළුව)	75 0

මෙම ගාස්තු, සති දෙකක කාලයක් සඳහා වන අතර, අතිරේක සතියකට හෝ ඉන් කොටසකට 25% ක අතිරේක ගාස්තුවක් අය කරනු ලැබේ.

ඉහත ගාස්තුවලට අමතරව, එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවිය යුතුය.

දෙහිවල- ගල්කිස්ස මහා නගර සභාව

2023 වර්ෂය සඳහා ඇතැම් ඉඩම් විකිණීම් විෂයයෙහි බදු අය කිරීම

දෙහිවල- ගල්කිස්ස මහා නගර සභාව විසින් 2022 ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 07(VII)04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
දෙහිවල- ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

මහා - නගර සභා ආඥ පනතේ 247 (ඉ) වගන්තිය ප්‍රකාරව දෙහිවල- ගල්කිස්ස මහා නගර සභා සීමාව තුළ පිහිටි යම් ඉඩමක්, වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර්වරයෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකුගේ නැතහොත් අනුනියෝජිතයෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ *නැතහොත්* වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් එසේ විකිණීමෙන් ලැබෙන මුදලින් සියයට එක (1%) කට සමාන බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයෙකු එසේ ඒ ඉඩම විකුණා ලද මුදලින් සභාවට ගෙවිය යුතු යැයි නියම කිරීමට දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නීය.

11 - 365/14

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2023 වර්ෂය සඳහා පශු වෛද්‍ය සේවා මත බදු පැනවීම

දෙහිවල- ගල්කිස්ස මහා නගර සභාව විසින්, 2022 නොවැම්බර් මස 02 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ, තීරණ අංක 07(VII)8(11) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
දෙහිවල- ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

252 වැනි අධිකාරිය වන 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනතෙන් දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවට පැවරී ඇති බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී ඉටුකරනු ලබන පහත සඳහන් පොදු උපයෝගී සේවා සුභසාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේදී අවශ්‍ය කරන අනුශංගික කාර්යයන් ඉටුකිරීමේදී මහා නගර සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට අය කිරීමට සහ 2023.01.01 වැනි දින සිට ක්‍රියාත්මක කිරීමට දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නීය.

පශු වෛද්‍ය සේවා ගාස්තු :

	රු. ශත
1. ජලභීතිකා එන්නත ලබා දීම සඳහා	300 0
2. ජලභීතිකා එන්නත ලබා දීම සඳහා (නගර සභා බල ප්‍රදේශයෙන් පිටත)	500 0
3. උපත් පාලන බෙහෙත් ලබාදීම සඳහා (ගැහැණු සුනඛයින් සහ බළලුන්)	400 0
4. සතුන් නිර්විඳ්දනය හෝ අඩපන කිරීම් (Sedation) සඳහා	500 0

5. උපත් පාලන සැත්කම් සඳහා (ගැහැණු සුනඛයින් හා බළලුන්)	2,000 0
6. උපත් පාලන සැත්කම් සඳහා (ගැහැණු සුනඛයින් සහ බළලුන්) (නගර සභා බල ප්‍රදේශයෙන් පිටත)	3,000 0
7. ප්‍රතිකාර කිරීම සඳහා (Intravenous Infusions සමග)	400 0
8. සාමාන්‍ය ප්‍රතිකාර කිරීම සඳහා	300 0
9. උපදේශන (Consultation fee) සේවාව සඳහා	100 0
10. Diro filaria වලට රුධිරය පරීක්ෂා කිරීමක් සඳහා	200 0

තාවකාලික ගෝඝාතක බලපත්‍රය

තාවකාලික ගෝඝාතක බලපත්‍රයක් සඳහා

ගවයෙකුට	රු. 1,000 0
එළුවෙකුට	රු. 500 0

477 වන අධිකාරිය වන අංක 26 දරන 1938 සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (4) වන වගන්තියෙන් මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂය සඳහා දෙහිවල ගල්කිස්ස මහා නගර සභා සීමාව ඇතුලත තබා ගන්නා සුනඛයෙකුට වාර්ෂික ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් අය කිරීමටත් එම ගාස්තුව 2023.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමටත් දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නීය.

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තුව

පිරිමි සුනඛයෙකු සඳහා	රු. 10 0
ගැහැණු සුනඛයෙකු සඳහා	රු. 15 0

(සේවා ගාස්තුවක් ද ඇතුළත් කර ඇත)

252 වැනි අධිකාරිය වන 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනතේ 84 වැනි වගන්තියෙන් මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂය සඳහා නිදුල්ලේ හැසිරෙන සතුන් ඇල්ලීමෙන් පසු අයකරන දඩ ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට අය කිරීමට සහ එම ගාස්තුව අය කිරීම 2023.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නීය.

	රු. ශත
1. දඩ මුදල	
අ. ගවයින් සඳහා	
(i) පරිණත ගවයෙකු සඳහා	20,000 0
(ii) නාම්බා/නෑම්බී (heifer)	10,000 0
(iii) වසු පැටවෙකු සඳහා	5,000 0
ආ. එළුවන් සඳහා	
(i) පරිණත එළුවෙකු සඳහා	5,000 0
(ii) එළු පැටවකු සඳහා	1,000 0
ඇ. අශ්වයන්/පෝනියන්/කොටළුවන් සඳහා	
(i) පරිණත අශ්වයෙකු/පෝනියෙකු/කොටළුවෙකු සඳහා	20,000 0
(ii) අශ්වයෙකු/පෝනියෙකු/කොටළුවෙකු ගේ පැටවකු සඳහා	5,000 0

2. රඳවා තැබීමේ ගාස්තු (අයිතිකරු විසින් ගෙනයන තෙක්)

ඇ. ගවයින් සඳහා

(i) පරිණත ගවයෙකු සඳහා	රු. 500 0 (එක් දිනක් සඳහා)
(ii) නාම්බා/නෑම්බී (heifer)	රු. 300 0 (එක් දිනක් සඳහා)
(iii) වසු පැටවෙකු සඳහා	රු. 200 0 (එක් දිනක් සඳහා)

ඈ. එළුවන් සඳහා

(i) පරිණත එළුවෙකු සඳහා	රු. 300 0 (එක් දිනක් සඳහා)
(ii) එළු පැටවකු සඳහා	රු. 100 0 (එක් දිනක් සඳහා)

ඇ. අශ්වයන්/පෝනියන්/කොටළුවන් සඳහා

(i) පරිණත අශ්වයෙකු/පෝනියෙකු/කොටළුවෙකු සඳහා	රු. 500 0 (එක් දිනක් සඳහා)
(ii) අශ්වයෙකු/පෝනියෙකු/කොටළුවෙකු ගේ පැටවකු සඳහා	රු. 300 0 (එක් දිනක් සඳහා)

252 වන අධිකාරිය වන 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා 267 වන වගන්තිය අනුව එකී ආඥා පනත යටතේ සාදන ලද අංක 541/17 හා 1989 ජනවාරි 20 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා XX වැනි කොටසේ 14 වන වගන්තිය ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව විසින් නිකුත් කරන මාංශ වෙළඳාම සම්බන්ධ විශේෂ බලපත්‍රයක් වෙනුවෙන් ගාස්තුවක් මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට නියමකර අයකර ගැනීමටත් එම ගාස්තුව 2023.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමටත් දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නීය.

මාංශ වෙළඳාම සඳහා විශේෂ බලපත්‍ර ගාස්තු :

	විස්තරය	*විශේෂ බලපත්‍ර ගාස්තු රු. ශත*
i.	සුපිරි වෙළඳ සැල් (Super markets) වල මාංශ වෙළඳාම සඳහා (මාංශ වර්ග ප්‍රදර්ශන ප්‍රදේශය - (Display area) දිග අඩි 10 සහ පළල අඩි 5 හෝ එයට වඩා වැඩි ප්‍රමාණය සඳහා	100,000 0
ii.	සුපිරි වෙළඳ සල් (Super markets) වල මාංශ වෙළඳාම සඳහා (මාංශ වර්ග ප්‍රදර්ශන ප්‍රදේශය - (Display area) දිග අඩි 10 සහ පළල අඩි 5 ට වඩා අඩු ප්‍රමාණය සඳහා)	75,000 0
iii.	කුඩා ප්‍රමාණයේ සුපිරි වෙළඳ සල් (Mini Supermarkets) වල පැකට් කරන ලද මාංශ වර්ග පමණක් වෙළඳාම සඳහා	50,000 0
iv.	සිල්ලර වෙළඳ සැල් ශීත/ අධි ශීත කළ කුකුල් මස් සහ පැකට් කරන ලද මස් වර්ග වෙළඳාම සඳහා	5,000 0
v.	ෆාම් ෂොප් වල ශීත කළ හෝ අධි ශීත කළ කුකුල්මස් පමණක් වෙළඳාම සඳහා (එක් වර්ගයක් සඳහා පමණි)	25,000 0
vi.	ෆාම් ෂොප් වල ශීත කළ හෝ අධි ශීත කළ කුකුල්මස් *දෙවර්ගය පමණක්* වෙළඳාම සඳහා	35,000 0
vi.	ෆාම් ෂොප් වල කුකුළු/එළ හරක්/එළු/ඌරු මස් වෙළඳාම සඳහා (මාංශ වර්ග කිහිපයක්, එක් මාංශ වර්ගය එකකට වඩා)	75,000 0

විස්තරය	*විශේෂ බලපත්‍ර ගාස්තු රු. ශත*
viii. එළුමස් පමණක් වෙළඳාම සඳහා	50,000 0
ix, ඌරුමස් පමණක් වෙළඳාම සඳහා	50,000 0
x. ජංගම මාංශ වෙළඳාම (online මගින් ඇනවුම් ලබාගෙන)	50,000 0
xi. මාළු වෙළඳ සැලක් සඳහා	25,000 0

2023 වර්ෂයේ අලුතින් ආරම්භ කරන මාංශ වෙළඳාම් කරන ස්ථාන සඳහා එම ස්ථානය ආරම්භ කරන ලද දිනය අයත්වන කාර්තුවේ සිට 2023.12.31 දක්වා කාර්තු ගණනට බලපත්‍ර ගාස්තු අය කිරීම සැලකිල්ලට ගනු ලැබේ.

252 වන අධිකාරිය වන 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනතේ 272(8) (ඌ) වන වගන්තිය ප්‍රකාරව සහ 252 වන අධිකාරියවන 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තිය අනුව එකී ආඥා පනත යටතේ සාදන ලද අංක 541/17 හා 1989 ජනවාරි 20 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා XX වැනි කොටසේ 40 වන වගන්තිය ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා සීමාව තුල පණු ඇති සතුන්/සිවුපා ෂතුන් විකුණන ස්ථාන සඳහා ගාස්තුවක් උපලේඛනයේ සඳහන් ආකාරයට නියමකර අයකර ගැනීමටත් එම ගාස්තුව 2023.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමටත් දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නීය.

සිවුපා සතුන් සුරතල් සතුන් වශයෙන් අලෙවි කරන ස්ථාන	රු. 30,000 0

11 - 365/15

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2023 වර්ෂය සඳහා නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ සැලසුම් අංශයෙහි ගොඩනැගිලි සහ ඉඩම් අනුමත විෂයෙහි ගාස්තු අයකිරීම

දෙහිවල- ගල්කිස්ස මහා නගර සභාව විසින්, 2022 අගෝස්තු මස 02 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ, තීරණ අංක 07(X)46(VI) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම හා කාලය දීර්ඝ කිරීම සඳහා වන පෙරසැරි ගාස්තු		
සංවර්ධන කාර්යයේ ස්වභාවය	**අයකළ යුතු ගාස්තු**	
01. ඉඩම් අනුබෙදුම් සඳහා	**ඉඩමේ ප්‍රමාණය ව.මී**	**පෙරසැරි ගාස්තුව**
	ව.මී. 150 - ව.මී. 300	කැබලි 1ක් සඳහා රු. 1,000.00
	ව.මී. 301 - ව.මී. 600	කැබලි 1ක් සඳහා රු. 800.00
	ව.මී. 601 - ව.මී. 900	කැබලි 1ක් සඳහා රු. 600.00
	ව.මී. 900 ට වැඩි	කැබලි 1ක් සඳහා රු. 500.00

සංවර්ධන කාර්යයේ ස්වභාවය	අයකළ යුතු ගාස්තු			
	ඉඩමේ ප්‍රමාණය ව.මී		පෙරසැරි ගාස්තුව	
2.මායිම් තාප්ප/රැඳවුම් බැමි ඉදිකිරීම	දික් මීටර් 1ක් සඳහා		රු. 100.00	
3. සන්නිවේදන කුළුණු/ඇන්ටනා කුළුණු/සම්ප්‍රේෂන කුළුණු ඉදිකිරීම්	රු. 40,000.00			
4. ඉන්ධන පිරවුම්හල්/වාහන සේවා ස්ථාන/දුම් පරීක්ෂා කරන ස්ථාන	ව.මී. 1කට		රු. 100.00	
5. නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි	ගෙබිම් ප්‍රමාණය ව.මී.	නේවාසික (ව.මීටර් 1කට)	(ව.මීටර් 1කට)	නේවාසික නොවන (ව.මීටර් 1කට)
		තනි පුද්ගල	මහල් නිවාස	
	ව.මී. 400 දක්වා	රු. 20.00	රු. 25.00	රු. 25.00
	ව.මී. 400 දක්වා 1,000	රු. 22.00	රු. 27.00	රු. 27.00
	ව.මී. 1,001 දක්වා 1,500	රු. 25.00	රු. 30.00	රු. 30.00
	ව.මී. 1,501 දක්වා 2,000	රු. 25.00	රු. 32.00	රු. 32.00
	ව.මී. 2,000 ට වැඩි	වැඩිවන සෑම ව.මී.90 ක් සඳහාම රු. 2,000 බැගින්	වැඩිවන සෑම ව.මී.90 ක් සඳහාම රු. 2,000 බැගින්	වැඩිවන සෑම ව.මී.90 ක් සඳහාම රු. 2,000 බැගින්
6. වාණිජ පරමාර්ථයෙන් සිදු කරනු ලබන i. පිහිනුම් තටාකය (තටාකයේ ඩෙක් සමග) සහ හෝ ii. සූර්ය පැනල සඳහා වන ගාස්තු	වර්ග ප්‍රමාණය (ව.මී.)		ගාස්තුව (රු.)	
	ව.මී. 300 දක්වා		රු. 6,000	
	ව.මී. 301-500		රු. 15,000	
	ව.මී. 501-1,000		රු. 30,000	
	ව.මී. 1,000 ට වැඩි		රු. 30,000 + වැඩිවන සෑම ව.මී. 100 හෝ ඉන් කොටසක් සඳහා රු. 1,000 බැගින්	
7. i. අනුමත සැලසුමට අමතරව ගෙබිම් ප්‍රමාණය වැඩිවන සේ සිදු කරන වෙනස් කිරීම් හා එකතු කිරීම්	මුළු පෙරසැරි ගාස්තුවෙන් 25%+ වැඩිවන අමතර වර්ග ප්‍රමාණය සඳහ පෙරසැරි ගාස්තුව			
ii. ගෙබිම් ප්‍රමාණය වෙනස් කිරීමක් නොමැතිව අනුමත සැලැස්ම තුළ සිදු කරනු වෙනස් කිරීම්	මුල් අනුමැතියේදී ගෙවන ලද පෙරසැරි ගාස්තුවෙන් 25%			
8. සංවර්ධන බලපත්‍රය වෙනත් පාර්ශවයකට පැවරීම	රු. 25,000			
9. සංවර්ධන බලපත්‍රයේ වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීම	I. ව.මී. 1,000 දක්වා		රු. 5,000	
	II. ව.මී. 1,000 ට වැඩි		රු. 10,000	

හරිත ගොඩනැගිලි සහතිකය සඳහා ගාස්තු	
සංවර්ධන කාර්යයේ ස්වාභාවය	පෙරසැරි ගාස්තුව (බදු රහිත) රුපියල්
1. සියලුම කාණ්ඩ සඳහා හරිත ගොඩනැගිලි (සහතිකය සඳහා ලියාපදිංචි වීම)	රු. 5,000
2. අවසාන හරිත ගොඩනැගිලි සහතිකය ලබාගැනීම (උපරිම පෙරසැරි ගාස්තුව මිලියන 1)	වර්ග මීටරයකට ගාස්තුව *
i. සහතික මට්ටම	රු. 600
ii. රිදී මට්ටම	රු. 500
iii. රන් මට්ටම	රු. 400
iv. ප්ලැටිනම් මට්ටම	රු. 300
*අවසාන හරිත ගෙඩනැගිලි සහතිකය සඳහා වන අයදුම්පත භාරදෙනු ලබන අවස්ථාවේදී 75%ක මූලික ගෙවීමක් සිදු කළ යුතුය.	
3. රජයේ හෝ පෞද්ගලික අධ්‍යාපන ආයතන , ආගමික ස්ථාන, රජයේ සෞඛ්‍ය ආයතන සහ වැඩිහිටි සහ ළමා නිවාස	ව.මී. ට රු. 50.00
බලපත්‍රය නිකුත් කරන අවස්ථාවේ දී ඉල්ලුම් කර ඇති හරිත මට්ටම හා අනුකූලතා සහතිකය නිකුත් කරන අවස්ථාවේදී ලඟා කර ගෙන ඇති හරිත මට්ටමෙහි යම් වෙනසක් පවතීනම්, ලඟා කර ගෙන ඇති මට්ටම අනුව ගෙවිය යුතු පෙරසැරි ගාස්තුවෙහි වෙනස ප්‍රතිපූර්ණය කොට අනුකූලතා සහතිකය ලබා ගත යුතුය.	

පසුවිපරම් හා නිරීක්ෂණ වාර්තාව සඳහා ගාස්තු		
සංවර්ධන කාර්යයේ ස්වාභාවය	ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්)	ගාස්තුව රුපියල්
ගොඩනැගිලි ඉදිකිරීම	ව. මී. 900 - ව. මී. 2,000	රු. 3,000
	ව. මී. 2,001 - ව. මී. 5,000	රු. 5000
	ව. මී. 5,000 වැඩි	රු. 10,000

ආවරණ අනුමැතිය ලබාදීම සඳහාවන සේවා ගාස්තු (පෙරසැරි ගාස්තුවලට අමතරව)		
සංවර්ධනයේ ස්වභාවය	අයකළ යුතු ගාස්තු (බදු රහිත)	
1. අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සිදුකරන ලද ඉඩම් බෙදීමක් සඳහා	ඉඩම් කැබලි 1ක් සඳහා රු. 3,000 බැගින්	
2. අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සිදුකරන ලද ඉඩම් බෙදීමක් සඳහා	නේවාසික (ව. මී. 1කට)	නේවාසික නොවන (ව. මී. 1කට)
i. අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට (කයිරු මට්ටම් දක්වා)	රු. 200	රු. 500
ii. වහල මට්ටම් දක්වා ඉදිකිරීම් ටැම් සහ බාල්ක ඇතුළුව ඉදිකර ඇති විට (වහලය හැර)	රු. 300	ර. 1,000

සංවර්ධනයේ ස්වභාවය	අයකළ යුතු ගාස්තු (බදු රහිත)	
iii. වහලය සහිත බිත්ති ඉදිකිරීම	රු. 400	රු. 1,500
iv. පදිංචි වීම සඳහා සුදුසු පරිදි ඉදිකිරීම් සම්පූර්ණ කිරීම	රු. 500	රු. 2,000
v. මායිම් තාප්ප/රැඳවුම් බිත්ති ඉදිකිරීම	රු. 200 (දික් මීටරයක් සඳහා)	රු. 500 (දික් මීටරයක් සඳහා)
iv. විදුලි සංදේශ, සම්ප්‍රේෂණ සහ ඇන්ටෙනා කුළුණු ඉදිකිරීම	බිම්පාදම ඉදිකිරීම වහල ඉදිකිරීම	රු. 150,000 රු. 100,000
3. අනුකූලතා සහතිකය (COC) ලබා නොගෙන පදිංචි වීම	දිනකට රු. 100	
4. වාහන නැවැත්වීමේ ස්ථාන (පරිශ්‍රය තුළ ලබා දී නොමැති විට එක් එක් වාහන නැවැත්වීමේ ඉඩ සඳහා සේවා ගාස්තු) i. සියලුම මහ නගර සහා	සම්මත වාහන නැවැත්වීම ලොරි රථ කන්ටේනර් ඇතුළු බහු ඇක්සල් වාහනය	රු. 500,000 රු. 1,000,000 රු. 250,000
ii. නගර සහ	සියලුම වාහන සඳහා රු. 500,000	
iii. ප්‍රාදේශීය සහා	සියලුම වාහන සඳහා රු. 250,000	
5. රථවාහන නැවැත්වීමේ ඉඩ වෙනත් භාවිතයන් සඳහා භාවිතා කිරීම	එක ඉඩකඩක් සඳහා රුපියල් 20,000 ක් සහ අනුමත සැලැස්ම පරිදි වාහන නැවැත්වීමට පරිවර්තනයවන තෙක් වසරකට 10% ක වර්ධකයක් සහිතව	

අනුකූලතා සහතිකය නිකුත් කිරීම සඳහා ගාස්තු				
සංවර්ධන කාර්යයේ ස්වභාවය	අයකළ යුතු ගාස්තු (බදු රහිත)			
1. ඉඩම් අනුබෙදුම් කිරීම	එක් කැබැල්ලකට රු. 1,000			
2. ගොඩැගිලි ඉදිකිරීම	ගෙබිම් ප්‍රමාණය (ව. මී.)	නේවාසික		නේවාසික නොවන
		තනි පුද්ගල	මහල් නිවාස	
	ව. මී. 400 දක්වා	රු. 4,000	රු. 5,000	රු. 5,000
	ව. මී. 400 ට වැඩි	රු. 4,000+ ව. මී. 400 ට වැඩිවන සෑම ව. මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 15 බැගින්	රු. 5,000+ ව. මී. 400 ට වැඩිවන සෑම ව. මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 20 බැගින්	රු. 5,000+ ව. මී. 400 ට වැඩිවන සෑම ව. මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 25 බැගින්
3. සන්නිවේදන කුළුණු, ඇන්ටනා කුළුණු/ සම්ප්‍රේෂණ කුළුණු සඳහා	රු. 5,000			
4. මායිම් තාප්ප හා රැඳවුම් බැමි	දික් මීටර් 1කට රු. 25 බැගින්			
5. පොදු ගොඩනැගිලි සඳහාවන අනුකූලතා සහතිකය අලුත් කිරීම	රු. 10,000			

භාවිතය වෙනස් කිරීම සඳහා සේවා ගාස්තු		
පෙරසැරි ගාස්තු	*ගෙබිම් ප්‍රමාණය (ච. මී.)*	*ගාස්තුව (රුපියල්) (බදු රහිත)*
	45 දක්වා	1,000
	45-90	1,500
	91-180	1,750
	181-270	2,000
	271-450	2,500
	451-675	2,750
	676-900	3,000
	900ට වැඩි	වර්ග මීටර් 900 ට වැඩිවන සෑම වර්ග මීටර් 90ක් සඳහාම රු. 500 බැගින්
අවසර පත්‍රය සඳහා ගාස්තු		
I. නේවාසික භාවිතයන් වෙනත් භාවිතයක් සඳහා යොදා ගැනීම	වර්ග මීටරයක් සඳහා රු. 750	
II. නේවාසික නොවන අනිකුත් භාවිතයන් වෙනත් භාවිතයන් සඳහා යොදා ගැනීම	වර්ග මීටරයක් සඳහා රු. 500	

සටහන :

ඉහත සඳහන් ගාස්තු වලට අමතරව ස්ථානීය පරීක්ෂාව සඳහා ප්‍රවාහන ගාස්තු වශයෙන් කිලෝ මීටරයකට රුපියල් 50 ක අතිරේක ගාස්තුවක් අය කෙරේ. කෙසේ වෙතත්, නාගරික සංවර්ධන අධිකාරිය/පළාත් පාලන ආයතන විසින් වෙළඳපොලේ ඉන්ධන මිලෙහි වෙනස්කම් අනුව මූලික ගාස්තුව වෙනස් කරනු ලැබිය හැක.

11-365/16

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

ගිනි නිවීමේ සේවා දෙපාර්තමේන්තුවට අදාළ ගිනි නිවීමේ සේවාවන් සඳහා ගාස්තු අය කිරීම

ගිනි නිවීමේ සේවාවන් සඳහා ගාස්තු අය කිරීම - 2023

දෙහිවල- ගල්කිස්ස මහා නගර සභාව විසින්, 2022 ඔක්තෝබර් මස 02 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ, තීරණ අංක 07(X)34 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2022 නොවැම්බර් මස 02 වැනි දින,
දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

අතුරු ව්‍යවස්ථාව

VI කොටස

සේවාවන් සඳහා ගාස්තු අයකිරීම

* සභා සම්මුතියක් මගින් කලින් සංශෝධනය කරන ලද පරිදි, ගිනි නිවීම් සේවා කාර්යය සඳහා අදාළ වන්නා වූ පහත දැක්වෙන ගාස්තු දෙපාර්තමේන්තු සේවාවන් සඳහා අයකරනු ලැබිය යුතු ය.

* අංක 1 සිට 3 දක්වා සඳහන් කර ඇති නගරය තුළ ගල් අඟුරු අඩුක්කුවල ඇතිවන ගිනි, වරාය ජල ප්‍රදේශයේ, ඇතිවන ගිනි හා නෞකා තටාකයේ යාත්‍රාවල ඇතිවන ගිනි හා අතුරු ව්‍යවස්ථාවේ 11, 12 සහ 16 සඳහන් කරුණු මෙම බල ප්‍රදේශයට අදාළ නොවන හෙයින් අතුරු ව්‍යවස්ථාවෙන් ඉවත් කළ යුතු වේ.

නගර සීමාව තුළ ගිනි නිවීම හා ජීවිත බේරාගැනීම සඳහා ගාස්තු අයකරනු නොලැබේ.

4. ජල ටැංකිවලින් ජලය ඉවතට පොම්ප කිරීම, ඒවාට ජලය පිරවීම, ළිං සහ පොළොවෙන් යට තට්ටුවල ජලය හිස් කිරීම, ඉණිමං ඉදි කිරීම වැනි සුළු පරිමාණයේ බේරගැනීමේ වැඩ :

(අ) නගරය තුළ,

පළමු පැය 3 ට	රු. 5,000 0
(වැඩිවන සෑම පැය 3 කටම හෝ ඉන් කොටසකට ඉහත ගාස්තුවෙන් 50% බැගින්)	

(ආ) නගරයෙන් පිටත,

පැමිණීම කිලෝමීටර් 25 ක අර්ධ විෂ්කම්භයක් තුළ පළමු පැය 3 ට (වැඩිවන සෑම පැය 3 කටම හෝ ඉන් කොටසකට ඉහත ගාස්තුවෙන් 50% බැගින් හා වැඩිවන සෑම කිලෝමීටරයකටම රු. 100.00 බැගින්)	රු. 10,000 0

5. සිනමාහල්වල, කානිවල්වල, සර්කස්වල හෝ එවැනි ස්වභාවයේ වෙනත් ව්‍යවසායක ගිනි ආරක්ෂණ සේවාවන්,

(අ) පැය 8 ට නොවැඩි කාලයක් සඳහා එක් එක් ගිනි භටයෙකු සඳහා (වැඩි වන සෑම පැය 8 කටම හෝ ඉන් කොටසකට ඉහත ගාස්තුවෙන් 50% බැගින්)	රු. 1,500 0

6. නගරයෙන් පිටත ගිනි.-

(අ) පැමිණීම කිලෝමීටර් 25 කින් යුත් අර්ධ විශ්කම්භයක් තුළ පැය 03 කට	රු. 15,000 0
(වැඩිවන සෑම පැය 3 කටම හෝ ඉන් කොටසකට ඉහත ගාස්තුවෙන් 50% බැගින් හා වැඩිවන සෑම කිලෝමීටරයකටම රු. 100 බැගින්)	
(ආ) රැඳවුම් ක්‍රමය යටතේ බල ප්‍රදේශයෙන් පිටත ගාස්තු අයකිරීම	25,000 0
(ඇ) ජල බවුසරය පමණක්	15,000 0

7. අළුත්වැඩියාවන් නොකරන බැවින් (සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතු ය.)

8. අළුත්වැඩියාවන් නොකරන බැවින් (සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතු ය.)
* මෙම අගයන් සඳහා NBT සහ VAT එකතු විය යුතුයි.

9. ගිනි ආරක්ෂණය.-

අතුරු ව්‍යවස්ථාවේ VI වන (9) කොටසේ සඳහන් ගිනි ආරක්ෂණ සේවා අමුණා ඇති උපලේඛනය අනුව නැවත සංශෝධනය විය යුතු ය.

සංවර්ධන අවසර පත්‍ර ලබා ගැනීම සඳහා පෙරසැරි ගාස්තු, ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු සහ සේවා ගාස්තු

උපලේඛන 1

	සංවර්ධන කාර්යයේ ස්වභාවය	අයකළ යුතු ගාස්තු		
		පෙරසැරි ගාස්තු		
01	බල ප්‍රදේශය තුළ ගොඩනැගිලි ඉදිකිරීම/ ගොඩනැගිල්ලට කොටසක් එකතු කිරීම/නැවත ඉදිකිරීම	ගෙබිම පදිංචිය සඳහා විශාලත්වය වර්ග මීටර් (m^2)	ගෘහස්ථ	වාණිජ/කර්මාන්ත/ ආයතන
		01-400	-	2,500
		401-600	2,000	3,500
		601-800	3,000	4,500
		801-1,000	4,000	6,000
		1,001-1,200	5,500	8,500
		1,201-1,400	8,000	11,000
		1,400 ඉක්මවීමෙන් පසු $1m^2$ සඳහා රු.	5	10
02	අනුකූලතා සහතික	මහල් නිවාසවල ඒකක 1 ක් සඳහා රු. 500 (බල ප්‍රදේශය තුළ)		50 m^2 - Rs. 500 51-100 m^2 - Rs.750 101-200 m^2 - Rs. 1,000 201-400 m^2 - Rs.1,500 401-500 m^2 - Rs.2,000 501 m^2 වැඩිවන සෑම $1m^2$ ක් සඳහා ම රු. 5
03	බල ප්‍රදේශයෙන් පිටත ගොඩනැගිලි ඉදිකිරීම/ගොඩනැගිල්ලට අළුතින් කොටසක් එකතු කිරීම/නැවත ඉදිකිරීම	අයකළ යුතු ගාස්තු		
		ගොඩනැගිලි වර්ග ප්‍රමාණය වර්ග මීටර් (m^2)		පෙරසැරි ගාස්තු රු. ශත
		01-300		3,000 0
		301-500		4,500 0
		501-750		6,000 0
		751-1000		8,000 0
		1000 වැඩි		10,000 0
		වර්ග මීටර් 1000 ඉක්මවීමෙන් පසු 500 m_2 ක් සඳහා		200 0
04	වෙළෙඳ බලපත්‍ර සඳහා ගිනි නිවාරණ සහතික නිකුත් කිරීම	වෙළඳ බලපත්‍ර සඳහා අයවිය යුතු නව සංශෝධිත ගාස්තු		මෙම අගයන් සඳහා NBT හා VAT එකතු විය යුතුයි
		01-250 m^2	2,000 0	
		251-500 m^2	2,500 0	
		501-1000 m^2	3,000 0	
		1,001-1,500 m^2	4,000 0	
		1,501-2,000 m^2	5,000 0	
		2,001-2,500 m^2	6,000 0	
		2,501-3,500 m^2	8,000 0	
		3501 m^2 වැඩි	10,000 0	
05	ගිනි සටන් නිරීක්ෂණ වාර්ථා	නගරය තුළ	2,000	මෙම අගයන් සඳහා NBT හා VAT එකතු විය යුතුයි
		නගරයෙන් පිටත	10,000	
		(පැමිණීම 25 කි. මී. අර්ධ විෂ්කම්භයක් තුළ හා වැඩිවන සෑම 1 කි. මී. ක් සඳහාම රු. 100 බැගින්)		
06	උපදේශන සේවා	යම් ආයතනයක් විසින් උපදේශන සේවාවක් ඉල්ලූ විට හා ගිනි නිවාරන සහතිකය නිකුත් කිරීම සඳහා රු. 2,500		

උපලේඛන 2

ගොඩනැගිලිවල භාවිතයන් හා ගොඩනැගිලි වර්ග		
	භාවිතයන්	ගොඩනැගිලි වර්ග
1	ගෘහස්ත	නිවාස/බහුවිධ පදිංචිය/මහල් නිවාස/වැඩිහිටි නිවාස
2	වාණිජ	කාර්යාල ගොඩනැගිලි, හෝටල්, සංචාරක නවාතැන්, තානායම්, පොදු නවාතැන්, සාප්පු සංකීර්ණ, සුපිරි වෙළඳසැල්, අවන්හල්, වාහන නැවතුම් පොලවල්
3	කර්මාන්ත	කර්මාන්තශාලා, වැඩපලවල්, ගබඩා, කාර්මික ආයතන, යටිතල පහසුකම් සැපයුම් මධ්‍යස්ථාන
